# අනාගතයට පිය නැගීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ
විනිමය කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව 2012

# අනාගතයට පිය නැගීම

උපාය මාර්ගයන් සෑම අවස්ථාවේදීම අනාගත දැක්මක්, කැපවූ කණ්ඩායමක් හා වර්ධනය වෙත යොමු වීමක් යන කාරණා සමග එකට ගමන් කරන බව අපගේ විශ්වාසයයි. අපගේ ක්‍රියාකාරී සැලැස්ම මගින් අප එය දැනටමත් ඉටු කර ඇති අතර එමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළින් ආර්ථිකයේ වර්ධනයක්ද, ආයෝජකයින්ට හා අනෙකුත් පාර්ශව වලට ප්‍රතිලාභද නෙලා ගත හැකි වනු ඇති ආර්ථිකයට අනුබලයක් හා නව ජීවයක් ලබාදෙන වැඩි නව්‍යතාවයකින් යුතු, ක්‍රියාකාරී හා සුරක්ෂිත සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීම සඳහා උපාය මාර්ගික පියවරයන් ගනිමින්, ක්‍රියාවලීන් ඉහළ තලයකට ගෙනයමින් අපගේ ව්‍යායම තවදුරටත් පුළුල් කිරීම හා ආයෝජකයන් ආකර්ශනය කර ගැනීමක් වෙත කේන්ද්‍රගත වෙමින් සිටියි.

## පටුන


| | |
|---|---|
| අපගේ දැක්ම | **1** |
| අපගේ මෙහෙවර | **1** |
| සභාපතිතුමාගේ සමාලෝචනය | **2** |
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ සමාලෝචනය | **6** |
| කොමිෂන් සභා සාමාජිකයන් | **8** |
| ජ්‍යේෂ්ඨ කළමණාකාරීත්වය | **12** |
| කළමණාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය | **14** |
| සාර්ව ආර්ථික විවරණය | **16** |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය | **18** |
| මෙහෙයුම් කටයුතු සමාලෝචනය | **22** |
| අතිරේක තොරතුරු | **46** |
| දත්ත ගොනුව | **50** |


## මූල්‍ය ප්‍රකාශන

(ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව)


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | **54** |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | **56** |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **57** |
| සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | **58** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **59** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය (සෙස් අරමුදල) | **60** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වන්දි අරමුදල) | **61** |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | **62** |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | **64** |


## මූල්‍ය ප්‍රකාශන

(පියවීම සහතික කිරීමේ අරමුදල)


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | **73** |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | **76** |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **77** |
| ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | **78** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **79** |
| ගිණුම්කරන ප්‍රතිපත්ති | **80** |
| සටහන් | **83** |
| ආයතනික තොරතුරු | **ඇතුල් පිට කවරය** |

# අපගේ දැක්ම

“

ඵලදායී, කාර්යක්‍ෂම සහ ක්‍රියාකාරී සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත්කරණයෙහි දකුණු ආසියාවේ ප්‍රමුඛයා බවට පත්වීම

”

# අපගේ මෙහෙවර

“

සාධාරණ සහ කාර්යක්‍ෂමවූත්, නියමානුකූල සහ පාරදෘශ්‍යවූත්, සුරැකුම්පත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය, සංවර්ධනය සහ පවත්වාගෙන යෑම

”

# සභාපතිතුමාගේ සමාලෝචනය



## “වසර තුළ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ තව දුරටත් දියුණු කිරීම සඳහා මෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනයට පැවති සමහර බාධාවන් ඉවත් කිරීම උදෙසා රජය වෙත යෝජනා ඉදිරිපත් කළ අතර, මෙම යෝජනා සියල්ලක්ම පාහේ රජයේ අවධානයට යොමු විය.”

ගෝලීය ආර්ථිකය දුර්වලවීමේ අභියෝගයක් තිබියදීත් 2012 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය 6.4% ක යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කොටස් වෙළෙඳපොළේ 2009 සහ 2010 වසරවල වාර්තා වූ සීඝ්‍ර ඉහළ යාම, 2011 වසර තුළ හා 2012 මුල් මාස හය තුළ යම් කිසි පසුබෑමක් පෙන්වූ අතර, 2012 අවසන් මාස හය තුළ නැවත යථා තත්ත්වයට පැමිණීමක් පෙන්නුම් කරනු ලැබුණි. යුද්ධයෙන් පසු කාලසීමාව තුළ වසර දෙකක් ඇතුළත කොටස් වෙළෙඳපොළ 400% කින් ඉහළ ගියේය. මෙම කාල සීමාව තුළ නවක ආයෝජකයන් බොහෝ පිරිසක් වෙළෙඳපොළ වෙත පිවිසි අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඔවුන් සතු අවබෝධය ඉතා අවම මට්ටමක පැවතුණි. සමපේක්ෂක චේතනාවෙන් පැමිණි ගණුදෙනුකරුවන් කෙටිකාලීන ලාභ බලාපොරොත්තුවෙන් ගණුදෙනු කරනු ලැබූ අතර, වෙළෙඳපොළ දැඩි ලෙස උච්චාවචනය වීමට ද එය ඉවහල් විය. ඔවුන්ගේ මෙම ගණුදෙනු ස්වභාවය වෙළෙඳපොළ කෘත්‍රිම ඉහළ නැගීමක් ඇතිවීමට මුල් වූ අතර, එම අවස්ථාවේ දී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවදානම ලිහිල් කිරීම සඳහා නියමයන් කිහිපයක් හඳුන්වා දුනි. මෙම නියාමන වෙළෙඳපොළ පාර්ශවයන් අතර විවාදයට බඳුන් විය. 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එසේ පනවන ලද නියාමනයන් කිහිපයක් සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට ද කටයුතු කරන ලදී.

මෙම නියමයන් ලිහිල් කිරීමට ප්‍රථමයෙන්, අප විසින් වෙළෙඳපොළ සහභාගීකරුවන්ගෙන් අදහස් විමසීමට ද සැලකිලිමත් වූ අතර, ඔවුන් සමඟ මේ පිළිබඳව අඛණ්ඩ සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදී. අපගේ මූලිකම අවධානය යොමු කරනු ලැබූවේ වගකිව යුතු නියාමනයක් සහතික කිරීම තුළින් ආයෝජකයින් සඳහා සුදුසු ආරක්ෂාවක් ලබාදීමත් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනය වේගවත් කිරීමත් ය. මෙම නියාමනයන් සංශෝධනය කිරීම් අතර, කොටස් තැරැව්කාර සමාගම් වලට තම ගණුදෙනුකරුවන් සඳහා ණය සැපයීමේ දී ගණනය කළ ගලපන ලද ශුද්ධ ප්‍රාග්ධනය සංශෝධනය කිරීමත්, ක්‍රොසින්ස් පුවරුවේ (Crossings Board) ගණුදෙනුවල ඉහළ මිල සීමාව ඉවත් කිරීමත් සහ කොටස් ගණුදෙනු සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර ආයතනවල සේවකයන් සඳහා පනවා තිබූ තහනම් ඉවත් කිරීමත් සිදු විය.

2012 වර්ෂයේ දෙවන භාගයේ දී ආසන්න වශයෙන් 14% ක ප්‍රතිලාභයක් වෙළෙඳපොළ වාර්තා කර තිබූ බව මෙහිදී සඳහන් කළ යුතු වේ. ආයෝජක විශ්වාසය ඉහළ යාම හා රටේ සාර්ව ආර්ථික තත්ත්වයේ දියුණුවත් නිසා ශුද්ධ විදේශ ගලා ඒම් රුපියල් බිලියන 38.6 ක අගයක් ගත් අතර, එය කොළඹ කොටස් හුවමාරුවේ වාර්තා වී ඇති වාර්ෂික ඉහළම ශුද්ධ විදේශීය ගලා ඒම් ප්‍රමාණය වේ.

හොඳින් ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළෙඳපොළකට ඉතුරුම් ආයෝජන බවට පරිවර්තනය කිරීම තුළින් ප්‍රාග්ධනය උපරිම ඵලදායීතාවයකින් යුතුව යෙදවීමට හැකියාවක් ලැබෙන අතර, ආයෝජකයන්ට තමන් දරන අවදානම වෙනුවෙන් ඉහළ ප්‍රතිලාභයක් සහ ව්‍යාපාරවලට තම මූල්‍යය වඩාත් කාර්යක්ෂම අයුරින් යෙදවීමටත් අවස්ථාවක් උදා වේ. වසර තුළ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ තව දුරටත් දියුණු කිරීම සඳහා මෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනයට පැවති සමහර බාධාවන් ඉවත් කිරීම උදෙසා රජය වෙත යෝජනා ඉදිරිපත් කළ අතර, මෙම යෝජනා සියල්ලක්ම පාහේ රජයේ අවධානයට යොමු විය. ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනය කිරීම සඳහා රජය තුළ ඇති අභිප්‍රාය විදහා දක්වමින් 2013 අයවැය තුළ මෙම යෝජනා සියල්ලම පාහේ ඇතුළත් වී තිබුණි.

2012 වසර තුළ අපගේ අවධානය ද උපායමාර්ගික ප්‍රවේශයක් වෙත යොමු වූ අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය යන දෙවදෑරුම් අරමුණු සාක්ෂාත් කරගනිමින් ආර්ථික වර්ධනයට උත්ප්‍රේරකයක් වීම අපගේ දැක්ම විය. නියාමන ක්‍රමය වඩාත් සක්‍රීය කිරීමටත්, ජාත්‍යන්තර තත්ත්වයන් සමඟ යමින් සහ රටේ ප්‍රාග්ධන උත්පාදන අවශ්‍යතාවයට ඵලදායී අයුරින් දායකත්වයක් ලබාදීමත් ඇතුලු ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වූ ප්‍රධාන සැලැස්මක් වෙත අප යොමු වී සිටී. මෙම ප්‍රධාන සැලැස්ම උපාය මාර්ග 10 ක් අරමුණු කර ගනිමින් සකස් වී ඇති අතර, නව ගණුදෙනු උපකරණ හඳුන්වාදීම, රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම, ඒකක භාර හා බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය, වෙළෙඳපොළ යටිතල පහසුකම් නවීකරණය කිරීම, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව අසාමූහිකරණය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම හා ආයෝජකයන් සඳහා ඇති අවස්ථා පුළුල් කිරීම ඊට ඇතුළත් වේ.

# සභාපතිතුමාගේ සමාලෝචනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වූ මෙම ප්‍රධාන සැලැස්ම සකස් කරන ලද්දේ ප්‍රාග්ධන වෙළෙඳපොළ මූලික පාර්ශවකරුවන්ගේ මත ලබා ගනිමින් වන අතර, මෙම සැලසුම ඉදිරියට ගෙන යාම හා ප්‍රතිපත්ති නිර්දේශයන් සැපයීම සඳහා සුරැකුම්පත් වෙළෙඳපොළ, කොළඹ කොටස් හුවමාරුව හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කමිටු රැසක්ම ස්ථාපිත කරන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ, දිගුකාලීන මූල්‍ය සම්පාදනය සඳහා වැදගත් මාර්ගයක් වුවත් ශ්‍රී ලංකාවේ බොහෝ සමාගම් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා තවමත් බැංකු මත විශ්වාසය තබා තිබෙන අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ තවමත් ඔවුන් ප්‍රමාණවත්ව ප්‍රයෝජනයට නොගනී. සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම ධෛර්යමත් කිරීම සඳහා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ලැයිස්තුගත ක්‍රියාවලිය වඩා සරල කිරීම සහ ලැයිස්තුගත කිරීමේ හැකියාව ඇති සමාගම්වලට කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගතවීමේ වාසි පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක්ම දියත් කර ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිර්දේශ මත 2013 දෙසැම්බර් වලට පෙර කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වන නව සමාගම් සඳහා බදු සහන ද සපයමින් රජය අයවැය තුළින් ද මේ සඳහා ප්‍රගාමකයන් සපයන ලදී.

කොටස් හුවමාරුව අසාමූහිකරණය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වැඩි ප්‍රමුඛතාවක් දැක් වූ කාර්යයක් වූ අතර, වසර තුළ ඒ සඳහා වූ ක්‍රමවේදය සකස් කිරීම වේගවත් කරන ලදී. නව අභියෝගයන් හා වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්විය හැකි මෙන්ම ලාභ ලැබීමේ පරමාර්ථයෙන් කටයුතු කරන ව්‍යාපාර වස්තු හුවමාරුවක් බවට පරිවර්තනය කිරීම තුළින් වඩාත් කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක වීම සඳහා මෙවැනි අසාමූහිකරණය වූ ව්‍යාපාර වස්තු හුවමාරුවක අවශ්‍යතාව වැඩියෙන් දැනෙන්නට විය.

පෞද්ගලික අංශය සඳහා විකල්ප අරමුදල් සම්පාදන මාර්ග යක් සැපයීමට හැකි ක්‍රියාකාරී හා කාර්යක්ෂම සාමූහික බැඳුම්කර වෙළෙඳපොළක් ඇති කිරීමට අප වසර තුළ පියවර කිහිපයක්ම ගන්නා ලදී. වසර තුළ අප, වෙළෙඳපොළ යටිතල පහසුකම් පුළුල් කිරීම මෙන්ම මෙහෙයුම් හා ගණුදෙනු ක්‍රියා පටිපාටිය පිළිබඳවත් ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සහ වෙළෙඳපොළ සහභාගීකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිර්දේශ පරිදි ලැයිස්තුගත බැඳුම්කර හා ණයකර පොලිය රඳවා ගැනීම් බදුවලින් නිදහස් කිරීමට රජය අයවැය මගින් ගත් පියවර නිසා වෙළෙඳපොළ පුළුල් වීමට ඉඩ ප්‍රස්ථා ඇති බව අපගේ විශ්වාසයයි.

ආයෝජක විශ්වාසනීයත්වය වැඩි කරන වගකිව යුතු නියාමනයක් ඵලදායී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයකට අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පසුගිය වසරේ ක්‍රියාත්මක වුනු අතර, සාධාරණ හා වඩා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක් බිහි කිරීමක් සඳහා එය උපකාරී වේ. මූල්‍ය අංශය ප්‍රතිසංස්කරණය හා ශක්තිමත් කිරීම සඳහා වන ලෝක බැංකු අනුබද්ධ ආයතනය විසින් පනත ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය නිර්දේශ හා යෝජනා සපයන ලදී. පනතේ සිදු කරනු ලබන සංශෝධන මගින්, ව්‍යුත්පන්න සුරැකුම්පත් හුවමාරුවක් ස්ථාපිත කිරීම, ගණුදෙනු බේරුම් කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීම, අසාමූහිකරණය වු කොටස් වෙළෙඳපොළකට බලපත්‍ර ලබාදීම හා සිවිල් දඬුවම් ලබාදීම ආරම්භ කිරීම හා ප්‍රාග්ධන වෙළෙඳපොළ වැරදිවලට එරෙහිව පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය ලබාදීම සඳහා යන සියල්ල සඳහා සුදුසු නියාමන රාමුවක් ස්ථාපිත කිරීම අරමුණ වේ.

දේශීය ඉතුරුම් වඩා කාර්යක්ෂම අයුරින් යෙදවීමට හා සුළු පරිමාණ අරමුදල් සහිත ආයෝජකයන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළට සහභාගීවීමේ අවස්ථාව උදා කරමින් විවිධාංගීකරණය වූ ආයෝජන ඇතුළත් ඒකක භාර අරමුදල්වල ආයෝජනය පිළිබඳව වෙළෙඳපොළ දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා ද අප කටයුතු කරන ලදී. ඒකක භාර තව දුරටත් ජනප්‍රිය කිරීම සඳහාත්, විදේශවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට සුරැකුම්පත් ආයෝජන ගිණුමක් (SIA) හරහා නොගොස් විදේශීය මුදල් මගින් ඍජු ආයෝජන ලෙස ඒකක භාරවල ආයෝජනය සඳහා රජය අවසර ලබාදෙන ලදී. මෙම පෙළඹවීම් මගින් නිසැකවම ඒකක භාර ආයෝජනය කෙරෙහි ආයෝජකයන් උනන්දු කිරීමත්, සාම්ප්‍රදායික ආයෝජන අවස්ථාවලින් ජනතාව ඒකක භාර වෙත නැඹුරු කර ගැනීමටත් අවස්ථාව උදා වේ.

යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදය තුළ ආර්ථික ක්‍රියාකාරකම් හා කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් එකක් පසුපස එකක් යන අයුරින් සැලකිය යුතු ලෙස ක්ෂණික ඉහළ නැගීමක් පෙන්නුම් කරමින් වර්ධනය විය. මෙම කොටස් තැරැව්කාර සමාගම්වල ශාඛා ව්‍යාප්තිය ඉහළ යාමට ද හේතු විය. මෙම ක්ෂණික සංවර්ධනයන් නිසා ගෝලීය ආයෝජනය තුළ ද ප්‍රබල වෙනස්කම් සිදු විය. නවීන තාක්ෂණය අනුව යමින් නව යටිතල පහසුකම් වර්ධනය කර ගැනීම සඳහා දිරිදීමක් වශයෙන් කොටස් තැරැව්කාර ආයතනවලට තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ප්‍රාග්ධන අයිතම සඳහා 100% ක ක්ෂයවීම් දීමනාවක් රජය මගින් අයවැය තුළින් ලබා දෙන ලදී. මෙමගින් කොටස් තැරැව්කාර ආයතනවලට තරඟකාරීව වර්ධනය වෙමින් හා කාර්යක්ෂම ලෙස ආයෝජකයන්ගේ අවශ්‍යතා ඉටුකරලීමට අවස්ථාව උදා වේ.

වසර තුළ, සුළු පරිමාණ ආයෝජකයන්ගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම වර්ධනය කිරීම සඳහා අප පියවර ගන්නා ලදී. එමගින් ආයෝජකයන්ට නිවැරදි ආයෝජන තීරණ ගැනීමට අවස්ථාව සැලසීම අරමුණ විය. එය අපගේ ආයෝජක අධ්‍යාපන වැඩසටහන් තුළින් ද පෙන්නුම් කරන අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ භාෂා ත්‍රිත්වයෙන්ම ලියවුන අඛණ්ඩ පුවත්පත් ලිපි මාලාව, ආයෝජක දින වැඩසටහන් මෙන්ම

දැනුම මිනුම තරඟ ද විය. අපගේ සියලුම ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව මාධ්‍යය ද දැනුවත් කළ අතර, අතේ දුරින් පිහිටි ප්‍රවේශයකින් තොර වූ සහ විනිවිදභාවයකින් යුතු මාධ්‍ය ප්‍රතිපත්තියක් ද ක්‍රියාත්මක කරන ලදී.

නව උපාය මාර්ගික ක්‍රියාකාරකම් තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ මෙන්ම ආර්ථිකය ද නව යුගයක් කරා රැගෙන යනු ඇතැයි අපට බලාපොරොත්තු තැබිය හැකිය. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා දැක් වූ සහයෝගය පිළිබඳව මා මෙහිදී කොමිෂන් සභා සාමාජිකයන්ට ස්තුතිය පිරිනමමි. වර්ෂය පුරා ලබා දුන් සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය හා මහ බැංකුවටත්, කැපවීමෙන් වැඩ කරමින් අපගේ නව උපාය මාර්ගික ගමන් මගට ලඟාවීම සඳහා සහයෝගය ලබා දුන් කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර හා කොටස් තැරැව්කාර සමාගම්වලටත් සහ ලේකම් කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. අවසාන වශයෙන් අප වෙත ලබා දුන් සහයෝගය වෙනුවෙන් සියලුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වෙත මාගේ කෘතඥතාවය පුද කිරීමට  කැමැත්තෙමි.



**ආචාර්ය නාලක ගොඩහේවා**
*සභාපති.*

2013 අප්‍රේල් 19

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



ස්ථාවර ආදායම් සුරැකුම්පත් මත පැවති ඉහළ පොළී අනුපාතයන්, විනිමය අනුපාත උච්චාවචනයන්, ආයෝජක විශ්වාසය පහළ යාම හා ලෝක මූල්‍ය වෙළෙඳපොළේ පැවති සෘණාත්මක බලපෑම යනාදී අභියෝග රැසකට මුහුණ දීමට 2012 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට සිදු විය. මෙවැනි පසුබිමක ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ සහභාගීකරුවන්ගේ ද අදහස් ලබාගෙන ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ මූලික සැලැස්මක් සම්පාදනය කරන ලදී. එමගින් ප්‍රාග්ධන උත්පාදනය හා ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් මෙහෙවරක් කළ හැකි වෙළෙඳපොළක් බවට පත් කිරීමේ අපේක්ෂාවෙන් මෙම සැලැස්ම නිර්මාණය කරන ලදී.

ජාතික සංවර්ධනයට උරදිය හැකි ප්‍රබල හා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක් බිහි කිරීමට මෙම සැලැස්ම උපකාරී වන අතර, ශ්‍රී ලංකාව කලාපයේ වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට ද මෙම සැලැස්ම මගින් හැකියාව ලැබෙනු ඇත. එම සැලැස්මේ අන්තර්ගත සමහර මූලික ක්‍රියාකාරකම් අතර ආයෝජන මාර්ගයක් ලෙස ඒකක භාර කර්මාන්තය සංවර්ධනය කිරීම, ණයකර වෙළෙඳපොළ සංවර්ධනය, ලැයිස්තුගත කිරීම කෙරෙහි සමාගම් ධෛර්යමත් කිරීම හා නව අරමුදල් ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ආකර්ෂණය කර ගැනීම, අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම කඩිනම් කිරීම, ආයෝජකයන් දැනුවත් කිරීමේ කටයුතු පුළුල් කිරීම හා කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණය ප්‍රමුඛ වේ.

වෙළෙඳපොළ නැවත යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කිරීමත් සමඟ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම පිණිස හඳුන්වා දෙන ලද සමහර නියාමන ක්‍රියාමාර්ග ලිහිල් කිරීමට පියවර ගන්නා ලදී. කොටස් තැරැව්කාර ආයතන තම ගණුදෙනුකරුවන් සඳහා ලබා දෙන ණය සීමා ලිහිල් කිරීම, දැඩිව මිල උච්ඡාවචනයට ලක්වන කොටස් මත පනවන ලද දින පහක් සඳහා 10% මිල පරාස සීමාව ඉවත් කිරීම, කොළඹ කොටස් හුවමාරුවේ ක්‍රොසිංස් පුවරුවේ ගණුදෙනු මත පැන වූ 20% ඉහළ මිල සීමාව ඉවත් කිරීම ආදිය එම නියාමනයන් අතර විය.

සාධාරණ නියමානුකූල හා පාරදෘශ්‍යභාවයෙන් යුතු ප්‍රාග්ධන වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා වෙළෙඳපොළ නියාමනය කිරීම අත්‍යවශ්‍යය. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට පහසුකම් සැපයීම සඳහා අප නියාමන රාමුව වඩාත් ශක්තිමත් කළ යුතු අතර, යෝජිත සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ඇතුළත් විශේෂ සංශෝධන කිහිපයක් මගින් එය ඉටු කර ගැනීම අපේක්ෂාව වේ. ඒ අනුව සංශෝධනය කර සකස් කළ පනත නීතිපති දෙපාර්තමේන්තුවේ මතය බලාපොරොත්තුවෙන් සිටින අතර, මෙම සංශෝධිත පනත මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සිදු කරන අක්‍රමිකතා සඳහා සිවිල් හා පරිපාලන දඬුවම් මාලාවක් හඳුන්වා දීමට නියමිතව ඇත. එමෙන්ම පනතේ සංශෝධනයට ගෝලීය සංවර්ධනයන් ද පාදක කර ගනිමින් නියාමන කටයුතු කාර්යක්ෂම අයුරින් හැසිරවීමත්, නව උපකරණ හඳුන්වාදීමට උපකාරීවීම, අසාමූහිකරණය වූ කොටස් වෙළෙඳපොළක් බිහි කිරීමට පහසුකම් සැලසීම මෙන්ම මධ්‍යම නිෂ්කාශන ආයතනයක් ස්ථාපිත කිරීමට ද උපකාරී වේ.

සැලකිය යුතු කොටස් සංඛ්‍යාවක් විශාල කොටස් හිමියන් පිරිසක් අතර බෙදීයාම මගින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ යාමත්, සාධාරණ සහ අපක්ෂපාතී මිලක් සොයා ගැනීමට ඉඩකඩ ලැබීමක් මෙන්ම ධනය බෙදී යාමේ ක්‍රියාවලිය නිසි ලෙස සිදුවීමටත් අවස්ථාවක් ඉන් උදා වෙයි. ලැයිස්තුගත සමාගමක කොටස්වලින් මහජනතාව සතුව තිබිය යුතු අවම කොටස් ප්‍රමාණය සඳහා රීති සම්පාදනය කොට අඛණ්ඩ ලැයිස්තුගත නියමයන්ට ඇතුළත් කිරීමට මෙම වසර තුළ හැකියාව ලැබුණු අතර, එම නියමයන් තව දුරටත් මහජන උපදෙස් ලබා ගැනීම පිණිස යොමු කරන ලදී. මෙම උත්සාහයේ අරමුණ වූයේ වෙළෙඳපොළ පිරිවැටුම ඉහළ නැංවීම, දිගුකාලීන ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම හා වෙළෙඳපොළ සංවර්ධනය හා ද්‍රවශීලතාවය ඉහළ නැංවීමයි.

ප්‍රාග්ධන වෙළෙඳපොළේ නිසි ලෙස ආයෝජනය කරන ආයෝජකයන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා අප වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී. මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩ සටහන් භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වන ලද අතර පාසල්, විශ්ව විද්‍යාල, විවිධ සංවිධානවල සාමාජිකයන් හා සාමාන්‍ය මහජනතාව ඉලක්ක කර ගනිමින් එම වැඩසටහන් පවත්වන ලදී. වසර තුළ සිදු කරන ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව ඉහළ නැංවීමටත් ඒ සඳහා යොමු වූ පිරිස වර්ධනය කිරීමටත් අපට හැකි වූ අතර පුවත්පත් ලිපි, සම්මන්ත්‍රණ, වැඩමුළු, රූපවාහිනී වැඩසටහන්, දැනුම මිනුම තරඟ ඒ සඳහා බෙහෙවින් උපකාරී විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදීමේ විභාග ද අඛණ්ඩව තව දුරටත් පවත්වන ලද අතර, පළපුරුදු හා සාර්ථක වෙළෙඳපොළ අතරමැදියන් බිහි කිරීම සඳහා වන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවන් ද මෙහෙයවන ලදී. සාර්ථකව පාඨමාලා අවසන් කළ 800 ට වඩා වැඩි පිරිසක් සඳහා අදාළ සහතිකපත් හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට ද වසර තුළ දී හැකියාව ලැබුණි. කලාපය තුළ අන්‍යෝන්‍ය සහයෝගය ඉහළ නැංවීමටත්, ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳපොළ ගණුදෙනු නියාමන රාමුව හා ගණුදෙනු උපකරණ පිළිබඳ දැනුම හා අවබෝධය ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් "ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය හා අධීක්ෂණය" මැයෙන් පවත්වන ලද කලාපීය සම්මන්ත්‍රණයට සත්කාරකත්වය ද දක්වන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සියලු පාර්ශවකරුවන් අතර නිසියාකාර අනුකූලතාවයන් පවත්වා ගැනීම ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමට ඉවහල් වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ද බැඳී සිටියි. වෙළෙඳපොළ අතරමැදි ආයතන අතර එවැනි යහපත් අනුකූලතාවයන් ඇති කිරීම උදෙසා අප විසින් අවදානම පදනම් කර ගත් අනුකූලතා නිරීක්ෂණයන් අඛණ්ඩව සිදු කරන ලදී. එමෙන්ම අප විසින් නියාමනයට ලක් කරනු ලබන සියලු පාර්ශවයන් සමඟ සාකච්ඡාවන් පවත්වමින් නියාමන වගකීම් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. නව ආවේක්ෂණ පද්ධතිය මගින් ද වෙළෙඳපොළ ආවේක්ෂණ කටයුතු වඩාත් සාර්ථකව සිදු කර ගෙන යාමට හැකියාව අපට ලැබී ඇත. එම පද්ධතිය මගින් වෙළෙඳපොළ ගණුදෙනු පිළිබඳ නැවත බැලීමට අවස්ථාවක්, අනතුරු හැඟවීමේ පරාමිතීන් හඳුන්වාදීමක් හා නිසි වාර්තා කළමනාකරණ හැකියාවක් ඇතුලු පහසුකම් රැසක් ලබා දේ.

අප ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ඒකක භාර කර්මාන්තය ප්‍රබල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ආයෝජකයන් යොමු කිරීමටත්, ආර්ථිකය වෙත ප්‍රාග්ධනය මෙහෙයවීමටත් ඒකක භාර කර්මාන්තය දායක වේ. බැංකු සහ මූල්‍ය සමාගම්වල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා ගණනය කිරීමේ දී රාජ්‍ය සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කරන ඒකක භාර ද එහි අර්ථකථනයට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම් කරන ලදී.

අප තව තවත් ඉදිරියට යමින් ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත දේශීය හා විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට හා වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වේගවත් කිරීමට ද තීරණය කර ඇත. අවසාන වශයෙන් මා වෙත ලබා දුන් අඛණ්ඩ මඟ පෙන්වීම් වෙනුවෙන් සභාපතිතුමන් ඇතුලු සියලුම කොමිෂන් සභා සාමාජිකයන්ටත්, වෙළෙඳපොළ සහභාගීකරුවන්ටත්, කැපවීමෙන් හා ඉහළ වෘත්තීයතාවයකින් තම කාර්යය නිසි අයුරින් ඉටු කළ ලේකම් කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ හද පිරි කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



**මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර**
*අධ්‍යක්ෂ ජනරාල්*

2013 අප්‍රේල් 19

# කොමිෂන් සභා සාමාජිකයන්



1 **ආචාර්ය නාලක ගොඩහේවා**
*සභාපති*



2 **ලෝලිත අබේසිංහ මහතා**



5 **සුජීව රාජපක්ෂ මහතා**



6 **ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා**



3 එම්. ඉසෙඩ්. එම්. හෂීම් මහතා



4 බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා



7 පී. ඩී. ජේ. ප්‍රනාන්දු මහතා



8 ආචාර්ය බී. එම්. එස්. බටගොඩ

# කොමිෂන් සභා සාමාජිකයන්

## ආචාර්ය නාලක ගොඩහේවා *-සභාපති*

ඔහු නාගරික සංවර්ධන අධිකාරියේ, ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී. එල්. සී. සමාගමේ, සීමාසහිත ශ්‍රී ලංකා කේටරින් සර්විසස් සමාගමේ හා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ද අධ්‍යක්ෂක මණ්ඩලයේ කටයුතු කරයි.

ඔහු මීට පෙර ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ, හා මාස් ඕවර්සීස් ඔපරේෂන්ස් හි ප්‍රධාන විධායක නිලධාරිවරයා යන තනතුරු දරා ඇත.

එකිනෙකට වෙනස් වූ අංශයන් තුනකින් අධ්‍යාපන සුදුසුකම් වලින් හෙබි ආචාර්ය නාලක ගොඩහේවා මහතා ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, අලෙවිකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ද ලබා ඇත. ආචාර්ය නාලක ගොඩහේවා මහතා එංගලන්තයේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ (CIM,UK) සාමාජිකයකු ද, එංගලන්තයේ කළමනාකරණ ගණකාධිකාරිවරුන් පිළිබඳ වරලත් ආයතනයේ (CIMA,UK) හා ඕස්ට්‍රේලියාවේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CMA,Australia) සාමාජිකයකු ද වේ.

## ලෝලිත අබේසිංහ මහතා

ලෝලිත අබේසිංහ මහතා වෘත්තීය ව්‍යාපාර උපදේශකයකු වන අතර, වෙලීනා කැපිටල් කෝපරේෂන් පුද්ගලික සමාගම යන නාමය යටතේ විවිධ ආකෘති (රාජ්‍ය හා පෞද්ගලික) උපයෝගී කර ගනිමින් සහ ව්‍යාපෘති කළමනාකරණයට ප්‍රමුඛතාව ලබා දෙමින් උපදේශක ආයතනයක් ද පවත්වාගෙන යයි. ඔහු වින්ග්‍රොව්ස් බිස්නස් සොලූෂන්ස් පෞද්ගලික සමාගමේ, චීන විද්‍යා හා තාක්ෂණ ජාත්‍යන්තර සැපයුම් සහයෝගිතා ලංකා සමාගම, වෙලීනා නැෂනල් ඉංජිනියරිං බියුරෝ ඔෆ් ඩුබායි ලංකා ලිමිටඩ් යන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම්වල කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු ද වේ.

ලෝලිත අබේසිංහ මහතා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාගේ උපදේශකවරයකු ලෙස ද කටයුතු කරයි. එමෙන්ම රාජ්‍ය ප්‍රවාහන අමාත්‍යවරයාගේ කළමනාකරණ උපදේශක ලෙසත්, ජාතික හස්ත කර්මාන්ත මණ්ඩලයේ සභාපතිවරයාගේ උපදේශකයකු ලෙසත් කටයුතු කර ඇත.

ලෝලිත අබේසිංහ මහතා ටොරොන්ටෝහි ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු හා ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු ද වේ. ඔහු ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ (FCCISL) ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සහතිකපත්ලාභියකු මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලයේ උසස් මෙහෙයුම් විධි පිළිබඳ වූ ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ සහතිකපත් ලාභියකු ද වේ. ඔහු වර්තමානයේ දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ අධ්‍යයන කටයුතුවල නිරත වී සිටී.

ඔහු ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

ලෝලිත අබේසිංහ මහතා, ෆෝසීසන්ස් හොස්පිටල්ස් (පුද්ගලික) සමාගම, කැන්ටන් එනර්ජි (පුද්ගලික) සමාගම, AGSS ඉන්ටර්නැෂනල් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම, නොබෙල් ෆ්‍රයිට් ලිමිටඩ්, SLN පැකේජින් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම, මැනේජ්මන්ට් එඩියුකේෂන් ඩිවලොප්මන්ට් ඒජන්සි, මෙඩිමාර්ට්/UAK සප්ලයර්ස්, ඉම්පැක්ට් ඉන්ටර්නැෂනල් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම, නොබෙල් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, ෆෝකස් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, සැරිරෝ ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, ඉවෝර්ක් ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම, වොක්ෂෝල් කෝපරේෂන් (පුද්ගලික) සමාගම, ලංකා ලයිට් ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට්ස් එක්ස්පෝර්ට්/ඉම්පෝර්ට් (පුද්ගලික) සමාගම, හයිබ්‍රයිඩ් ස්ට්‍රක්චර්ස් ලංකා (පුද්ගලික) සමාගම, ලංකා ග්‍රීන් එනර්ජි (පුද්ගලික) සමාගම, අකාමායි කමියුනිකේෂන් කම්පනි (පුද්ගලික) සමාගම, SAR එම්බෙලිෂ්මන්ට්ස් (පුද්ගලික) සමාගම, ඇරාඩේස් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම, මෙගාපුත්‍ර (පුද්ගලික) සමාගම, පහත සඳහන් ව්‍යාපාරයන්හි අධ්‍යක්ෂවරයෙකු / උපදේශකවරයෙකු වශයෙන් ද සේවා කටයුතුවල නිරතව සිට හෝ දැනට නිරත වෙමින් සිටී.

ලෝලිත අබේසිංහ මහතා, දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයකට සහභාගී වී ඇත. එමෙන්ම ඔහු ජාත්‍යන්තර සම්මන්ත්‍රණ කිහිපයකටම ලිපි පළ කර ඇත.

## එම්. ඉසෙඩ්. එම්. හෂීම් මහතා

මොහොමඩ් හිෆාෂ් හෂීම් මහතා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකු මෙන්ම මිඩ්ල් ටෙම්පල් හි අධිනීතිඥයකු ද වේ. ඔහු මැල්ෂිෆ් සමාගම් සමූහයේ, ඩිවලොප්මන්ට් ඉන්ටර්ප්ලෑන් සිලෝන් ලිමිටඩ් හා කෙරී මැල්ෂිෆ් ලොජිස්ටික්ස් ලංකා පුද්ගලික සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂවරයකු ද වේ. ඔහු ශ්‍රී ලංකා එළවළු හා පලතුරු නිෂ්පාදන, සැකසීමේ හා අපනයන සංගමයේ මහ ලේකම්වරයා ද වේ. ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විවිධ දේශීය හා විදේශීය ව්‍යාපාරික සමුළු ගණනාවකට ද සහභාගී වී ඇත.

## බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා

බී.ඩී.ඩබ්. ආනන්ද සිල්වා මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවුරුදු 28 ක් කටයුතු කර ඇති අතර, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, ආර්ථික සමීක්ෂණ දෙපාර්තමේන්තුව හා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල ද සේවය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඔහුගේ වෘත්තීය කාල සීමාව තුළ මූල්‍ය ප්‍රතිපත්ති, බැංකු අධීක්ෂණ, මූල්‍ය ක්‍රම ස්ථායීතාවය, විනිමය අනුපාත ප්‍රතිපත්ති, විදේශීය වෙළෙඳාම සහ ගෙවුම් ශේෂය ආදී අංශයන් පිළිබඳ පුළුල් පළපුරුද්දක් ලබා ඇත.

ඔහු යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී පළමු පෙළ උපාධියක්, එක්සත් ජනපදයේ ආයෝවා විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත් සහ එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියත් හිමි කර ගෙන ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ද වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙයවන ඉහළ මට්ටමේ පාඨමාලා කිහිපයකම සම්පත් දායකයකු ද වේ.

බී.ඩී.ඩබ්. ආනන්ද සිල්වා මහතා වර්තමානයේ දී ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපතිවරයා, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපතිවරයා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයකු ද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ද, අපි වෙනුවෙන් අපි අරමුදලේ අධ්‍යක්ෂවරයෙකු ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ තත්ත්ව සහතික මණ්ඩලයේ සාමාජිකයකු මෙන්ම සීමාසහිත වෙස්ට් කෝස්ට් පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කරයි.

## සුජීව රාජපක්ෂ මහතා

සුජීව රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වන අතර, වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයක් වන BDO පාට්නර්ස් සමාගමේ කළමනාකාර හවුල්කරුවෙකු හා එහි වසර 28 කට අධික පළපුරුද්දක් ඇති අයෙකු ද වේ. එමෙන්ම, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු ද වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකු ද වේ.

වර්තමානයේ දී සුජීව රාජපක්ෂ මහතා දකුණු ආසියානු ගණකාධිකාරීන්ගේ සංගමයේ (SAFA) තාක්ෂණික උපදේශක ලෙස ද කටයුතු කරන අතර, ආසියා පැසිෆික් ගණකාධිකාරීන්ගේ ඒකාබද්ධ සමූහයේ සාමාජිකයෙකු ද වේ. ඔහු වර්තමානයේ ඒෂියන් එලයන්ස් පී. එල්. සී , ජාතික සංවර්ධන බැංකුව පී. එල්. සී, හේකාබ් පී. එල්. සී. යන සමාගම්වල අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි. ඔහු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනයේ (NIBM), පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ (PIM), හා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය (SLAAMB) යන ආයතනයන්හි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පත් කළ සාමාජිකයකු ද වේ. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති උපදේශන කමිටුවේ කමිටු සාමාජිකයෙකු ද වේ.

## ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා 1993 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී ගෞරව දෙවන පෙළ උපාධියක් ලබා ඇති අතර, 1994 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලය මෙහෙය වූ අවසන් විභාගයෙන් පළමු පන්තියේ ගෞරව උපාධියක් හිමි කර ගත් නීතීඥයෙකු ලෙස සුදුසුකම් ලබාගෙන ඇත. ඔහු නීති විද්‍යාල විවාද කණ්ඩායමේ නායකයා ලෙස ද කටයුතු කර ඇති අතර, 1993 නීති පීඨය සංවිධානය කළ ජූරි සභා විවාදයට ද සහභාගී වී රන් පදක්කමක් ද හිමි කර ගෙන ඇත. ඔහු වර්ෂ 2000 දී ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්ව විද්‍යාලයෙන් නීතිපති ගෞරව උපාධියත්, ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයේ T.C. බර්නි නීති විද්‍යාලයෙන් නීතිය පිළිබඳ ආචාර්ය උපාධියත් හිමි කර ගෙන ඇත. ඔහු 2002/2005 කාලය තුළ ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙහි T.C. බර්නි නීති විද්‍යාලයේ තුළනාත්මක නීති මධ්‍යස්ථානයේ පර්යේෂණ පිළිබඳ

ආදි ශිෂ්‍යයෙකු ද විය. ඔහු 2003 වසරේ දී අන්තර්ජාතික නීති සංගමයෙන් පිරිනැමෙන දක්ෂතම තරුණ නීතිඥයාට හිමි සම්මානයක් ද ලබා ගෙන ඇත.

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා තම ශාස්ත්‍රීය කටයුතු ආරම්භ කරන්නේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙසයි. පසුව ඒ මහතා නීති විද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තෝරා ගැණුනු අතර, ඊට පසුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර දක්වා උසස්වීමක් ද ලබා ඇත. ඔහු වර්තමානයේ දී කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති තනතුර ද හොබවයි. තවද ඒ මහතා කළුතර ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ, ත්‍රිකුණාමලය නාවික හමුදා පාසලේ, කළුතර ශ්‍රී ලංකා පොලිස් පුහුණු පාසලේ, කටුකුරුන්ද විශේෂ කාර්ය බලකා පුහුණු මධ්‍යස්ථානයේ, හා නේපාලයේ තිබුවාන් විශ්ව විද්‍යාලයේ (ශාස්ත්‍රපති උපාධි) මානව අයිතිවාසිකම් නීති පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු ද වේ. තවද ඒ මහතා මොරටුව විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව මෙහෙයවන විද්‍යාපති උපාධි පාඨමාලා සඳහාත්, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලේත් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ද නීතිය පිළිබඳ ඉගැන්වීම් කටයුතුවල නිරත වී සිටී.

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයේ පරිගණක පීඨයේ හා කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨවල උසස් පාඨමාලා නිබන්ධනයන්හි අධීක්ෂකයකු ලෙස ද කටයුතු කරයි. එමෙන්ම ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ව්‍යාපෘති වාර්තා අධීක්ෂකවරයෙක් ලෙසත්, බරණැස් හින්දු විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි නිබන්ධන අධීක්ෂක තනතුරක් ද හොබවනු ලබයි. ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ මානව අයිතිවාසිකම් ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයා ලෙස ද කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකා පොලිස් විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ උපදේශක මණ්ඩල සාමාජිකයකු, කොළඹ විශ්ව විද්‍යාලයේ පීඨ මණ්ඩල සාමාජිකයකු, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ සහ ශ්‍රී ලංකා නීතිඥ සභාවේ සාමාජිකයකු මෙන්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සහ උපදේශක මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නීති කමිටුවේ, මොරටුව විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, එක්සත් රාජධානියේ අන්තර ජාතික නීතිඥ සංගමයේ හා ඕස්ට්‍රේලියාවේ නීති ආචාර්යවරුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකු ද වේ.

ඔහු මෑතක දී පර්යේෂණ ව්‍යාපෘති 2 ක් නිම කළ අතර, ඉන් පළමුවැන්න වනුයේ දුරකථන මධ්‍යස්ථාන සේවක පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙහෙය වූ ව්‍යාපෘතිය වන අතර, දෙවැන්න වනුයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය මෙහෙය වූ ඉලෙක්ට්‍රොනික් නීති ව්‍යාපෘතියක් සම්බන්ධ ව්‍යාපෘතියකි.

ඔහුට පර්යේෂණ ප්‍රදානයන් ද කිහිපයක් ම ලැබී ඇති අතර, 2008 ජාතික විද්‍යා පදනමේ ප්‍රදානය, දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් විශ්ව විද්‍යාල පර්යේෂණ ප්‍රදානය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2007/2008 පර්යේෂණ ප්‍රදානය, 2002/2005 ලෝක බැංකු ආචාර්ය උපාධි පර්යේෂණ ප්‍රදානය, 2004 වසරේ පෝලන්තයේ පැවති ලෝක දත්ත ආරක්ෂණ කොමසාරිස්වරුන්ගේ සමුළුව සඳහා ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් පිරිනැමෙන සංචාරක ප්‍රදානය, 2002 වසරේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි සඳහා පිරිනැමෙන පර්යේෂණ ප්‍රදානය, 2004 අනාගත පර්යේෂකයින් සඳහා පිරිනැමෙන ඕස්ට්‍රේලියානු පර්යේෂණ සභා ප්‍රදානය යන ප්‍රදානයන් ඒ අතර ප්‍රධාන වේ.

ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා 2000 වර්ෂයේ ප්‍රජාව සම්බන්ධයෙන් වූ ප්‍රංශයේ මානව අයිතිවාසිකම් ශිෂ්‍යත්ව පිළිබඳ ජාත්‍යන්තර ආයතනය වැනි ආයතනවලින් ද, නීති ක්ෂේත්‍රය වෙනුවෙන් දක්වන ලද විශේෂිත දායකත්වය වෙනුවෙන් ද ප්‍රදානයන් රැසක් ලබා ගෙන ඇත. ඔහු සැන්ෆ්‍රැන්සිස්කෝ හි 2003 ජාත්‍යන්තර නීතිඥ සංගමයේ තරුණ නීතිඥයින් සඳහා පිරිනැමෙන ප්‍රදානය හා 2004 වසරේ එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ ඉලෙක්ට්‍රොනික් පෞද්ගලික තොරතුරු මධ්‍යස්ථානයෙන් පිරිනැමෙන පෞද්ගලිකත්වයේ නව යුගය යන සංචාරක ප්‍රදානයට ද හිමිකම් කියන ලදී.

## පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා

පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා, බැංකු ක්ෂේත්‍රයේ වසර 30 කට වඩා පළපුරුදු ලත් අයෙකි. ප්‍රනාන්දු මහතා මීට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට සම්බන්ධ වී කටයුතු කර ඇත. විවිධ හැකියාවන් පෙන්වමින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු හොබවමින් ඔහු 2010/2011 කාලය තුළ මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය ද හොබවා ඇති අතර, මූල්‍ය ක්‍රම ස්ථායීතාවය පිළිබඳ හා සාංගමික සේවා පර්ෂදයේ ප්‍රධානියා වශයෙන් ද කටයුතු කර ඇත. පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා, බැංකු හා මූල්‍ය අංශ නියාමනය, උපාය මාර්ගික සැලසුම් හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණ, ජාතික ගිණුම්කරණ හා සංඛ්‍යාලේඛන, ජාතික ගෙවුම් හා බේරුම්කරණ යන අංශයන්හි පෘථුල අත්දැකීම්වලින් යුත් හා ඒ පිළිබඳ ප්‍රවීණයකු ද වේ. මහ බැංකුවේ කටයුතු කළ කාලය තුළ මූල්‍ය ස්ථාවරත්ව කමිටුවේ සභාපති, මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයකු, අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු මෙන්ම ජාතික ගෙවීම් කවුන්සිලයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත. ඔහු වර්ෂ 2011 දී මූල්‍යමය වශයෙන් දුෂ්කරතාවයට පත් ලියාපදිංචි සමාගම් 7 ක් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මහ බැංකුව පත් කළ නිලධාරී කණ්ඩායමේ මූලිකත්වය ද උසුලනු ලැබීය.

ඔහු මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දැරූ කාලය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිළ බලයෙන් පත් වූ සාමාජිකයකු, ණය තොරතුරු කාර්යාංශයේ සභාපති වශයෙන් හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ද සේවය කර ඇත. එමෙන්ම ඔහු සේවක භාරකාර අරමුදලේ සාමාජික මණ්ඩලයේ තනතුරු ද, ලංකා ක්ලියර් පෞද්ගලික සමාගමේ හා ලංකා මූල්‍ය සේවා කාර්යාංශයේ සාමාජික මණ්ඩලයේ ද කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අමතරව, ප්‍රනාන්දු මහතා වර්තමානයේ දී යුනියන් බැංකුවේ, කොමර්ෂල් ෆිනෑන්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්, කොමර්ෂල් ඉන්ෂුරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්, තැප්‍රොබේන් හෝල්ඩිංග්ස් ලිමිටඩ්, හම්බාන පෙට්‍රෝ-කෙමිකල් කම්පැනි ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද කටයුතු කරයි.

ඔහුගේ වෘත්තීය ගමන් මගෙහි ජාතික වශයෙන් වැදගත් වූ මූලික ව්‍යාපෘති කිහිපයක් ම ඔහුගේ මූලිකත්වයෙන් පෙරමුණ ගෙන දියත් කරන ලද අතර, ජාතික ගෙවීම් හා බේරුම්කරණය සම්බන්ධ ව්‍යාපෘතිය විශේෂයෙන් සඳහන් කළ හැකිය.

එපමණක් නොව ප්‍රනාන්දු මහතා විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික මට්ටමේ කමිටු රාශියකම කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකාව හා මහ බැංකුව නියෝජනය කරමින් විදේශීය සමුළු ගණනාවකට ද සහභාගී වී ඇත.

## ආචාර්ය බී. එම්. එස්. බටගොඩ

ආචාර්ය බී එම් එස් බටගොඩ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකු වන අතර, එක්සත් රාජධානියේ නැගෙනහිර ඇන්ග්ලියා විශ්ව විද්‍යාලයේ පාරිසරික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හිමි කර ගෙන ඇත. එමෙන්ම ආචාර්ය බටගොඩ මහතා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ එක්සත් ජනපදයේ මිචිගන් රජයේ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ද හිමි කර ගෙන ඇත. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිවේදියෙකු ද වන ආචාර්ය බටගොඩ මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකපත් ලාභියෙකු ද වේ.

ආචාර්ය බටගොඩ මහතා ලංකා විදුලි බල මණ්ඩලය, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්, සාර්ක් සංවර්ධන අරමුදල, ලංකා සීනි සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රය, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකා කාබන් අරමුදල, ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසම යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ආචාර්ය බටගොඩ මහතා ශ්‍රී ලංකා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරයක් ද උසුලනු ලබයි. ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, රාජ්‍ය ව්‍යාපාර හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. ඔහු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, පරිසර අමාත්‍යාංශයේ, ස්වභාවික සම්පත් යන අමාත්‍යාංශවල හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් ද හොබවා ඇත. තවද ඒ මහතා අතිගරු ජනාධිපතිතුමාගේ සහකාර ලේකම්වරයෙකු වශයෙන් සේවය කර ඇති අතර, ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන් ද කටයුතු කර ඇත.

එමෙන්ම ආචාර්ය බටගොඩ මහතා ග්‍රන්ථ කිහිපයකම කතුවරයෙකු ද වන අතර, ශ්‍රී ලංකා පාරිසරික තත්ත්වය, ශ්‍රී ලංකාවේ කඩොලාන වනාන්තරවල විකල්ප ප්‍රයෝජන පිළිබඳ ආර්ථික තක්සේරුව ඉන් ප්‍රධාන තැනක් ගනී. ඊට අමතරව නාගරික වායු ගුණත්ව කළමනාකරණය, ශ්‍රී ලංකාවේ පාරිසරික තක්සේරුව පිළිබඳ න්‍යායාත්මක අත්පොත හා ශ්‍රී ලංකාවේ වාහන හා ඉන්ධන පිළිබඳ ෆිස්කල් ප්‍රතිපත්ති ආදී ග්‍රන්ථවල සමකර්තෘවරයෙකු ද වේ.

# ජ්‍යේෂ්ඨ කළමණාකාරීත්වය



**මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර**
*අධ්‍යක්ෂ ජනරාල්*
*අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු*
*(2013 මැයි 27 දින සේවා කාලය අවසන් කරන ලදී)*



**ධම්මික පෙරේරා මහතා**
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්*
*අධ්‍යක්ෂ විමර්ශන කටයුතු*



**වජිර විජේගුණවර්ධන මහතා**
*අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන කටයුතු*



**නාමල් කමල්ගොඩ මහතා**
*අධ්‍යක්ෂ ආවේක්ෂණ කටයුතු*



**තුෂාර ජයරත්න මහතා**
*සහකාර අධ්‍යක්ෂ බාහිර සම්බන්ධතා සහ වෙළෙඳපොළ සංවර්ධන*



**අයන්ති ජයරත්න මෙනවිය**
*අධ්‍යක්ෂ මුදල් සහ පරිපාලන*



**සුරනා ප්‍රනාන්දු මෙනවිය**
*අධ්‍යක්ෂ අධීක්ෂණ කටයුතු*



**අයන්ති අබේවික්‍රම මහත්මිය**
*අධ්‍යක්ෂ නීති සහ බලාත්මක කිරීම්*



**හිමානි වීරසේකර මෙනවිය**
*සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ කටයුතු*



**රුවනි මුණසිංහ**
*සහකාර අධ්‍යක්ෂ සාංගමික කටයුතු*

# කළමණාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය

## කළමණාකාරීත්වය



**වමේ සිට:** මධුගයනි බලපිටිය මෙනවිය, සුනෙත් පෙරේරා මහතා, රත්මිණී ජයතිලක මහත්මිය, ෂර්මිලා පණ්ඩිතරත්න මෙනවිය

## කාර්ය මණ්ඩලය



**වමේ සිට:** අනුර පෙරේරා මහතා, බුද්ධිනී හේරත් මෙනවිය, නිසංසලා හේරත් මහත්මිය, ධනේෂා රාජපුර මහත්මිය, ලක්ෂ්මි වික්‍රමනායක මහත්මිය, ෂලිනි පෙරේරා මෙනවිය, රුවන්ගනී ගුණරත්න මෙනවිය, රනිත්‍රි මොල්ලිගොඩ මෙනවිය, තක්ෂිලා ෆ්‍රැන්සිස් මහත්මිය, අශෝකා කේ. දයාරත්න මහත්මිය, ඩබ්. ආරියරත්න මහතා



**වමේ සිට:** සිතාරා තිසේරා මහත්මිය, එස්. ඩී. ධර්මසිරි මහතා, එරන්දතී විද්‍යාසේකර මහත්මිය, එච්. කේ. ඒ. චමරි බුද්ධිකා මහත්මිය, බිම්බා ගමඇතිගේ මහත්මිය, සුගත් අල්විස් මහතා, මන්ජුලා චන්ද්‍රරත්න මහත්මිය, ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රිගේ මහත්මිය, ප්‍රියන්ත හේරත් මහතා, ක්‍රිස්ටෝබල් සිල්වා මෙනවිය, වයි. ඩී. සඳමාලි මෙනවිය



**වමේ සිට:** මහේෂ් අබේසේකර මහතා, නුආලා දේවදාසන් මෙනවිය, ජේ. කේ. ප්‍රියදර්ශිනි මහත්මිය, ලක්ෂ්මි අතපත්තු මෙනවිය, එම්. එම්. එස්. මලීහා මහත්මිය, අනුලා විජේසිංහ මහත්මිය, පැතුම් නිරෝෂන මහතා, ලුෂාන්තිනි සිවනේසරාජා මෙනවිය, ඇන්ස්ලම් ඩයස් මහතා, රබිත බණ්ඩාර මහතා



**වමේ සිට:** පී. එම්. නිරෝෂිකා උදයංගනි මෙනවිය, සඳරුවන් විජේරත්න මහතා, ජී. ඩී. කපිල කුමාර මහතා, ෂීනා ගුණරත්න මෙනවිය, ඈන් ක්‍රිෂාන්ති මෙනවිය, ජැන්සිනිදේවී කුහනේසන් මහත්මිය, ප්‍රභාෂිනි සමරකෝන් මහත්මිය, නිශෝකා ජයතුංග මහත්මිය, එම්. එම්. ඒ ඉම්රාන් මහතා, රජ්මි මනතුංග මෙනවිය, ඩී. එම්. පී. ප්‍රියන්ත මහතා



**වමේ සිට:** එම්. ජයසේකර මහතා, ආර්. කේ. ඩබ්. සුනිමල් මහතා, මේබලා ජයපාල මෙනවිය, නිමල් කුමාරසිංහ මහතා, ප්‍රතිභානි හේරත් මහත්මිය, චමරි එරන්ගා මන්ත්‍රීරත්න මහත්මිය, ගයත්‍රී වීරසිංහ මහත්මිය, ජොයෙලින් කරුණාරත්න මහත්මිය, ජූලී අලෙගකෝන් මහත්මිය, සෞමී කොඩිප්පිලි මහත්මිය, සුහදිනි වික්‍රමසිංහ මෙනවිය, චන්ද්‍රන් නාගේන්ද්‍රන් මහතා, අයේෂිනී බණ්ඩාර මහත්මිය

**නොපැමිණි:** සජීවනි බක්මීදෙනිය මහත්මිය, පී. ඩබ් එල් පියතිස්ස මහතා, පී. ඩී. පත්මරාණි මහත්මිය, කුමාරි සිරිවර්ධන

# සාර්ව ආර්ථික විවරණය

## ආර්ථික නිමැවුම

ලෝකයේ අනෙකුත් සමාන ආර්ථිකයන් හා සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීය හා දේශීය අභියෝග කිහිපයක් මධ්‍යයේ 2012 වර්ෂය තුළ සැළකිය යුතු මට්ටමක යහපත් තත්ත්වයක් පෙන්වීය. පසුබෑම් මධ්‍යයේ දී වුවද පෙන්වුවද සමස්ත දළ දේශීය නිෂ්පාදනය 6.4% ක යහපත් වර්ධනයක් පෙන්වමින් ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 2,923 ක් දක්වා ඉහළ නැංවීමට සමත් විය. ප්‍රාග්ධන වෙළෙඳපොළ ද ඇතුළත් සේවා අංශයේ නිමැවුම සමස්ත ආර්ථික නිමැවුමට 58.5% ක දායකත්වයක් සැපයූ අතර, 2012 මහ බැංකු වාර්තාවට අනුව 4.6% ක වර්ධනයක් පෙන්වීය. කර්මාන්ත හා කෘෂිකාර්මික අංශය පිළිවෙලින් 10.3% කින් හා 5.8% කින් වර්ධනය වූ අතර, 2011 වසර හා සැසඳීමේ දී 2012 වසරේ දී 29.3% සිට 30.4% ක වර්ධනයක් කර්මාන්ත අංශයෙන් දායකත්වයක් ලබා දී ඇත.

දේශීය පොළී අනුපාත ඉහළ යාමත්, පාවෙන විනිමය අනුපාත තත්ත්වයත් නිසා රුපියලේ අගය පහළ ගිය අතර, වසර ආරම්භයත් සමඟ කොළඹ කොටස් වෙළෙඳපොළට අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදු විය. සමස්ත යටිතල පහසුකම් ආයෝජනය හා පෞද්ගලික අංශයේ ආයෝජනයන් ප්‍රධාන වශයෙන් සංචාරක හා හෝටල් කර්මාන්තය සඳහා යෙදවීම නිසා දේශීය අරමුදල් ඉල්ලුම තව දුරටත් ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද මෙහිදී සඳහන් කළ යුතුම කරුණක් වනුයේ 2012 වසරේ දී එක්සත් ජනපද ඩොලරය මුල් කර ගත් දිගුකාලීන බැඳුම්කර කිහිපයක්, ශ්‍රී ලංකා රජය මීට පෙර නිකුත් කළ බැඳුම්කරවලට වඩා අඩු පොළී අනුපාතිකයක් යටතේ නිකුත් කිරීමට හැකියාව ලැබීමයි. සාපේක්ෂව අඩු වියදමක් යටතේ උත්පාදනය කර ගත් විදේශීය අරමුදල්වල සහයෙන් දේශීය පොළී අනුපාත තව දුරටත් ඉහළ යාම වළක්වා ගැනීමට සමත් වුණු අතර, සමස්ත ආර්ථිකය කැපී පෙනෙන වර්ධනයක් ලඟා කර ගැනීමට ද හැකි විය. මෙම ධනාත්මක වර්ධනයන්වලට ආයෝජකයන් සතුටුදායක ලෙස ප්‍රතිචාර දැක්වූ අතර, කොටස් වෙළෙඳපොළ තුළ ශුද්ධ විදේශීය ගලා ඒම් රුපියල් බිලියන 38.6 ක් වාර්තා වූ අතර, සමස්ත වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 2167.6 ක් ලෙස වාර්තා විය. එය 2012 වසර අවසානයේ දී වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් 29% ක් විය.

## උද්ධමනය, විනිමය අනුපාත, පොළී අනුපාත හා ණය

ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය, ලෝක බොරතෙල් මිල උච්චාවචනය, සෘතුමය නියඟයේ බලපෑම නිසා කෘෂිකාර්මික නිෂ්පාදනවලට හා ජල විදුලි නිෂ්පාදනවලට බලපෑම් ඇතිවීම ආදී තත්ත්වයන් මධ්‍යයේ දී වුවද ප්‍රතිපත්ති සම්පාදකයින්ට උද්ධමනය තනි ඉලක්කමක පවත්වා ගැනීමට හැකි විය. විනිමය අනුපාතය 2011 වසර අවසානයේ සිට ම පීඩනයට ලක් වූ අතර, එක් දිනක් ඇතුළත මුදල අවප්‍රමාණය කිරීමට ද සිදු විය.

තවද වෙළෙඳ හිඟය පුළුල්වීම හේතුවෙන් රුපියල තව දුරටත් ආරක්ෂා කිරීමෙන් වැලකීමට මහ බැංකුවට සිදු විය. යම් දුරකට නොසන්සුන්කාරී තත්ත්වයක් පැවතීම හේතුවෙන්, විනිමය විකිණීමට සිදු වූ නමුත්, විනිමය වෙළෙඳපොළේ ස්ථාවරත්වයක් අත්පත් කර ගැනීමට හැකි විය. මෙම තත්ත්වය මධ්‍යයේ රුපියලේ අගය ඉතා සුළු ප්‍රමාණයකින් ඉහළ ගියද පසුගිය වසර හා සසඳන විට 13.3% කින් පිරිහීමට ලක් විය. පාලකයින් විසින් නිසි පියවර හඳුන්වාදීම හේතුවෙන් 2012 වසරේ වෙළෙඳ හිඟය 3.1% ක් දක්වා පහත වැටෙමින් ආර්ථිකය නැවත යථා තත්වයට පත් විය.

තවද මහා බැංකු වාර්තාවට අනුව සංචාරක ඉපැයුම් 25.1% කින්ද ප්‍රවාහන සේවා 17.4% කින්ද වර්ධනය වූ අතර වසර තුළ සේවා අංශයෙන් ලද විදේශ විනිමය 13.8% කින් වර්ධනය වීමට හේතු විය. සේවා අංශයෙන් ලද ආදායම හා විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රේෂණ ආදායමේ 16.3%ක වර්ධනය හේතු කොට ගෙන වර්තන ගිණුමේ හිඟය 15.3% කින් අඩුකර ගැනීමට හැකිවිය. එමෙන්ම විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වාගැනීමටද හැකි විය.

මහ බැංකුව අනුගමනය කල දැඩි මුල්‍ය ප්‍රතිපත්තිය නිසා 2011 වසරේදී පැවති අමතර ණය ප්‍රසාරනය මෙන්ම අමතර ද්‍රවශීලතාවයද අවම කර ගැනීමට හැකිවිය. මෙම ප්‍රතිපත්තිය උද්ධමන පීඩනය අවම කර ගැනීමටත් සමස්ථ ආර්ථික වර්ධනය සමබර මට්ටමක පවත්වා ගැනීමටද හැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ පොළී අනුපාත ඉහළ මට්ටමක පැවති අතර කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු වලටද එය බලපාන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජකයන් කොටස් ආයෝජනයෙන් ඈත් වී ඉහල ප්‍රතිලාභ සහිත ස්ථාවර ආදායම් සුරැකුම්පත් උපකරණ වෙත යොමු විය. මේ නිසා කොළඹ කොටස් වෙළෙඳපෙළ ගණුදෙනු කටයුතු වල තියුනු පසු බැසීමක් දැකගත හැකි වූ අතර මුළු පිරිවැටමේ වටිනාකම 60.8% කින් පහළ වැටුණු අතර එය ශ්‍රී ලංකා රුපියල් බිලියන 213.8 ක් විය.

## රාජ්‍ය මූල්‍ය, ආයෝජනය හා අයවැය හිඟය

දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හා පරිභෝජනය මුල් කොටගත් ආනයනවල අඩුවීම හේතු කොට ගෙන 2012 රාජ්‍ය ආදායම 2011 තුළ ලැබූ රාජ්‍ය ආදායම හා සසඳන විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් 14.3% සිට 13.0% දක්වා පහත වැටී ඇත. රාජ්‍ය ආදායමේ පහළ වැටීමක් දක්නට ලැබුණ ද දිගුකාලීන ආර්ථික වර්ධනයට අවශ්‍ය වන්නා වූ ආයෝජනවල කප්පාදු කිරීමත් දක්නට නොලැබිණි. මෙම ආයෝජන අතර මහා මාර්ග හා අධිවේගී මාර්ග ජාලය, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධනය ප්‍රමුඛස්ථානයක් ගනු ලැබේ. මේ අනුව 2012 වසරේ දී සමස්ත ආයෝජනය ඉහළ ගොස් ඇති අතර, පෙර වසරට වඩා වැඩිවීම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 30% සිට 30.6% දක්වා වර්ධනය විය.

රාජ්‍ය ආදායමේ අඩුවීම මධ්‍යයේ වුව ද 2012 වසරේ දී ෆිස්කල් තත්ත්වය කැපී පෙනෙන ලෙස වර්ධනය විය. සමස්ත ෆිස්කල් හිඟය 2012 වසර තුළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් 6.4% දක්වා අඩු විය. නානාවිධ අභියෝග හමුවේ ෆිස්කල් හිඟය අඩුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණ ද රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් 79.1% දක්වා 2012 තුළ වර්ධනය විය. ආයෝජන වියදම ඉහළ යාම හා මන්දගාමී ආර්ථික වර්ධනය රාජ්‍ය ණය ඉහළ යාමට හේතු වශයෙන් දැක්විය හැක.

ධනාත්මක ආර්ථික තත්වයන් පෙන්නුම් කරමින් දේශීය ඉතුරුම් 2012 වසර තුළ 27.6% කින් වර්ධනය වී ශ්‍රී ලංකා රුපියල් බිලියන 1,286.5 වශයෙන් සටහන් විය. එය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් 17% ක් විය. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණයන් ඉහළ යාම හේතු කොට ගෙන ජාතික ඉතුරුම් 2011 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. 2011 වසර තුළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 22% වූ ජාතික ඉතුරුම් 2012 වසරේ දී 24% දක්වා වර්ධනය විය.

මෙම ප්‍රවණතාව තව දුරටත් පවත්වාගෙන යාම ආර්ථික වර්ධනයට රුකුලක් වනු ඇත. මන්ද යත් මෙම සුභදායී ප්‍රවණතාවය ජාතික ඉතුරුම් - ආයෝජන පරතරය අඩු කිරීමට දායක වනු ඇත. 2011 වසරේ දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 7.9% වූ ඉතුරුම් ආයෝජන පරතරය 2012 වසරේ දී 6.6% දක්වා පහළ වැටිණි.

### සමාප්ත සටහන

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති නිසියාකාරව කළමනාකරණය කොට යටිතල පහසුකම් පෞද්ගලික අංශයේ උපරිම දායකත්වය (ආර්ථික වර්ධනයට) ලැබෙන අයුරින් ස්ථානගත කරන්නෙහි නම් ඉදිරි වසර කිහිපය තුළ ආර්ථික වර්ධනයක් හා ඉහළ ජීවන තත්ත්වයක් අපේක්ෂා කළ හැක. රාජ්‍ය කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරවල ආර්ථික නිමැවුම් ඉහළ නැංවීමට නිසි පියවර ගෙන ඇත. මීට ඒකාබද්ධව සියලු ව්‍යාපාර හා මහා පරිමාණ ව්‍යාපාර බලගැන්වීම රටේ ආර්ථිකය තව දුරටත් වර්ධනය කිරීමට රුකුල් වනු ඇත. මීට අමතරව, රටේ ආර්ථිකය වර්ධනය විවිධාංගීකරණය ජාතික ඉතුරුම් හා දිනෙන් දින පුළුල් වන්නා වූ ඉතුරුම් හා ආයෝජන උපකරණ මත ගොඩනැගිය යුතුය. තවද ඉතුරුම් / ආයෝජන ඉහළ නැංවීමෙන් ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමේ දොරටුවක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ හඳුන්වා දිය හැක.

*මූලාශ්‍ර ඃ මහ බැංකු වාර්තාව 2012*

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය

## කොටස් වෙළෙඳපොළ

ශ්‍රී ලංකා පශ්චාද් යුධකාලීන වාතාවරණය තුළ එක් සිත් ගන්නා සුළු ආධාරකයක් වූයේ එහි කොටස් වෙළෙඳපොළ ශක්තිමත් වීමයි. 2012 වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ සමහර උච්චාවචනයන්ට මුහුණ දුන් අතර, එය ගෝලීය හා දේශීය සාධකවල බලපෑම් මගින් පිළිබිඹු වේ. (රූප සටහන 01)

*රූප සටහන 01* **: සියළු කොටස් මිල දර්ශකය, මිලංක මිල දර්ශකය හා S & P ශ්‍රී ලංකා 20 දර්ශකය**




තම ගණුදෙනුකරුවන් සඳහා ලබා දෙන ණය පිළිබඳ නීති ලිහිල් කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත් තීරණය දෙස කොටස් තැරැව්කාර ප්‍රජාව අපේක්ෂා සහගතව බැලූ අතර, 2012 වසර සර්ව සුභවාදී අයුරින් ආරම්භ විය.

ස්ථාවර විනිමය අනුපාතිකයක සිට පාලනය කළ විනිමය අනුපාතිකයකට මාරුවීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගත් තීරණය මගින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මූලික වෙනසක් පෙන්නුම් කරන ලදී. රුපියල තියුණු ලෙස අවප්‍රමාණයවීමත් මෙන්ම බොහෝ අංශවල වාර්ෂික ඉපයුම්වල වර්ධනයේ පහළ යාමත් නිසා ආයෝජකයන් බලාපොරොත්තු හීන කරමින් වෙළෙඳපොළ ඒකක 5000 මට්ටමටත් වඩා පහළ යාමක් මැයි මස අවසානයේ දී පෙන්නුම් කරන ලදී. වසර තුළ සියලු කොටස් මිල දර්ශකයට වූ සමස්ත බලපෑම මැයි මස අවසානය වන විට සෘණ අගයක් වූ අතර, ප්‍රතිශතයක් ලෙස 20% ක් විය.

කොමිෂන් සභාව දැඩි නියාමන කටයුතු මාලාවක් හා වෙළෙඳපොළ අභ්‍යන්තරිකයන් සඳහා ඉතා දැඩි ගණුදෙනු නීති හඳුන්වාදීමත් නිසා වෙළෙඳපොළ ද සෘණාත්මක ප්‍රතිචාර දක්වන ලදී. කොමිෂන් සභාවට මෙම නියාමන මාලාවක් හඳුන්වා දීමට සිදු වූයේ, මිලදී ගැනීම් සඳහා ගෙවීම් නිසි කල සිදු කිරීමට කස්ටෝඩියල් සේවා සපයන්නෙකු අපොහොසත් වීම නිසා එම කස්ටෝඩියල් සේවා සපයන්නා කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් තාවකාලික අත්හිටුවීමක් පැනවීමෙන් පසුව ය. විශේෂයෙන්ම ගණුදෙනු සමථ කිරීමේ චක්‍රයට අදාළව, ගෙවීම් කළ පසු ගණුදෙනු ඉටු කිරීමේ (DVP) පරිපූර්ණ ක්‍රමයක් ස්ථාපිත කරන තුරු නිසි ලෙස ක්‍රියාත්මක වන ප්‍රාග 'ධන වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා යම් යම් තාවකාලික උපක්‍රම හඳුන්වාදීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත බල කෙරුණි.

ඉහළ පොළී අනුපාත තත්ත්වයන් හේතුවෙන් වෙළෙඳපොළ පහළ යාම ජූනි මස දී අඛණ්ඩව තව දුරටත් සිදු වූ අතර, අධික ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා එසේ පොළී අනුපාත ඉහළින් තබන ලදී. කොටස් වෙළෙඳපොළ හා සංසන්දනය කිරීමේ දී කාලීන තැන්පතු හා ණයකර යනාදී ස්ථාවර ආදායම් උපකරණ සුළු පරිමාණ ආයෝජකයන් අතර බෙහෙවින් ජනප්‍රිය වූ අතර, ඉහළ ප්‍රතිලාභ ද අත් කර දෙන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළ වසරේ පළමු හා දෙවන කාර්තුවේ දී වටිනාකම පහළ යන ලදී.

තෙවන කාර්තුව ආරම්භයත් සමඟ ආර්ථික වර්ධනය වේගවත් වූ අතර, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ධනාත්මක ආකල්පය හා එක්සත් ජනපද ඩොලර් බිලියන 2.5 ක ණය ආධාර මුදලේ අවසාන කොටස නිදහස් කිරීමත් ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. වසරේ තෙවන කාර්තුව තුළ විශේෂත්වයක් වූයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පනවා තිබූ සමහර නියාමනයන් තව දුරටත් ලිහිල් කිරීමයි. තැරැව්කාර ආයතන මත පැන වූ ණය සීමා ලිහිල් කිරීම, වෙළෙඳපොළෙන් පිටත සිදුවන ගණුදෙනුවල ඉහළ මිල සීමාව 20% ක් දක්වා ලිහිල් කිරීම හා තැරැව්කාර සමාගම්වල අධ්‍යක්ෂවරුන් හා සේවකයන් මිල දී ගන්නා කොටස් මාස 6 ක් තුළ විකිණීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම එම සමහර නියාමනයන්ට අයත් විය. වෙළෙඳපොළ පහළ බැසීමත් සමඟ වෙළෙඳපොළ වටිනාකම වඩාත් ආකර්ශනීය වූ අතර, එය විදේශීය සහභාගීත්වය ඉහළ නැංවීමට ද ඉවහල් විය. මෙම සංවර්ධනයන් සමඟ 2012 සැප්තැම්බර් මස අවසානයේ දී සියලු කොටස් මිල දර්ශකයේ වාර්ෂික ඉහළම අගය වූ ඒකක 5971.99 ක අඛණ්ඩ ඉහළ නැගීමක් පෙන්නුම් කළේය.

අවසාන කාර්තුව තුළ රජය විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළට හිතකර අයවැයක් ඉදිරිපත් කළ අතර, කොළඹ කොටස් වෙළෙඳපොළ එම අයවැයට ධනාත්මක ප්‍රතිචාර දැක්වීමක් දැකගත හැකි විය. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා එම අයවැයෙන් සහන රැසක්ම ලබා දෙන ලදී.

## වෙළෙඳපොළ දර්ශකවල කාර්ය සාධනය

වසර තුළ මිලංක මිල දර්ශකයේ ගණනය කිරීම්වලට අනුව කොටස් වෙළෙඳපොළ 2% ක පහළ වැටීමක් පෙන්වූ අතර, සියලු කොටස් මිල දර්ශකය 7% කින් පහළ වැටුණි. සියලු කොටස් මිල දර්ශකය වසර ආරම්භයත් සමඟ ඒකක 6074.42 ක් පෙන්නුම් කළ අතර, වසර අවසානයේ දී ඒකක 5,643 ක් ලෙස වාර්තා විය. එමෙන්ම මිලංක මිල දර්ශකය ඒකක 5,229.16 ක අගයක් වසර ආරම්භයේ දී පෙන්නුම් කළ ද වසර අවසානයේ දී ඒකක 5,119.09 ක් ලෙස සටහන් විය. 2012 ජුනි මස දී ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් දර්ශකයත් S & P ශ්‍රී ලංකා 20 දර්ශකය ගණනය කිරීම ආරම්භ කරන ලද අතර, එය කොළඹ කොටස් හුවමාරුව සමඟ කළ ඒකාබද්ධ උත්සහයකි. මෙම දර්ශකය ගොඩනගන ලද්දේ කොළඹ කොටස් හුවමාරුවේ ඇති ද්‍රවශීල හා ගණුදෙනු කළ හැකි කොටස් නිරූපනය කිරීම සඳහායි.

## වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය හා මිල ඉපයුම්

දළ දේශීය නිෂ්පාදනයට වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණ අනුපාතය රටක කොටස් වෙළෙඳපොළ අගය කිරීම සඳහා ඉතා වැදගත් මිනුම් දණ්ඩකි. 2011 වසරේ අවසානයේ දී පැවති වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය බිලියන 2,213.9 ක අගය හා සංසන්දනය කිරීමේ දී 2012 වසරේ දෙසැම්බර්වල එම අගය බිලියන 2,167.5 ක් ලෙස පහළ වැටීමක් පෙන්නුම් කළේය. 2012 වසර අග දී වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය දළ දේශීය නිෂ්පාදනයෙන් 29% වූ අතර, 2011 වසර අග දී එය 33.8% ක අගයක් ගන්නා ලදී.

කොටස්වල වටිනාකම මිල ඉපයුම් අනුපාතිකය විසින් තක්සේරු කර තිබුණි. වසර තුළ පැවති තත්ත්වයන් සලකා බැලීමේ දී සාපේක්ෂව පහළ කොටස් මිල නිසා 2012 වසර අග දී මිල ඉපයුම් අනුපාතය 15.9 වාරයකින් පහළ වැටීමක් පෙන්නුම් කළ අතර, එය 2011 සමඟ සංසන්දනය කිරීමේ දී 15.8 ගුණයක් ලෙස සටහන් විය. පසුගිය වසර පුරා මිල ඉපයුම් අනුපාතය පහළ අගයක් ගත්ත ද අනෙකුත් නැගී එන වෙළෙඳපොළ සමඟ සංසන්දනය කිරීමේ දී තවමත් ඉහළ මට්ටමක පවතී.

## ප්‍රාථමික වෙළෙඳපොළ හා නව ලැයිස්තුගතවීම්

මූලික ප්‍රසිද්ධ නිකුතුන් හා හඳුන්වාදීම් මගින් රැස් කර ගත් අරමුදල් ප්‍රමාණය පෙර වසර හා සංසන්දනය කිරීමේ දී 2012 වර්ෂය තුළ බොහෝ දුරට පහළ අගයක පැවතුණි. 2012 වර්ෂය තුළ කොළඹ කොටස් හුවමාරුවේ මූලික ප්‍රසිද්ධ නිකුතුන් 6 ක් දැකගත හැකි වූ අතර, එම සමාගම් සංචාරක, ඉදිකිරීම්, බලශක්ති හා මූල්‍ය සේවා යන අංශයන් නියෝජනය කරමින් රු. බිලියන 1.7 ක් උපයා ගන්නා ලදී. ඊට අමතරව හඳුන්වාදීමක් මගින් සමාගම් 11 ක් වර්ෂය තුළ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත විය.

මෙම වසර තුළ කොළඹ කොටස් හුවමාරුව තුළ ලැයිස්තුගත කරන සමාගම් සංඛ්‍යාව ඉහළ නැංවීමට උත්සාහ දරන ලදී. එය 2013 අයවැය යෝජනා තුළට ද ඇතුළත් කරමින් 2013 දෙසැම්බර්වලට පෙර ලැයිස්තුගත වන අවම වශයෙන් 20% ක කොටස් ප්‍රමාණයක් මහජනතාව සතුව පවත්වාගෙන යන නව සමාගම් සඳහා වසර 3ක අර්ධ බදු නිදහස් කිරීමක් ලබා දෙන ලදී. මෙවැනි වෙනස්වීම් ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළේ ද්‍රවශීලතාවය ඉහළ නැංවීමටත්, උච්ඡාවචනය අඩු කිරීමටත් උපකාරී වේ. එමෙන්ම 2013 වර්ෂය තුළ රාජ්‍ය ව්‍යාපාර කිහිපයක් ද ලැයිස්තුගත කිරීමට බලාපොරොත්තු වේ. (සංඛ්‍යා සටහන් 01,02)

*සංඛ්‍යා සටහන 01:* **නව ලැයිස්තුගත කිරීම්**

| සමාගමේ නම | නිකුත් කළ කොටස් ප්‍රමාණය | නිකුතු මිල | රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු.මි.) | ලැයිස්තුගත වූ දිනය |
|---|---|---|---|---|
| කල්පිටිය බීච් රිසෝට් පී එල් සී | 16,200,000 | 17.50 | 283.50 | 2012 ජනවාරි 03 |
| වස්කඩුව බීච් රිසෝට් පී එල් සී | 15,600,000 | 12.50 | 195.00 | 2012 ජනවාරි 03 |
| ඒෂියා ඇසෙට් ෆයිනෑන්ස් ලිමිටඩ් | 170,160,129 | 2.50 | 295.70 | 2012 ජනවාරි 12 |
| ඇක්සස් ඉංජිනියරිං පී එල් සී | 20,000,000 | 25.00 | 500.00 | 2012 මාර්තු 27 |
| මැක්වුඩ්ස් එනර්ජි පී එල් සී | 25,000,000 | 14.00 | 350.00 | 2012 අප්‍රේල් 25 |
| හික්කඩුව බීච් රිසෝට් ලිමිටඩ් | 5,757,390 | 20.00 | 115.10 | 2012 දෙසැම්බර් 17 |
| එකතුව | | | 1,739.3 | |

*සංඛ්‍යා සටහන 02:* **හඳුන්වාදීමක් මගින් නව ලැයිස්තුගත වීම්**

| සමාගමේ නම | ලැයිස්තුගත දිනය | සමාගමේ නම | ලැයිස්තුගත දිනය |
|---|---|---|---|
| පී සී පාර්මා පී එල් සී | 2012 ජනවාරි 18 | පී සී එච් හෝල්ඩිංග්ස් ලිමිටඩ් | 2012 ජුනි 28 |
| ඇග්ස්ටා ෆර්ටිලයිසර්ස් පී එල් සී (ඡන්ද බලය සහිත) | 2012 පෙබරවාරි 16 | ඔරියන්ට් ෆයිනෑන්ස් | 2012 ජුනි 7 |
| ඇග්ස්ටා ෆර්ටිලයිසර්ස් පී එල් සී (ඡන්ද බලය රහිත) | 2012 පෙබරවාරි 16 | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී | 2012 ජුනි 5 |
| සණස ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී | 2012 මැයි 31 | බේරුවල රිසෝර්ට් පී එල් සී | 2012 ජුනි 4 |
| තැප්‍රොබේන් හෝල්ඩිංග්ස් ලිමිටඩ් | 2012 මැයි 17 | ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් පී එල් සී | 2012 සැප්තැම්බර් 12 |
| රම්බොඩ ෆෝල්ස් ලිමිටඩ් | 2012 ජුනි 18 | ඒෂියා සියාකා කොමොඩිටීස් ලිමිටඩ් | 2012 සැප්තැම්බර් 12 |

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාලෝචනය

### ද්විතියික වෙළෙඳපොළ ක්‍රියාකාරකම්

2012 වර්ෂය තුළ කොටස් මිල ගණන් පහළ යාමත් සමඟ වාර්ෂික පිරිවැටුම හා ගණුදෙනු සංඛ්‍යාව සැලකිය යුතු පහළ යාමක් පෙන්නුම් කළේය. සාපේක්ෂව සලකා බැලීමේ දී පහළ ක්‍රියාකාරී මට්ටමක් 2012 වර්ෂය තුළ දැකගත හැකි වූ අතර, දෛනික සාමාන්‍ය මුළු පිරිවැටුම රුපියල් මිලියන 884 ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස 61% ක පහල යාමකි. එහෙත් 2011 වර්ෂය තුළ දෛනික සාමාන්‍ය මුළු පිරිවැටුම රුපියල් මිලියන 2,286 ක් වාර්තා කර තිබිණ. බිලියන 213.8 ක් වූ සමස්ත කොටස් පිරිවැටුමට 75% ක් දායකත්වය ලබා දී තිබුණේ දේශීය ආයෝජකයන් වන අතර, විදේශීය සහභාගීත්වය 25% කි. 2012 තුළ දෛනික සාමාන්‍ය ගණුදෙනු සංඛ්‍යාව 7,675 ක් වූ අතර, පෙර වසර හා සංසන්දනය කිරීමේ දී සිදු කරනු ලැබූ ගණුදෙනු සංඛ්‍යාව 60% කින් පහල බැස්ස අතර එනම් 2011 වසරේ දෛනික සාමාන්‍ය ගනුදෙනු සංඛ්‍යාව 19,160 ක් පෙන්නුම් කළේය. වසර තුළ සිදු කළ නිරීක්ෂණයන්ට අනුව කොටස් හිමිකාරීත්වය වෙනස්වීමේ (අතින් අත හුවමාරුවීමේ) දෛනික සාමාන්‍ය මිලියන 40 ක් වූ අතර, පෙර වසරේ දී කොටස් මිලියන 103 ක දෛනික සාමාන්‍යයක් පෙන්නුම් කළේය.

### විදේශීය සහභාගීත්වය

ශ්‍රී ලංකා රුපියල ස්ථාවරත්වයත් සමඟ වසරේ අග භාගයේ දී විදේශීය සහභාගීත්වයේ සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. වෙළෙඳපොළ පිරිවැටුමෙන් 25% ක් සඳහා විදේශීය ආයෝජකයන් දායකත්වයක් ලබා දෙන ලදී. 2011 තුළ එම අගය 11% කි. කොළඹ කොටස් වෙළෙඳපොළ වාර්තා වූ අයුරින් වසර තුළ විදේශීය ගලා ඒම් ඇ.ඩො.මිලියන 303.8 ක් වූ අතර, ආසන්න වශයෙන් රු. බිලියන 38.7 කි. (රූප සටහන 02)

*රූප සටහන 02:* ශුද්ධ විදේශ ගලා ඒම්




### ආංශික කාර්ය සාධනය

2011 පෙර වසර හා සංසන්දනය කිරීමේ දී 2012 වර්ෂය තුළ කැපී පෙනෙන කාර්ය සාධනයක් පෙන්නුම් කළ ව්‍යාපාර ක්ෂේත්‍රය වූයේ බීම, ආහාර හා දුම්කොළ අංශය වන අතර, එය 31% ක වර්ධනයකි. කෙසේ වුවද කොළඹ කොටස් හුවමාරුවේ ඉතිරි ව්‍යාපාර ක්ෂේත්‍ර 19 ම සෘණ වර්ධනයක් වාර්තා කළේය. අවම කාර්ය සාධනයක් සහිත ව්‍යාපාර ක්ෂේත්‍රයන් වූයේ තොරතුරු තාක්ෂණ හා මෝටර්ස් වන අතර, ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 53% ක් හා 42% ක සෘණ වර්ධනයක් එකී ක්ෂේත්‍රයන් වාර්තා කරන ලදී.

### ඒකක භාර

2012 දෙසැම්බර් 31 විට ඒකක භාර අරමුදල්වල ශුද්ධ වත්කම් වටිනාකම රු. බිලියන (ආසන්න වශයෙන්) 31 ක් විය. ශුද්ධ වත්කකම් වටිනාකම අනුව එක් එක් ඒකක භාර කළමනාකරණ සමාගම්වල 2012 වසරේ දී වෙළෙඳපොළ කොටස පහත රූප සටහනෙන් පිළිබිඹු වේ. (රූප සටහන 03)

*රූප සටහන 03:* 2012 දෙසැම්බර් 31 වන විට ඒකක භාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස



| | |
|---|---|
| නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 14% |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 23% |
| හෑරී අවීවා වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | 39% |
| කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2% |
| සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2% |
| ඇසට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 2% |
| ජේ බී ෆයිනෑන්ෂල් (පුද්ගලික) සමාගම | 9% |
| ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 2% |
| ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 1.02% |
| ආර්පිකෝ අටරක්ෂියා ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | .24% |
| ඔරියන්ට් වෙල්ත් ලිමිටඩ් | .36% |
| කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | 2% |
| හෙරෙම්ලා කැපිටල් (පුද්ගලික) සමාගම | 4% |

## ඒකක භාර අරමුදල්වල සමස්ත තත්ත්වය

2012 සහ 2011 යන වර්ෂ තුළ ඒකක භාර අරමුදල්වල කාර්යසාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යා දත්ත පහත වගුවෙහි දැක්වේ. (සංඛ්‍යා සටහන 03)

*සංඛ්‍යා සටහන 03:* **ඒකකභාර අරමුදල් වල සමස්ත තත්වය**

| | 2011 දෙසැම්බර් 31 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට | වෙනස (%) |
|---|---|---|---|
| ඒකක භාර සංඛ්‍යාව | 33 | **48** | 45.45 |
| ශුද්ධ වත්කම් වටිනාකම (ආසන්න වශයෙන් රු.මි.) | 24,059 | **31,062** | 29.10 |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 26,636 | **27,952** | 4.94 |
| නිකුත් කළ ඒකක සංඛ්‍යාව (ආසන්න වශයෙන් මිලියන) | 1,506 | **2,251** | 49.47 |
| කොටස්වල ආයෝජනය (ආසන්න වශයෙන් රු.මි.) | 9,555 | **8,944** | (6.39) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය (ආසන්න වශයෙන් රු.මි.) | 10,326 | **5,449** | (47.23) |
| අනෙකුත් උපකරණවල ආයෝජනය (ආසන්න වශයෙන් රු.මි.) | 4,186 | **16,596** | 296.46 |

* *තොරතුරු - ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් නියාමනය වෙත භාර දෙනු ලැබූ දත්ත, වාණිජ පත්‍රිකා, භාර සහතික, ණයකර හා බැංකු තැන්පතු*

*මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළෙඳපොළ*

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

"යෝජිත සංශෝධනයන් හරහා යම් යම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ගයන්ට යටත්ව, අසමූහිකරණය කළ කොටස් හුවමාරු මධ්‍යස්ථාන, ව්‍යුත්පන්න හුවමාරු මධ්‍යස්ථාන, නිෂ්කාශන ආයතන සහ මධ්‍යම තැන්පතු ක්‍රමයන් සඳහා බලපත්‍ර ලබා දීම පිළිබඳවත් සාංගමික මූල්‍ය උපදේශකවරු, මූල්‍ය සැලසුම්කරුවන්, විශ්ලේෂකයන්, ව්‍යුත්පන්න ගණුදෙනු තැරැව්කරුවන් සහ ව්‍යුත්පන්න ගණුදෙනු වෙළෙඳුන් නියාමනය කිරීම සඳහාත් කොමිෂන් සභාවට නව බලතල ලබා දීමට නියමිත ය."

## නියාමනය

### බලපත්‍ර නිකුත් කිරීම සහ ලියාපදිංචි කිරීම

ප්‍රාග්ධන වෙළෙඳපොළ කටයුතුවල නිරත වන වෙළෙඳපොළ සහභාගිකරුවන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ප්‍රදානය කිරීමේ කටයුත්ත සිදු කරනු ලබන්නේ කොමිෂන් සභාව විසිනි. එසේ බලපත්‍ර නිකුත් කිරීම සහ ලියාපදිංචි කිරීම මගින් කොටස් වෙළෙඳපොළ පිළිබඳව සහ එහි කාර්යයන්වල නිරත වන වෙළෙඳපොළ සහභාගිකරුවන්ගේ හැකියාව පිළිබඳව ආයෝජකයන් තුළ විශ්වාසයක් ගොඩනැගේ. සලකා බලන වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් සිදු කළ ලියාපදිංචි කිරීම් සහ බලපත්‍ර නිකුත් කිරීම් පිළිබඳව තොරතුරු පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 04)

*සංඛ්‍යා සටහන 04:* **බලපත්‍ර නිකුත් කිරීම් සහ ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු**

| වෙළෙඳපොළ සහභාගිකරු | බලපත්‍රලාභී / ලියාපදිංචි කර ඇති මුළු ආයතන ප්‍රමාණය | 2012 වර්ෂයේ දී නිකුත් කළ බලපත්‍ර / ලියාපදිංචි කිරීම් ප්‍රමාණය |
|---|---|---|
| කොටස් වෙළෙඳපොළ | 01 | - |
| කොටස් තැරැව්කාර සමාගම් | 29 | - |
| කොටස් වෙළෙඳ සමාගම් | 06 | - |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 13 | **03** |
| ආයෝජන කළමනාකරුවන් | 35 | **08** |
| ආන්තික සැපයුම්කරුවන් | 33 | **01** |
| ප්‍රාරක්ෂකයින් | 11 | **02** |
| ණය ප්‍රමාණීකරණ ආයතන | 03 | - |
| නිෂ්කාශන ආයතන | 01 | - |

### ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්

සලකා බලන වර්ෂය තුළ දී ප්‍රාග්ධන වෙළෙඳපොළේ පවත්නා නීති රාමුව වඩා ශක්තිමත් කිරීම සඳහා පහත දක්වා ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කරන ලදී.

### පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා කළ සංශෝධනයන්

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරු ජනාධිපති නීතිඥ සලීම් මර්සූෆ් මහතා විසින් වත්මන් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා යෝජනා කරන ලද සංශෝධනයන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

කෙසේ වුව ද සලකා බලන වර්ෂය තුළ දී ඇති වූ නව ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කරමින්, සංග්‍රහය සඳහා අත්‍යවශ්‍යයෙන්ම සිදුවිය යුතු ඉතා වැදගත් නව සංශෝධනය කිහිපයක් සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනය කිරීම මේ වන විට සිදුවෙමින් පවතී.

නව පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය මගින් හඳුන්වා දෙන නව නීති රාමුවෙහි විශේෂතා අතරින් කිහිපයක් පහත පරිදි දැක්විය හැක.

- ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සමාගමක් හරහා වක්‍රාකාරව කරනු ලබන පවරා ගැනීම් නියාමනය කිරීම සඳහා අවශ්‍ය රීති හඳුන්වා දීම.
- සංග්‍රහය යටතේ පැන නගින ගැටලු සම්බන්ධ තීරණ ගැනීම සඳහා කොමිෂන් සභාවට නිර්දේශ සපයන උපදේශන මණ්ඩලයක් පිහිටවීම.
- පවරා ගන්නා පාර්ශවයන් සහ පවරා ගැනීමට යටත් වන සමාගම විසින් සංග්‍රහයේ දක්වා ඇති රීතීන්ට අනුකූලව කටයුතු කරන බවට වග කියනු ලබන සහ සහතික වන අනුකූලතා විගණකවරුන් පත් කිරීම; සහ
- යම් යම් විශේෂිත තත්ත්වයන් යටතේ අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීමෙන් නිදහස් වන ආකාරයෙන් යම් යම් සම්මතයන් (White Wash Resolutions) හඳුන්වා දීම.

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා වන සංශෝධනයන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් හඳුනා ගැනීම සඳහා ලෝක බැංකුවේ මූල්‍ය ප්‍රතිසංස්කරණ අංශය මගින් අපට අවශ්‍ය කරන සහාය ලබා දෙන ලදී. මෙරට ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් නීතිමය රාමුවක්, අන්තර් ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා සංවිධානයේ වර්තමාන ප්‍රමිතිකරණයන්ට අනුකූල වන ආකාරයෙන් සැකසීමට මේ තුළින් අපට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

එහි මූලික සාකච්ඡා වටය 2011 ජූනි මස ඇරඹුණු අතර, 2012 දෙසැම්බර් මස එම සාකච්ඡා වටය අවසන් කරන ලදී.

යෝජිත සංශෝධනයන් හරහා යම් යම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ග යන්ට යටත්ව, අසමූහිකරණය කළ කොටස් හුවමාරු මධ්‍යස්ථාන, ව්‍යුත්පන්න හුවමාරු මධ්‍යස්ථාන, නිෂ්කාශන ආයතන සහ මධ්‍යම තැන්පතු ක්‍රමයන් සඳහා බලපත්‍ර ලබා දීම පිළිබඳවත් සාංගමික මූල්‍ය උපදේශකවරු, මූල්‍ය සැලසුම්කරුවන්, විශ්ලේෂකයන්, ව්‍යුත්පන්න ගණුදෙනු තැරැව්කරුවන් සහ ව්‍යුත්පන්න ගණුදෙනු වෙළෙඳුන් නියාමනය කිරීම සඳහාත් කොමිෂන් සභාවට නව බලතල ලබා දීමට නියමිත ය. ශ්‍රී ලංකාවේ සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මහජනතාවට ණයකර නිකුත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සිදු කරන සමාගම් සහ වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීමට හැකි වන ආකාරයෙන් කොමිෂන් සභාවේ බලතල නව නීති රාමුව තුළින් පුළුල් කරනු ඇත.

එයට අමතර වශයෙන් යම් යම් පුද්ගලයන් විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සිදු කරනු ලබන නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් හේතුවෙන් පාඩු විඳීමට සිදු වූ ආයෝජකයන්ට එසේ සිදු වූ අලාභයන් පියවීම සඳහා සිවිල් ක්‍රියාමාර්ගයන්ට යොමු වීමේ බලතල කොමිෂන් සභාවට නව සංශෝධන තුළින් ලැබෙනු ඇත. ආයෝජකයන්ගේ වත්කම් සඳහා ආරක්ෂාව සැලසීම, කොටස් වෙළෙඳපොළ තුළ සිදුවන වැරදි පිළිබඳ කොමිෂන් සභාව වෙත තොරතුරු ලබා දෙන පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ඇතුළුව නව විධිවිධාන රාශියක්ද සංශෝධිත පනත මගින් ගෙන ඒමට නියමිත ය.

මෙම වසර ආරම්භයේ දී යෝජිත සංශෝධනයන් සම්බන්ධයෙන් සකසන ලද වාර්තා කිහිපයක් කොමිෂන් සභාව විසින් මහජනයාගේ අදහස් ලබා ගැනීම පිණිස ප්‍රසිද්ධ කළ අතර, සංශෝධිත පනතට අන්තර්ගත කළ යුතු වගන්ති 2012 දෙසැම්බර් මස වන විටත් හඳුනාගෙන අවසානය.

### *කොළඹ කොටස් වෙළෙඳපොළ අසමූහිකරණය කිරීමේ බිල්පත:*

කොළඹ කොටස් වෙළෙඳපොළ අසමූහිකරණය කිරීම සම්බන්ධව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කළ බිල්පත, කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ උපදේශනය මත සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහ කොළඹ කොටස් වෙළෙඳපොළ සමග වැඩිදුර සාකච්ඡා සඳහා යොමු කරන ලදී.

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහ කොළඹ කොටස් වෙළඳපොළ මගින් ලබා දුන් අදහස් නීතිපතිවරයාගේ උපදේශය සඳහා යොමු කර ඇත.

නීතිපතිවරයා මේ සම්බන්ධයෙන් දරන අදහස් අප වෙත ලැබීමට නියමිත ය.

තවද අසමූහිකරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා අසමූහිකරණය සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් කොමිෂන් සභාව විසින් සකස් කරන ලදී.

**අවම මහජන කොටස් තැන්පතුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයක් ලෙස පවත්වාගෙන යාම.**

මේ සම්බන්ධව රීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය මෙම වසර තුළ දී අවසන් කළ යුතු අතර, ඒවා මහජන අදහස් විමසීම පිණිස ඉදිරිපත් කිරීමට නියමිත ය.

### *ආශ්‍රිත පාර්ෂව ගනුදෙනු නියාමන රීතීන්*

ආශ්‍රිත පාර්ෂව ගනුදෙනු නියාමනය සඳහා යෝජිත රීතීන්ම මහජන මතය විමසීම සඳහා 2012 සැප්තැම්බර් මාසයේ දී උපදේශන පත්‍රිකාවක් බෙදා හරින ලදී. එම උපදේශන පත්‍රිකාව මඟින් පහත සඳහන් රීතීන් ආවරණය කරන ලදී.

- ආශ්‍රිත පාර්ශවයන් සමඟ කරන ගනුදෙනු යම්කිසි සීමාවකට වඩා වැඩි වන්නේ නම්, එසැනින් වෙළඳපොළ හෙළිදරව්වක් කිරීම.
- ආශ්‍රිත පාර්ශවයන් සමඟ කරන්නාවූ ගනුදෙනු වල අවම හෙලිදරව්වන් වාර්ෂික වාර්තාවේ ඇතුලත් කිරීම.
- සියලුම ආශ්‍රිත පාර්ශව ගනුදෙනු ස්වාධීන අනුමැතියකට ලක් කිරීම.
- ආශ්‍රිත පාර්ශවයන් සමඟ කරන්නාවූ ගනුදෙනු යම්කිසි සීමාවකට වඩා වැඩි වන්නේ නම්, කොටස් හිමියන්ගේ අනුවැතියකට ලක් කිරීම.
- ස්වාධීන කොටස් හිමියන්ගේ, විශේෂ අනුමැතියකින් තොරව ආයතනයේ වත්කම් ආශ්‍රිත පාර්ශවයනට විකිණීම හෝ ආශ්‍රිත පාර්ශවයකින් වත්කම් මිලදී ගැනීම සීමා කිරීම.

### වෙළෙඳපොළ සහභාගිකරුවන් නියාමනය කිරීම:

### *කොළඹ කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය සම්බන්ධයෙන් වන රීති සංශෝධනය කිරීම:*

කොළඹ කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය සම්බන්ධයෙන් වන රීති සඳහා සංශෝධන කරමින් සැකසූ 07 වන අනුවාදය හඳුන්වා දීම සඳහා 2012 පෙබරවාරි මාසයේ දී කොමිෂන් සභාව මගින් අනුමැතිය පිරිනමන ලදී. මෙම සංශෝධිත රීති මගින් කොටස් හා ණයකර ගණුදෙනු එකම පද්ධතියක් හරහා සිදු කිරීමට අවස්ථාව සැලසේ.

### *කොටස් තැරැව්කරුවන් සම්බන්ධ රීති:*

කොළඹ කොටස් වෙළෙඳපොළේ කොටස් තැරැව්කරුවන් සම්බන්ධ රීතින්ට කළ සංශෝධනයන් කොමිෂන් සභාව විසින් මෙම වසරේ දී අනුමත කරන ලදී.

### *කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති සංශෝධනය කිරීම:*

- ද්විත්ව පුවරුවේ ලැයිස්තුගත කළ සමාගම් විසින් අන්තර් මූල්‍ය ප්‍රකාශයන් කාර්තුමය පදනමක් මත නිකුත් කිරීමේ අවශ්‍යතාවය ගෙන ඒම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතින් හි 7.4 රීතිය සංශෝධනය කරන ලදී.
- 2012 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීමේ ක්‍රමවේදයක් ලෙස දක්වා ඇති "හඳුන්වාදීමේ ක්‍රමය", කොටස් ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් අත්හිටුවන ලදී.
- මූලික මහජන කොටස් නිකුත් කිරීමක දී, එවැනි නිකුතුවකට පෙර කිසියම් අයෙකු සඳහා එකී සමාගම විසින් කොටස් නිකුත් කර ඇත්නම්, එවැනි කොටස් කිසියම් කාල සීමාවක් සඳහා රඳවා තැබීම සඳහා කොටස් වෙළෙඳපොළට පහත ආකාරයෙන් නියෝග කරන ලදී.
    * මහජන නිකුතුවකට පෙර කොටස් දරන්නා වූ කොටස් හිමිකරුවන්ගේ කොටස් සහ සමාගමේ ප්‍රවර්ධකයන් විසින් දරන කොටස්, කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වූ දිනයේ සිට මාස 09 ක කාල සීමාවක් සඳහා රඳවා තබා ගත යුතුය.
    * මහජන නිකුතුවකට පෙර කිසියම් අයෙකු සඳහා එකී සමාගම විසින් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීම සඳහා අයදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර වසරක කාල සීමාවක් තුළ දී එම සමාගම විසින් යම් අයෙකුට කොටස් නිකුත් කර ඇත්නම්, එවැනි කොටස් අදාළ සමාගම කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වූ දිනයේ සිට මාස 12 ක කාල සීමාවක් සඳහා රඳවා තබා ගත යුතුය.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

- විකුණුම් අර්පනයක් තුළින් යම් සමාගමකට කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කළ හැක්කේ, එකී සමාගමේ කොටස්කරුවන් විසින් ලැයිස්තුගත කිරීමේ අයදුම්පත පත්‍රය ඉදිරිපත් කරන දින වන විට මාස 18 ක කාල සීමාවක් පුරාවට දරා සිටි කොටස් පමණි.

**විධානයන්**:

පහත දක්වා ඇති විධානයන් කොමිෂන් සභාව විසින් 2012 වසර තුළ දී නිකුත් කරන ලදී.

- කොළඹ කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවන්ට අදාළ රීතිවල දක්වා ඇති ආකෘතියට අනුව ගණනය කළ, සකස් කළ ශුද්ධ වත්කම් ප්‍රමාණය මෙන් තුන් ගුණයක සීමාව දක්වා ආයෝජකයන් වෙත ණයට කොටස් මිලදී ගැනීමට පහසුකම් ලබා දීම සඳහා තැරැව්කාර සමාගම් වෙත අවසර ලබා දෙන ලදී.
- තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකවරු වෙත කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් ලබා දී ඇති කොටස් වෙළෙඳපොළ ගණුදෙනු සංකේතයන් භාවිතා කිරීම අනිවාර්ය බවත් සහ එසේ ලබා දී ඇති සංකේතයන් යොදා ගනිමින් සිදුකර ඇති සියලුම ගණුදෙනු සඳහා අදාළ සංකේතය හිමි ආයෝජන උපදේශකයා එහි වගකීම භාර ගත යුතු බවත් දක්වමින් නියෝගයක් නිකුත් කරන ලදී.
- කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීමේ ක්‍රමවේදයක් වශයෙන් දක්වා තිබෙන 'හඳුන්වාදීමේ ක්‍රමය' යටතේ 'කොටස්' සම්බන්ධව දක්වා ඇති විධිවිධාන ඉවත් කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළට නියෝග කරන ලදී.

  තවද මූලික කොටස් නිකුත් කිරීමක දී, එවැනි මහජන නිකුතුවකට පෙර කිසියම් අයෙකු සඳහා එකී සමාගම විසින් කොටස් නිකුත් කර ඇත්නම්, එවැනි කොටස් කොමිෂන් සභාව විසින් නිකුත් කළ විධානයේ දක්වා ඇති ආකාරයෙන් කිසියම් කාල සීමාවක් සඳහා එකී කොටස් රඳවා තැබීම සඳහා කොටස් වෙළෙඳපොළට නියෝග කරන ලදී.
- ලැයිස්තුගත පොදු සමාගම් විසින් නිකුත් කළ කොටස් බලපත්‍ර ගණුදෙනු කිරීම සඳහා ලබා දී ඇති කාල සීමාවන් දීර්ඝ කිරීම සීමා කරන ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළට කල නියෝග කරන ලදී.
- කොළඹ කොටස් වෙළඳපොළ වෙත කල නියෝගයන් නිකුත් කරමින්, විශේෂයෙන් සකස් කල සමීකරණයන් යටතේ ලයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධව පණවා තිබූ 10% මිල සීමාව උක්ත කී නියෝගය නිකුත් කල දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලදී.
- කොමිෂන් සභාව විසින් 2012 මැයි මස 22 වන දින ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් තැප්‍රෝබේන් සෙකියුරිටිස් ප්‍රයිවට් ලිමිටඩ් තැරැව්කාර සමාගම හරහා, ද ෆිනෑන්ස් කම්පැනි පී. එල්. සී. සමාගමේ කොටස් මිල දී ගෙන ඒ සඳහා මුදල් පියවීමට අපොහොසත් වීම සැලකිල්ලට ගනිමින්, කොටස් වෙළෙඳපොළේ සිදුවන ගණුදෙනුවල නිෂ්කාශන සහ පියවීමේ කටයුතු චක්‍රය නිසි ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කරන අතුරු පියවරයන් කිහිපයක් හඳුන්වා දෙන ලදී.

අනෙකුත් කරුණුවලට අමතර වශයෙන්, පහත දක්වා ඇති පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත නියෝග කරන ලදී.

I. කොළඹ කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය හරහා සිදු කරන ක්‍රෝසින් ගණුදෙනු (crossings) වල කොටස් මිල තීරණය කිරීමේ දී, ක්‍රෝසින් ගණුදෙනුවල කොටස් මිලෙහි වෙනස, එකී කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය මගින් පෙන්වන කලින් දින අවසාන වන විට පැවති මිලෙන් 20% කට වඩා නොවැඩි විය යුතුය.

II. ඒ අනුව ඉහත (I) ආවරණය වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය ගණුදෙනු පද්ධතිය සම්බන්ධ වන රීති සංශෝධනය කළ යුතුය.

III. රුපියල් මිලියන 20 ක් හෝ එයට වැඩි වඩා වැඩි වටිනාකමකින් යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සියලුම ගණුදෙනු ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධයෙන් එම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ ලියවිල්ලක් ලබා ගැනීම සියලුම බලපත්‍රලාභී තැරැව්කාර සමාගම් විසින් අනිවාර්ය වශයෙන් සිදුකළ යුතුය.

IV. ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදු කරන සියලුම ඉදිරි ගණුදෙනු සඳහා තෙවන පාර්ශවීය භාරකාර බැංකුවක් හරහා සිදු කරන බවටත්, කොළඹ කොටස් වෙළෙඳපොළේ මධ්‍යම තැන්පතුවේ සියලුම සහභාගිකරුවන් සැම විටම මධ්‍යම තැන්පතු රීතීන්ට අනුකූලව කටයුතු කරන බවටත් මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් සහතික විය යුතුය.

V. බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ගේ සහ කොටස් වෙළෙඳුන්ගේ විධායක අධ්‍යක්ෂවරු, සේවකයන්, ඔවුන්ගේ සහකරුවන් සහ එකී බලපත්‍ර ලාභී කොටස් තැරැව්කරුවන්ගේ සහ කොටස් වෙළෙඳුන්ගේ නාමිකයන් විසින් ද්විතික වෙළෙඳපොළ හරහා මිල දී ගත් කොටස් විකිණීමේ දී, එම කොටස් මිල දී ගත් දින සිට මාස 06 ක කාල සීමාවක් ඇතුළත විකිණීම තහනම් කරන ලදී. මූලික කොටස් නිකුත් කිරීම්, සේවා නියුක්තිකයන්ට කොටස්වල අයිතිය පැවරීමේ සැලසුම් ක්‍රමයන් හා හිමිකම් නිකුත් කිරීම් හරහා මිල දී ගත් / ලබා ගත් කොටස් සඳහා මෙම තහනම අදාළ නොවේ.

ඉහත I, II සහ V යටතේ දක්වා ඇති සීමා කිරීම් 2012 ඔක්තෝබර් මාසයේ දී ඉවත් කරන ලදී.

## අනුමැතිය පිරිනැමීම්:

### *විශ්වීය කලාපීය සහ රාෂ්ට අරමුදල් සඳහා අනුමැතිය පිරිනැමීම*

මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් කොමිෂන් සභාවට ලබා දෙන නිර්දේශය මත පදනම්ව, විශ්වීය කලාපීය සහ රාෂ්ට අරමුදල්වලට, මෙරට කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත පොදු සමාගම්වල ආයෝජනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ. එසේ ලබා දෙන අනුමැතිය 2006 අංක 05 දරණ මුදල් නිශෝධනය කිරීම වැළැක්වීමේ පනත, 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත, විනිමය පාලන රෙගුලාසි සහ සුරැකුම්පත් සම්බන්ධයෙන් මෙරට ක්‍රියාත්මක වන අනෙකුත් නීති සහ රෙගුලාසිවලට යටත්ව පිරිනමනු ලබයි.

2012 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් එවැනි අරමුදල් 124 ක් සඳහා අනුමැතිය පිරිනමන ලද අතර, අනුමැතිය පිරිනැමූ අරමුදල් 37 ක නම් වෙනස් කිරීම් ද සටහන් කරන ලදී.

### *සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය පරිපාලනය කිරීම*

අර්පනලාභියා ලැයිස්තුගත පොදු සමාගමක් වන අවස්ථාවල දී සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීම් සම්බන්ධයෙන් 1995 සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය (2003 වසරේ දී සංශෝධිත) අදාළ වේ. සංග්‍රහය මගින් පවරා ගැනීමකට යටත් වන සමාගමක එක සමාන වර්ගයේ කොටස්කරුවන් සියලු දෙනාට ම එක හා සමාන ලෙස සලකන බවට සහතික වන අතර, සංග්‍රහයේ රීති හරහා අර්පනලාභී සමාගමේ කොටස්කරුවන් වෙත සිය සමාගමේ පවරා ගැනීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයකට එළඹීම සඳහා අවශ්‍ය කරන තොරතුරු සහ උපදෙස් ප්‍රමාණවත් ලෙස නිසි වෙලාවට ලැබෙන

බවට සහතික වේ. ලැයිස්තුගත සමාගමක් අත්පත් කර ගැනීමේ දී එය සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සිදු වන බවට අපි සහතික වන්නෙමු.

සංග්‍රහය යටතේ දක්වා ඇති රීතීන්ට අනුකූලව පවරා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන නිවේදන, අර්පන ලියවිලි සහ ස්වාධීන පාර්ශවයන් විසින් සිදු කරනු ලබන තක්සේරු වාර්තා සඳහා අනුමැතිය පිරිනැමීම ද කොමිෂන් සභාව මගින් සිදු කරනු ලැබේ. සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ 2012 වසර තුළ ක්‍රියාත්මක කරන ලද අර්පනයන් හි විස්තර පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 05)

*සංඛ්‍යා සටහන 05:* වසර තුළදී පවරාගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ කල අර්පන

| අර්පනකරු | අර්පනලාභියා | අර්පනයේ ස්වභාවය |
|---|---|---|
| ඇක්සෙස් ඉංජිනියරින් ලිමිටඩ් | සතොස මෝටස් පී.එල්.සී. | අනිවාර්ය අර්පණය |
| පාක්සන් රිටේල් ලිමිටඩ් | ඕඩෙල් පී.එල්.සී. | අනිවාර්ය අර්පණය |

2012 වසරේ දී ස්වේච්ඡා සහ පාර්ශවික අර්පන සිදු කර නොමැත.

## සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ) වගන්තිය යටතේ පිරිනමන අනුමතීන්

කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගතවීම සඳහා අපේක්ෂා කරනු ලබන සෑම සමාගමක්ම එසේ ලැයිස්තුගතවීමට අපේක්ෂා කරන දිනට පෙර වසරක කාල සීමාවක් තුළ දී යම් පුද්ගලයෙකු හට කොටස් බෙදාහැරීමක් සිදුකර ඇත්නම්, කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එකී කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නොහැක. එකී වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව පහත සඳහන් අනුමැතීන් 2012 වසර තුළ දී ප්‍රදානය කරන ලදී,

- ඔරියන්ට් ෆිනෑන්සල් සර්විෂස් කෝපරේෂන් ලිමිටඩ්
- ඒෂියා සියාකා කොමොඩිටීස් ලිමිටඩ්
- රම්බොඩ ෆෝල්ස් ලිමිටඩ්
- හික්කඩුව බීච් රිසෝර්ට් ලිමිටඩ්
- මිලේනියම් හවුසින් ඩිවලොපර්ස් ලිමිටඩ්
- සණස ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ් / සණස සංවර්ධන බැංකුව

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ පිරිනමන අනුමතීන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් නිකුත් කිරීමේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

2012 වසර තුළ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 29 (අ) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමට කාර්යාංශයට බලය පැවරීමට මිනුම් දඬු නිර්මාණය කරන ලදී,

පහත සඳහන් ආයතන සඳහා මෙම වර්ෂය තුළ දී කොමිෂන් සභාව උක්ත අනුමැතීන් ප්‍රදානය කරන ලදී, (සංඛ්‍යා සටහන 06)

*සංඛ්‍යා සටහන 06:* සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පණතේ 29(ආ) වගන්තිය යටතේ පිරිනමන අනුමැතීන්

| ආයතනයේ නම | නිකුතුවේ ස්වභාවය | සුරැකුම්පත් වර්ගය | අනුමත කරන ලද මුදල |
|---|---|---|---|
| පීපල්ස් ලීසිං කම්පනි පී.එල්.සී. - දේශීය නිකුතුව | පුද්ගලික පැවරුම | ලැයිස්තුගත නොකළ ණයකර | රු. 5,000,000,000/= |
| පීපල්ස් ලීසිං කම්පනි පී.එල්.සී. - විදේශීය නිකුතුව | - එම - | - එම - | එ.ජ.ඩො. මිලියන 150 |
| එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී. | මහජන නිකුතුව | - එම - | රු. 1,000,000,000/= |
| ලංකා බැංකුව - විදේශීය නිකුතුව | පුද්ගලික පැවරුම | - එම - | එ.ජ.ඩො. මිලියන 500 |
| සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී.එල්.සී. | පුද්ගලික පැවරුම | - එම - | රු. 500,000,000/= |
| සෙලාන් බැංකුව පී.එල්.සී. | - එම - | - එම - | රු. 2,000,000,000/= |
| ඩී.එෆ්.සී.සී. බැංකුව පී.එල්.සී. | - එම - | - එම - | රු. 3,500,000,000/= |
| සිංගර් (ශ්‍රී ලංකා) පී.එල්.සී. - III නිකුතුව | - එම - | - එම - | රු. 356,000,000/= |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

| ආයතනයේ නම | නිකුතුවේ ස්වභාවය | සුරැකුම්පත් වර්ගය | අනුමත කරන ලද මුදල |
|---|---|---|---|
| සොෆ්ට්ලොජික් ෆිනෑන්සල් පී.එල්.සී. (විදේශීය නිකුතුව) | - එම - | - එම - | එ.ජ.ඩො. මිලියන 4 |
| සෙංකඩගල ෆිනෑන්ස් පී.එල්.සී. | - එම - | - එම - | රු. 750,000,000/= |
| ඩයලොග් ඇක්ෂියාටා පී.එල්.සී. | - එම - | - එම - | මැලේසියානු රිංගිට් බිලියන 1.2 |
| මල්ටි ෆිනෑන්ස් පී.එල්.සී. | - එම - | - එම - | රු. 200,000,000/= |
| සිලෝන් ටී. බ්‍රෝකර්ස් පී.එල්.සී. | - එම - | - එම - | රු. 100,000,000/= |
| පෑන් ඒෂියා බැංකුව පී.එල්.සී. | - එම - | - එම - | රු. 750,000,000/= |
| සිංගර් (ශ්‍රී ලංකා) පී.එල්.සී. - I - නිකුතුව | - එම - | - එම - | රු. 500,000,000/= |
| වැලිබල් ෆිනෑන්ස් පී.එල්.සී. | - එම - | - එම - | රු. 150,000,000/= |
| සිංගර් (ශ්‍රී ලංකා) පී.එල්.සී. - II - නිකුතුව | - එම - | - එම - | රු. 644,000,000/= |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී.- I - නිකුතුව | - එම - | - එම - | රු. 600,000,000/= |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී.- II - නිකුතුව | - එම - | - එම - | රු. 700,000,000/= |

### *දිවැස ඉක්විටිස් ප්‍රයිවට් ලිමිටඩ් සහ ජෝර්ජ් ස්ටුවර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් විසින් සිට්‍රස් ලෙෂර් පී. එල්. සී. සමාගමේ 2012 කොටස් බලපත්‍ර, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීම:*

කොමිෂන් සභාව විසින් පැන වූ යම් යම් කොන්දේසි සම්පූර්ණ කිරීමකට යටත්ව, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ දක්වන අනිවාර්ය අර්පනයක් සිදු කිරීමෙන් තොරව, දිවැස ඉක්විටිස් ප්‍රයිවට් ලිමිටඩ් සහ ජෝර්ජ් ස්ටුවර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් විසින් සිට්‍රස් ලෙෂර් පී.එල්.සී. සමාගමේ 2012 කොටස් බලපත්‍ර සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන ලදී.

### *අවීවා එන්. ඩී. බී. ඉන්ෂුවරන්ස් පී. එල්. සී. සමාගමේ කොටස් හිමිකාරත්ව ව්‍යුහයේ සිදු කිරීමට යෝජිත වෙනස්කම්:*

අවීවා එන්. ඩී. බී. ඉන්ෂුවරන්ස් පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් 93% ක ප්‍රමාණයක් හොංකොං හි ඇමරිකන් ඉන්ෂුවරන්ස් එලයන්ස් ලිමිටඩ් (ඒ. අයි. ඒ.) විසින් මිල දී ගැනීම හේතුවෙන් අවීවා එන්. ඩී. බී. ඉන්ෂුවරන්ස් පී. එල්. සී. සමාගමේ ඉතිරි සුළුතර කොටස් හිමියන් වෙත අර්පනයක් කරන ලෙස කොමිෂන් සභාව විසින් ඒ. අයි. ඒ. සමාගම වෙත දන්වන ලදී.

### *ලයිස්තුගත පොදු සමාගමක් කොළඹ කොටස් වෙළඳපොල ලයිස්තුවෙන් ඉවත් කිරීම*

කොළඹ දිසා අධිකරණය විසින් ෆර්න් ටී පී.එල්.සී සමාගම විසිරුවා හැරීමට ලබා දී ඇති නියෝගයට අනුව, සුරැකුම්පත් සහ විනිමය සභා රීතීන්හි රීති අංක 4(2) ට අනුව, ෆර්න් ටී පී.එල්.සී සමාගමට කොළඹ කොටස් වෙළඳපොලේ ප්‍රධාන පුවරුවෙන් ඉවත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් එකී සමාගමට අවසර ලබා දීමෙන් අනතුරුව එම සමාගම ලයිස්තුවෙන් ඉවත් කරන ලදී.

### *වෙළෙඳ භූමියෙන් බැහැර කොටස් ගණුදෙනු*

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 28(1) වගන්තිය ප්‍රකාරව, බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලැයිස්තුගත කරන පොදු සමාගමක කොටස් දරණ කිසියම් තැනැත්තෙකු විසින්, බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක් විසින් යොදා ගනු ලබන කාර්යය පටිපාටියට අනුකූල නොවන ලෙස, එකී කොටස් මිල දී ගැනීම, විකිණීම හෝ ගණුදෙනු කිරීමේ කාර්යයන් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව නොකළ යුතුයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී විශේෂිත ගණුදෙනු 563 ක් සහ කොටස් ත්‍යාග පැවරුම් 335 ක් සඳහා අනුමැතිය ප්‍රදානය කෙරිණි.

මෙහිදී විශේෂිත ගණුදෙනු යටතට ආන්තික ගණුදෙනු, අනිවාර්ය අර්පනයන්, ස්වේච්ඡා අත්පනයන්, සමාගම් ලේඛනයෙන් බැහැර කිරීම් තනි ගිනුමකින් ඒකාබද්ධ ගිනුමකින් ඒකාබද්ධ ගිනුමකට පැවරීම සහ දත්ත පිවිසුම් වැරදි නිවැරදි කිරීම් අයත් වේ.

### *සුපරීක්ෂණය සහ අනුකූලතාවය*

අපගේ සුපරීක්ෂණ කාර්යභාරයේ අභිප්‍රාය වනුයේ නියාමනයට බඳුන් වන වෙළෙඳපොළ සහභාගීකරුවන්ගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ආකාරය, මූල්‍ය ස්ථාවරත්වය, නියාමනයන්ට දක්වන්නා වූ අනුකූලතාවය සුපරීක්ෂණය කිරීමෙන් ආයෝජකයන් ආරක්ෂා කර ගැනීමයි. තවද අපි අවදානම මත පදනම් වූ අනුකූලතා පරීක්ෂණ මෙහෙයවන අතර, වෙළෙඳපොළ සහභාගිකරුවන්ට තම නියාමන යුතුකම් අවබෝධ කර දීම පිණිස සාකච්ඡා පැවැත්විය.

### *ලැයිස්තුගත සමාගම් සුපරීක්ෂණය*

සියලු ලැයිස්තුගත සමාගම් විසින් මූල්‍ය වර්ෂය අවසානයේ සිට පස් මසක් තුළ ඔවුන්ගේ වාර්ෂික වාර්තා සිය කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට ඉදිරිපත් කළ යුතු වේ.

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා විමර්ශනය කිරීමත්, අනනුකූලතාවයන් එකී සමාගම් වෙත දැනුම් දෙයි. ලැයිස්තුගත සමාගම්, සභාවේ මෙම ක්‍රියාදාමයට ඉහළ ප්‍රතිචාර දක්වා ඇත.

ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය වාතාවරනය සහ තොරතුරු බෙදාහැරීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම මෙම ක්‍රියාවන්හි අරමුණ වේ. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි වගකීම හා විනිවිදභාවය ගොඩනැංවීම උදෙසා වන වෘත්තීය ප්‍රමිත මට්ටම් පවත්වා ගැනීම, ප්‍රමාණවත් තොරතුරු අප්‍රමාදව බෙදා හැරීමත් ලැයිස්තුගත සමාගම් විසින් සිදු කළ යුතු බවට අපේක්ෂා කෙරේ.

වාර්ෂික වාර්තා විමර්ශනයේ දී පහත අංශ වෙත අවධානය යොමු කරනු ලබයි.

- කොළඹ කොටස් වෙළෙඳපොළ නියාමනයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ සමාගම් පනතේ අදාළ විධිවිධාන සඳහා වන අනුකූලතාවයන්
- මූල්‍ය අවධාරණයන්
- සභාපතිවරයාගේ වාර්තාව

- සාංගමික යහ පැවැත්ම පිළිබඳ භාවිතයන්
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- විගණන වාර්තාව
- කොටස් හිමියන්ගේ හා ආයෝජකයන්ගේ තොරතුරු
- මූල්‍ය දත්ත

වසර තුළ දී ලැයිස්තුගත සමාගම් 98 ක් වාර්ෂික වාර්තා විමර්ශනය කරන ලදුව විවේචනාත්මක ලිපි 50 ක් නිකුත් කර තිබේ.

### වෙළෙඳපොළ සහභාගිකයින් අධීක්ෂණය

### *කොටස් තැරැව්කාර කර්මාන්තය*

2012 වසර තුළ දී කොටස් වෙළෙඳපොළ මිල දර්ශකයන් හි සහ විකුණුම් පිරිවැටුමෙහි පහත වැටීමත් සමගම සමස්ත කොටස් තැරැව්කාර කර්මාන්තයේ පිරිවැටුම සහ ලාභදායිතාව ද අඩු විය. කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යා දත්ත පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.(සංඛ්‍යා සටහන 07)

*සංඛ්‍යා සටහන 07:* **කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය**

| | 2012 (රු.'000) | 2011 (රු.'000) | වෙනස % |
|---|---|---|---|
| පිරිවැටුම | **1,921,489** | 5,749,765 | -67% |
| ශුද්ධ තැරැව්කාර ගාස්තුව | **1,756,498** | 5,522,411 | -68% |
| මෙහෙයුම් ලාභය / (පාඩුව) | **(436,094)** | 2,602,612 | -117% |
| වෙනත් ආදායම් | **786,300** | 921,809 | -15% |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | **(557,819)** | 2,389,061 | -123% |
| බදුවලට පසු ශුද්ධ ලාභය | **(299,234)** | 1,768,246 | -117% |
| මුළු වත්කම් * | **10,781,900** | 10,951,135 | -2% |
| මුළු වගකීම් * | **4,308,204** | 4,250,390 | 1% |
| ශුද්ධ ප්‍රාග්ධනය | **4,926,718** | 3,346,937 | 47% |

* *2011/2012 දෙසැම්බර් 31 දිනට*

*මූලය : සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන*

මෙම පසුගාමී තත්ත්වය මත කොටස් තැරැව්කාර සමාගම් මත පනවා තිබූ ණය විස්තාරණ නීතිය අවධානයට ලක් කොට වැඩි දුරටත් විවරණය කරන ලදී, තව දුරටත් කොටස් තැරැව්කාර සමාගම් ණය විස්තාරණය මත පනවා ඇති බාධා ලිහිල් කිරීමේ අවශ්‍යතාවය නොකඩවා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි අවධානයට ලක් කරන ලදී.

මේ අනුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවතින ණය විස්තාරණ නීතියට අදාළව පැන නැඟී ඇති ගැටලු සාකච්ඡා කිරීම සඳහා කොටස් තැරැව්කාර සමාගම්වල නිලධාරීන් සමඟ සංවාදාත්මක (Consultative) රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. ඉන් අනතුරුව, 2012 ඔක්තෝම්බර් මාසයේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ණය විස්තාරණ නීතිය මත පැන වූ සීමාවන් ලිහිල් කරන ලද අතර, එමගින් ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය ගණනය කිරීමට අඩු බලපෑමක් ඇති කරන ලදී. ඒ අනුව නොපියවූ කොටස් මිල දී ගැනුම්වල පිරිවැය සහ වෙළෙඳපොළ වටිනාකම අතර වෙනස, ගැණුම් මිලට වඩා වර්තමාන වෙළෙඳපොළ අගය අඩු අවස්ථාවේදී එය ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය ගණනය කිරීමේ දී අඩු කිරීමේ ගැලපුමක් ලෙස පිළිබිඹු කරනු ලැබේ. තවදුරටත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ණය විස්තාරණ නීතිය හා සම්බන්ධිත 2012 ජනවාරි මස නිකුත් කරන ලද කොටස් තැරැව්කාර සමාගම්වලට තම "ගැලපුම් ශුද්ධ ප්‍රාග්ධනය" මෙන් තුන් ගුණයක් ණය විස්තාරණය කිරීමේ නියෝගය හැර, ණය විස්තාරණ නීතිය සම්බන්ධයෙන් එතෙක් පනවා තිබූ සියලු නියෝග නිෂ්ප්‍රභා කරන ලදී. කෙසේ වෙතත් නියාමන අවශ්‍යතාවයන් මත ණය අවදානම් ප්‍රමාණය පිළිබඳව සමීප අධීක්ෂණයක් පවත්වා ගැනීම සඳහා අවම දත්ත සහ වාර්තාකරණ අවශ්‍යතාවයන් කොටස් තැරැව්කාර සමාගම් මත අනිවාර්ය කරන ලදී. ඒ අනුව ණය අවදානම් ප්‍රමාණය හා සම්බන්ධිත ක්ෂේත්‍රගත නොවන අධීක්ෂණය වඩාත් ශක්තිමත් කිරීම සඳහා ණය ගැතියන් සම්බන්ධිත තොරතුරු වාර්තාකරණ පරිචයක් (reporting frame work) හඳුන්වාදෙන ලදී.

2012 වර්ෂයේ අවසාන කාර්තුව තුළ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොටස් තැරැව්කාර කර්මාන්තය සඳහා අවදානම් කළමනාකරණ පද්ධතියක් (Risk Management System) සහ තැරැව්කාර අභ්‍යන්තර කාර්යාල තොරතුරු පද්ධතියක් (Broker Back Office System) ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ලබා දෙන ලදී.

කොටස් තැරැව්කාර කර්මාන්තයෙහි නියාමන අවශ්‍යතාවයන් සහ අවදානම් කළමනාකරණ පරිචය මෙම මූලාරම්භයන් මගින් සංතෘප්ත (Fortify) කිරීම අපේක්ෂා කරනු ලැබේ.

### ඒකක භාර කර්මාන්තය

සංවර්ධනය වෙමින් පවතින පාලන පරිචය හමුවෙහි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒකක භාර කර්මාන්තයේ සංවර්ධනයට සහය දැක්වීම පිණිස විශේෂ ප්‍රාථමික නිකුතු අරමුදල් (IPO Funds) මත පනවා තිබූ ආයෝජන සීමා කිරීම ලිහිල් කොට එක් ප්‍රාථමික නිකුතුවක තැන්පතු දේපළෙන් (Diposited Property) 30% ක් දක්වා ආයෝජනය කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි තරගකාරීත්වය තව දුරටත් වර්ධනය කිරීම පිණිස ඒකක භාර කළමනාකරණ සමාගම් සහ භාරකරුවන් සමඟ සංවාදාත්මක (Consultative) රැස්වීම් කැඳවන ලදී. මෙම ප්‍රයත්නයෙන්

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සු.වි.කො.සෙ හි පවතින ප්‍රතිපත්තීන් සහ ක්‍රියා පටිපාටීන් වෙනස් කිරීමේ අවශ්‍යතාවයත්, නව ප්‍රතිපත්තීන් පිළිබඳ සාකච්ඡා කිරීමටත් අවස්ථාව සැලසෙන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒකක භාර අරමුදල් හි මූල්‍ය වාර්තා ආකෘති, ගිණුම්කරණ ප්‍රමිත කමිටුව මගින් නිර්දේශිත නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිති පරිචය යටතේ විවරණය කිරීම සඳහා දායකත්වයක් ලබා දෙන ලදී.

2012 වර්ෂය තුළ දී ජාතික අයවැය මගින් ඒකක භාරයක හෝ අන්‍යොන්‍ය අරමුදලක (Mutual Fund) ඒකක නිදහස් කිරීමේ දී ඇතිවන ලාභ සහ ආදායම් මත පනවන ලද ආදායම් බද්ද සහ මූල්‍ය සේවා මත පනවන ලද එකතු කළ වටිනාකම් බද්ද ඉවත් කොට සහන ලබා දෙන ලදී.

2012 වසර තුළ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒකක භාර කළමනාකරණ සමාගම් දෙකක මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලන විධි, (Internol Controls) සහ ක්‍රියා පටිපාටි සහ යහ පාලනය (Governance), තොරතුරු පද්ධති, නීති සහ රෙගුලාසිමය අවශ්‍යතාවයන් හි ප්‍රමාණවත් බව ඇගයීමට, විචක්ෂන සහ මෙහෙයුම් අවදානම් පදනම් කොට ගත් ක්ෂේත්‍රගත පරීක්ෂණයන් සිදු කරන ලදී. එම කළමනාකරණ ආයතන ඒකක භාර මෙහෙයුම්වලට අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇති බව තහවුරු විය.

ඒකක භාර කළමනාකරණ සමාගම්වල මූල්‍ය ස්ථාවරත්වය සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පනවා ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පවත්වාගෙන යන බවත් එම ආයතන මගින් මාසිකව ඉදිරිපත් කරන ලද විගණනය නොකරන ලද මූල්‍ය වාර්තා පරීක්ෂා කිරීම මගින් තහවුරු කරන ලදී. ඊට අමතරව ඒකක භාර අරමුදල්, ඒකක භාර සංග්‍රහය, අදාළ භාරකාර ඔප්පු (Trust Deeds) සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද නියෝග මගින් දක්වා ඇති අනාවරණ සීමා තුළ සිය ආයෝජනයන් සිදු කර ඇත්දැයි ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මාසික වාර්තා පරීක්ෂාව මගින් තහවුරු කරන ලදී.

### වෙළෙඳපොළ අතරමැදියන්

ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගිකරුවන් ලෙස ක්‍රියාකාරීවීම සඳහා වෙළෙඳපොළ අතරමැදියන් කාණ්ඩ 5 ක් යටතේ, එනම් ආන්තික සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන්, ණය ප්‍රමාණීකරණ ආයතන, ප්‍රාරක්ෂකයින් සහ නිෂ්කාශන ආයතන සඳහා ලියාපදිංචි ප්‍රදානය කිරීම සඳහා සු.වි.කො.ස. බලාත්මක කොට ඇත. එසේම සු.වි.කො.සෙ. හි නියාමන කාර්යභාරයෙහි එම අතරමැදියන්ගේ කටයුතු අධීක්ෂණය සහ පාලනය මගින් එම ආයතනයන්හි මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශබ්‍යතාවය තහවුරු කිරීම ද අන්තර්ගතය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ කටයුතු සංවර්ධනය සහ විධිමත් කිරීමෙහි අරමුණින් නියාමන සංශෝධන කිහිපයක් පසුගිය වර්ෂ කිහිපය තුළ දී කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආන්තික සැපයුම් කර්මාන්තයෙහි නිම් වළලු පුළුල් කරමින් නව සමාගම් 20 ක් සඳහා ලියාපදිංචි ප්‍රදානය කරන ලදී.

2012 වසර තුළ දී සු.වි.කො.ස. ආන්තික සැපයුම්කරුවන්ගේ අධීක්ෂණ සහ පාලන ක්‍රියා පටිපාටි සවිමත් කරන ලදී. එමගින් එම ආයතන හා සම්බන්ධිත අවදානම් තත්ව නිරීක්ෂණය, වැළැක්වීම සහ කළමනාකරණය කිරීම සඳහා අවදානම් පදනම් කර ගත් විතැන් අධීක්ෂණ සහ එතැන් අධීක්ෂණ සංඛ්‍යාව ඉහළ දමන ලදී. වැඩි අවදානම් කේන්ද්‍රිත ආයතන සවිස්තරාත්මක නිරීක්ෂණ ක්‍රමවේදයන් මගින් හඳුනා ගන්නා ලද අතර, එම ආයතනයන් හි ඉහළ යන අවදානම් තත්ව විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයන් ඔස්සේ වළක්වා ගැනීමට හැකි විය.

වසරෙහි අවසාන භාගය තුළ දී ආන්තික වෙළෙඳපොළ කර්මාන්තය සඵලදායී ලෙස සංවර්ධනය කිරීමෙහි මූලාරම්භයක් ලෙස සු.වි.කො.ස. වෙළෙඳපොළ සහභාගීකරුවන්ගේ ගැටලු සහ යෝජනා ලබා ගැනීම පිණිස වෙළෙඳපොළ සහභාගිකරුවන් සඳහා සංවාදාත්මක (Consultative) රැස්වීම් කිහිපයක් සඳහා අවස්ථාව සලසන ලදී. එසේ ලබා ගන්නා ලද ගැටලු සහ යෝජනා ඇගයීමට ලක් කර කොමිෂන් සභාව සාධාරණ, කාර්යක්ෂම සහ විධිමත් වෙළෙඳපොළක් තහවුරු කිරීම පිණිස තෝරා ගත් ප්‍රශස්ථ යෝජනා කිහිපයක් ඉදිරි වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීම සඳහා මුල පුරන ලදී. (සංඛ්‍යා සටහන 08)

*සංඛ්‍යා සටහන 08:* වෙළෙඳපොළ අතරමැදියන්ගේ මූල්‍ය කාර්ය සාධනය

| **වෙළෙඳපොළ අතරමැදියන්ගේ මූල්‍ය කාර්ය සාධනය * (රු.)** | | | | |
|---|---|---|---|---|
| **කාණ්ඩය** | **මුළු ආදායම** | **මුළු බදු පෙර ලාභය** | **මුළු වත්කම්** | **මුළු වගකීම්** |
| ආන්තික සැපයුම්කරුවන් | 369,990,417 | 65,434,417 | 1,915,156,209 | 1,009,364,015 |
| ආයෝජන කළමනාකරුවන් | 286,355,825 | (455,791,808) | 13,875,361,683 | 3,201,403,820 |
| ප්‍රාරක්ෂකයින් | 8,378,670,997 | 7,002,695,254 | 21,915,671,157 | 1,467,550,390 |
| ණය ප්‍රමාණීකරණ ආයතන | 70,067,750 | (1,367,558) | 191,363,890 | 23,466,068 |
| බහු කාර්ය ආයතන ** (Multi Purpose qutities) | 883,405,895 | 168,267,521 | 8,257,665,160 | 3,050,675,308 |
| **එකතුව** | **9,988,490,884** | **6,779,237,826** | **46,155,218,099** | **8,752,459,601** |

* *කර්මාන්තයෙහි සාධාරණ තත්වයක් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය වන බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචිගත මූල්‍ය ආයතන සහ විශේෂිත කල්බදු සමාගම්වලට අදාළ තොරතුරු හැර ඉහත මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත.*

** *බහු කාර්ය ආයතන යනු සු.වි.කො.ස. මගින් පාලනය වන කාර්යයන් කිහිපයක ක්‍රියාකාරීවීම සඳහා ලියාපදිංචි ප්‍රදානය කර ඇති ආයතන වේ.*

## ආවේක්ෂණ කටයුතු, විමර්ශන කටයුතු සහ නීති ක්‍රියාත්මක කිරීම

කාර්යක්ෂම වෙළෙඳපොළ අධීක්ෂණය සහ නීති ක්‍රියාත්මක කිරීම අපගේ නියාමන කාර්යභාරයෙහි මූලික අංගයක් වන අතර, සමස්ත වෙළෙඳපොළ පද්ධතිය තුළ ආයෝජකයන්ගේ විශ්වසනීයභාවය ගොඩනැගීමටත්, එය පවත්වාගෙන යාමටත් මෙය මහා පිටුවහලක් වේ.

### *වෙළෙඳපොළ ආවේක්ෂණය*

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සිදුවන්නා වූ සියලු ගණුදෙනු සම්බන්ධයෙන් වූ සමස්ත ආවේක්ෂණ ක්‍රියාවලියේ වගකීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර, වෙළෙඳපොළ තුළ සිදුවන අක්‍රමිකතා හඳුනාගෙන ඒවා වැළැක්වීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අනුව කටයුතු කිරීම සිදු වේ.

දිනපතා සජීව වෙළෙඳපොළ නිරීක්ෂණයන් මගින්, මිල යාන්ත්‍රණය කෙරෙහි අනිසි බලපෑම් කරන ලද වෙළෙඳපොළ තත්ත්වයන් අධීක්ෂණයට භාජනය කිරීම ආවේක්ෂණයේ මූලික අංගයක් වේ. නවීන වෙළෙඳපොළ ස්වයංක්‍රීය ආවේක්ෂණ පද්ධතිය උපයෝගී කර ගනිමින් සජීවී වෙළෙඳපොළ ගනුදෙනු නිරීක්ෂනය කරන අතර සැක කටයුතු ගනුදෙනු සම්බන්ධයෙන් ස්වයංක්‍රීයව කරනු ලබන නිවේදන ආධාරයෙන් පිලියෙල කරනු ලබන ආවේක්ෂණ වාර්තාවන් ආවේක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇත.

2012 වසර තුළ විවිධ වූ කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් පිළිබඳ ආවේක්ෂණ වාර්තාවන් 54 ක් පිළියෙල කොට ආවේක්ෂණ හා විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

මීට අමතරව 2012 වසරේ දී කොළඹ කොටස් හුවමාරුව විසින් යොමු කරන ලද ආවේක්ෂණ වාර්තාවන් 14 ක් ද වැඩිදුර අධ්‍යයනය කොට විශ්ලේෂණය කරන ලදී.

පසුගිය වසර හා සසඳන කල පිළියෙල කරනු ලැබූ ආවේක්ෂණ වාර්තාවන් 64% කින් 2012 වසර තුළ වැඩි වී ඇත. එනම් පසුගිය වසරේ පිළියෙල කරනු ලැබූ වාර්තාවන් ගණන 33 කි. මෙම වැඩිවීමට ප්‍රධාන හේතු සාධකයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ පුළුල් ස්වයංක්‍රීය වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියෙහි මනා ක්‍රියාකාරීත්වය ලෙස සැලකිය හැක.

*රූප සටහන 04:* ආවේක්ෂණ වාර්තාවන්




*රූප සටහන 05:* ආවේක්ෂණ සොයාගැනීම




ස්වයංක්‍රීය වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතිය මගින් සපයනු ලබන ස්වයංක්‍රීය නිවේදන (Alerts) වලට අමතරව සිදු කරනු ලබන දත්ත විශ්ලේෂණ ක්‍රියාවලියන් ද මගින් වෙළෙඳපොළ අක්‍රමවත් ගණුදෙනු පිළිබඳ සිදුවීම් කාර්යක්ෂමව ගොනු කර ගැනීමට ආවේක්ෂණ අංශයට හැකි වී තිබේ. (රූප සටහන 04)

කොළඹ කොටස් වෙළෙඳපොළේ ස්වයංක්‍රීය වෙළෙඳ පද්ධතියේ (ATS) වැඩි දියුණු කිරීම (Version 7) 2012 වසරේ පෙබරවාරි මස සිදු විය. එමගින් පහසුකම් රැසක් තැරැව්කාර ආයතනවලට ලැබුණු අතර, ඒ අනුව තැරැව්කාර සමාගම් හරහා සිදුවන ඇනවුම්වලින් 50% ක් අන්තර්ජාලය හරහා සිදු කිරීමට මෙම පද්ධතියෙන් හැකියාව ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩිපුර ගණුදෙනු අන්තර්ජාලය හරහා සිදු වෙමින් පවතී. තවද කොටස් 100 කට අඩුවෙන් (odd lots) වන ගණුදෙනු ප්‍රධාන පුවරුවේ සිදුවන ගණුදෙනුත් යන දෙකම එකම පුවරුවක සිදු කිරීමට ද වැඩි දියුණු වූ ස්වයංක්‍රීය වෙළෙඳපොළ පද්ධතිය මගින් අවස්ථාව සලසා දී ඇත.

ඉහත කී කාලපරිච්ඡේදය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මූලිකත්වයෙන් අවස්ථා 29 ක දී කමිටුව රැස් වී ආවේක්ෂණ හා විමර්ශන වාර්තාවන් සාකච්ඡා කරන ලදී. මෙහිදී විවිධ වූ වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් පිළිබඳ තත්ත්වයන් සාකච්ඡා කෙරුණු අතර, ආයෝජක උපදේශකවරුන්, තැරැව්කරුවන් හා ආයෝජකයන් සම්බන්ධයෙන් විවිධ වූ නීති ක්‍රියාවට නංවනු ලැබුණි. සුළු පරිමාණයෙන් වූ වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් ඒවාට සම්බන්ධ වූ පාර්ශවයන් කමිටුව වෙත කැඳවා කරුණු සොයා බලා ඉදිරියේ දී එවැනි අක්‍රමවත් ගණුදෙනුවලින් වැලකී සිටින ලෙස උපදෙස් දෙන ලදී. තවද අන්තර්ජාලය මගින් කොටස් අක්‍රමිකතාවන් ලෙස ගණුදෙනුවල නිරත වූ ආයෝජකයන් සම්බන්ධයෙන් පළමු පියවරක් ලෙස ඔවුන්ට එවැනි අයථා ගණුදෙනුවලින් වලකින ලෙස උපදෙස් ලබා දුන් අතර, එසේ නොකළහොත් අන්තර්ජාලය මගින් කොටස් ගණුදෙනු කිරීමේ පහසුකම් අත්හිටුවීමට අදාළ තැරැව්කරුවන්ට උපදෙස් ලබා දෙන බව දන්වන ලදී. (රූප සටහන 05)

තවද, අසාමාන්‍ය ලෙස කොටස් මිල දී ගත් පාර්ශවයන්ගෙන් කරුණු පැහැදිලි කිරීම් ලබා ගන්නා ලදී. ආවේක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබූ මුළු වාර්තාවන්ගෙන් 8 ක් වැඩිදුර විමර්ශනය සඳහා කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසු යොමු කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

අදාළ කාලය තුළ ආවේක්ෂණ තීරණ සම්බන්ධ සාරාංශයක් පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 09)

*සංඛ්‍යා සටහන 09:* **ආවේක්ෂණ තීරණ**

| නීති ක්‍රියා මාර්ග | ගණන |
|---|---|
| - ආයෝජන උපදේශකවරුන් හා තැරැව්කරුවන් සම්බන්ධයෙන් | 13 |
| - ආයෝජකයන් සම්බන්ධයෙන් | 02 |
| - අන්තර්ජාලය මගින් කොටස් ගණුදෙනු කරන්නන් සම්බන්ධයෙන් | 08 |
| - මිල කළ සමාගම් ලාභාංශ නිකුත් කිරීමට පෙර / මූල්‍ය වාර්තාවන් නිකුත් කිරීමට පෙර, එහි අසාමාන්‍ය ලෙස කොටස් ගණුදෙනු කරන්නන් සම්බන්ධයෙන් | 09 |
| - කරුණු පැහැදිලි කිරීම් (වෙනත්) | 01 |
| - සුළු පරිමාණයේ අක්‍රමිකතාවන් සම්බන්ධ | 01 |
| - කම්ටුවේ අදහස් දැක්වීම සම්බන්ධයෙන් | 02 |

2012 වසර තුළ දී ස්වයංක්‍රීය වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතිය ක්‍රමවත් ආකාරයෙන් සිදු වෙමින් පවතින අතර, එහි ඇති වැදගත් අංගයන් කිහිපයක් පහත දක්වා ඇත.

**සජීවී වෙළෙඳපොළ ආවේක්ෂණය**

- එක් එක් තැරැව්කාර සමාගම් මගින් සිදුවන ගණුදෙනුත් ඔවුන්ගේ උපදේශකයන් මගින් වන ගණුදෙනුත් වෙන වෙනම ප්‍රස්තාර මගින් ත්‍රිමානුකූලව පෙන්නුම් කරනු ලබයි.
- විවිධාකාර වූ දත්ත විශ්ලේෂණය කොට සංක්ෂිප්තව දක්වනු ලබයි.
- අක්‍රමවත් ගණුදෙනුවක් සිදු වූ විට ඒ මත ජනිත වන ස්වයංක්‍රීය නිවේදනය (Alerts) මගින් සිදුවන විශ්ලේෂණ හරහා, සිදු වූ ගණුදෙනු නැවත ක්‍රියාත්මක කිරීම මගින් බලා ගත හැක.

**විමර්ශන කළමනාකරණය**

- දිගු කලක් තිස්සේ එකම රටාවකට අනුව සිදුවන අයථා ගණුදෙනු හඳුනා ගැනීමක් මෙහිදී කෙරෙන අතර, එමගින් සජීවී ආවේක්ෂණ කටයුතුවලට අත්වැලක් ලෙස කටයුතු කරයි.
- නොයෙකුත් ආකාරයේ දත්ත විශ්ලේෂණය කොට එමගින් වාර්තාවක් නිපදවා ගත හැකි අතර, අනාගත පරීක්ෂණවල දී මේවා උපයෝගී කර ගත හැක.

**සිදු වූ ගණුදෙනු නැවත පෙන්නුම් කිරීම**

- අවශ්‍ය වූ කාල පරාසයක් තුළ සිදු වූ ගණුදෙනු නැවත ක්‍රියාත්මක කිරීමක් මගින් අයථා ගණුදෙනු පිළිබඳ විමර්ශනය කර ගත හැක.
- එකවර කොටස් වර්ග කිහිපයක සිදු වූ ගණුදෙනු පිළිබඳ විමර්ශනයක් කර ගැනීමේ හැකියාව ද ඇත.

**පද්ධති කළමනාකරණය**

- පද්ධතියේ පරිපාලන කටයුතු මෙමගින් සිදු කෙරේ.

**පසු දත්ත කළමනාකරණය (Backend data management)**

සාර්ථකව ස්ථාපනය කරනු ලැබූ ස්වයංක්‍රීය ආවේක්ෂණ පද්ධතියට අදාළව අතීත ගණුදෙනු පිළිබඳ දත්ත සජීවීව නිරීක්ෂණය කෙරුණේ සය මසක් පමණි. එහෙත් 2012 වසර තුළ දී කෙරුණු දත්ත සම්පිණ්ඩනයකට අනුව වසරකට අධික කාලයක් තුළ සිදු වූ ගණුදෙනු නැවත පුනරාවර්තනය කිරීමේ හැකියාව ඇත.

**විමර්ශන කටයුතු**

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරයේ ප්‍රධාන අංගයක් වන්නේ සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන සැක කටයුතු නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් කාර්යක්ෂම විමර්ශනයන් සිදු කිරීමයි. ඉහත කී විමර්ශන, ක්‍රමවත් හා සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමට ඉවහල් වන අතර, වෙළෙඳපොළ පිළිබඳ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ සංවර්ධනයට ද දායක වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතින් ලබා දී ඇති බලතල ප්‍රකාරව, 2012 වර්ෂයේ දී ද සැක කටයුතු වෙළෙඳපොළ අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ ඒවාට අදාළව සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියා මාර්ග ගැනීම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද අතර, එකී ක්‍රියාමාර්ග වෙළෙඳපොළට අදාළ වෘත්තීන්ගේ ගුණාත්මකභාවය සහ සමාගම්වල ක්‍රියා පිළිවෙත ඉහළ තලයක පවත්වාගෙන යාමට සහ ආයෝජකයන්, ලැයිස්තුගත සමාගම් සහ වෙළෙඳපොළ අතරමැදියන් නීති විරෝධී ක්‍රියාවන්හි නියැලීමෙන් වැළැක්වීමට බෙහෙවින් ඉවහල් විය.

ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්වයක් නිර්මාණය කිරීම, අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු, පෙර විකිණීම් ඇතුලු සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන නීති විරෝධී / අයථා ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශන 19 ක් 2012 වර්ෂය තුළ දී සිදු කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ ඒ යටතේ පනවන ලද නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් ද එම වර්ෂය තුළ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගන්නා ලදී.

ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්වයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයක් අවසානයේ දී ආයෝජන උපදේශකයන් දෙදෙනෙකුට සහ ආයෝජකයන් තිදෙනෙකුට ලිඛිතව අවවාද කිරීම සහ අදාළ කොටස් තැරැව්කාර සමාගමට ලිඛිතව අනතුරු හැඟවීම ඉහත කී ක්‍රියාමාර්ග අතරින් විශේෂ වේ.

පෙර විකිණීම් සම්බන්ධයෙන් සිදු කරන ලද තවත් විමර්ශනයක් අවසානයේ දී ආයෝජන උපදේශකයන් දෙදෙනෙකුට ලිඛිතව අවවාද කරන ලද අතර, එම අවවාද කිරීම් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කරන ලදී.

2012 වසරේ දී සිදු කරන ලද මුළු විමර්ශන සංඛ්‍යාව අතරින් විමර්ශන 2 ක් අදාළ විමර්ශනයන් දෙකට අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් අධිකරණයේ නීති කෘත්‍යයන් පැවතීම හේතුවෙන් අත් හිටුවා තිබිණි.

2012 වර්ෂය අවසානය වන විට සිදු කරන ලද / සිදු කෙරෙමින් පැවති විමර්ශනයන් සම්බන්ධ කෙටි විස්තරයක් සහ ඒවාට අදාළව ගනු ලැබූ ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ. (සංඛ්‍යා සටහන 10)

*සංඛ්‍යා සටහන 10:* විමර්ශන පිළිබඳ තොරතුරු

| **විමර්ශනයේ ස්වභාවය** | **විමර්ශන සංඛ්‍යාව** | **ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය** |
|---|---|---|
| අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු [1] | 04 | ■ සමාලෝචනය කරන ලද වර්ෂය තුළ දී අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු සම්බන්ධයෙන් විමර්ශන 4 ක් සිදු කරන ලදී.<br>■ එම වර්ෂය අවසාන වන විට, එක් විමර්ශනයක වාර්තාවක් අවසන් කර තිබූ අතර, අනෙකුත් විමර්ශන 3 ට අදාළ වාර්තා සකස් කෙරෙමින් පැවතිණි. |
| ව්‍යාජ වෙළෙඳපොළ/ මිල තත්ත්වයක් නිර්මාණය කිරීම [2] | 11 | ■ 2007 වර්ෂයේ දී යම් කරුණක් සම්බන්ධයෙන් නීති කෘත්‍යයක් පැවැත්වෙන අවස්ථාවකදී එකී කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමට කොමිෂන් සභාවට බලය පැවරෙන්නේ ද යන්න පිළිබඳව ගරු නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලදී. ඒ අනුව, විභාග වෙමින් පවතින නීති කෘත්‍යය අවසන් වන තුරු එම විමර්ශනය අත්හිටුවන ලෙස ගරු නීතිපතිවරයා විසින් උපදෙස් දී තිබූ බැවින් එකී කරුණ පිළිබඳ විමර්ශන කටයුතු 2012 වර්ෂය තුළදී ද අත්හිටුවා තබන ලදී.<br>■ 2012 වර්ෂය තුළ දී ව්‍යාජ වෙළෙඳපොළ/මිල තත්ත්වයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයක් අවසානයේ දී ආයෝජන උපදේශකයින් දෙදෙනෙකුට ලිඛිතව අවවාද කරනු ලැබූ අතර, එම අවවාදයන් ප්‍රසිද්ධියට පත් කරන ලදී. ඉහත කී විමර්ශනය අවසානයේ දී ආයෝජකයන් තිදෙනෙකුට ද ලිඛිතව අවවාද කරන ලද අතර, අදාළ ගණුදෙනු ක්‍රියාත්මක කළ කොටස් තැරැව්කාර සමාගමට ද ලිඛිත අනතුරු හැඟවීමක් නිකුත් කරන ලදී.<br>■ සමාලෝචනය කරන ලද වර්ෂය තුළ දී ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්වයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් තවත් විමර්ශන 4 ක් සිදු කරන ලද අතර, අදාළ ආයෝජකයන් සහ ආයෝජන උපදේශකයන් එම වරද සිදු කළ බවට සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි හෙළිදරව් නොවූ බැවින් එම විමර්ශන ඔවුන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමකින් තොරව අවසන් කරන ලදී.<br>■ එකම ආයෝජන උපදේශකයන් කණ්ඩායමක් විසින් සිදු කරන ලදැයි සැක කරන ලද ව්‍යාජ වෙළෙඳපොළ/මිල තත්වයක් නිර්මාණය කිරීම පිළිබඳ ආවේක්ෂණ වාර්තා 9 ක් සම්බන්ධයෙන් එක් පරිපූර්ණ විමර්ශනයක් සිදු කරන ලද අතර, 2012 වසර අවසානය වන විට එම විමර්ශනයට අදාළ වාර්තාව සකස් කෙරෙමින් පැවතිණි.<br>■ 2012 වසර අවසානය වන විට ඉහත කී විමර්ශනය ද ඇතුලුව ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්වයක් නිර්මාණය කිරීම පිළිබඳ විමර්ශන 5 ක් සිදු කෙරෙමින් පැවතුණි. |
| පෙර විකිණීම් [3] | 02 | ■ 2012 වර්ෂයේ දී අවසන් කරන ලද විමර්ශනයකින් හෙළිදරව් වූ කරුණු පදනම් කොට ගෙන ආයෝජන උපදේශකයින් දෙදෙනෙකුට ලිඛිතව අවවාද කරන ලද අතර, එකී අවවාදයන් ප්‍රසිද්ධියට පත් කරන ලදී.<br>■ 2012 වසර අවසාන වන විට පෙර විකිණීම් සම්බන්ධයෙන් එක් විමර්ශනයක් සිදු කෙරෙමින් පැවතිණි. |
| කොටස් තැරැව්කාර සමාග මක් විසින් සිදු කරන ලද සැක කටයුතු අයථා ගණුදෙනු පිළිබඳ විමර්ශනය | 01 | ■ අදාළ විමර්ශනය 2012 වසර තුළ දී අවසන් කරන ලද අතර, අදාළ විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිර්දේශය මත සහ කොමිෂන් සභා සාමාජිකයන්ගේ උපදෙස් අනුව ගරු නීතිපතිවරයාගේ උපදෙස් සඳහා යොමු කරන ලදී.<br>■ එම වර්ෂය අවසාන වන විටත් ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු නීතිපතිවරයාගේ උපදෙස් ලැබීමට නියමිතව තිබිණි. |
| පැමිණිලි | 01 | ■ පැමිණිල්ලක් පිළිබඳව සිදුකරන ලද විමර්ශන කටයුතු එම විමර්ශනයට අදාළ විෂය කරුණු අධිකරණයේ විභාග වෙමින් පවතින නීති කෘත්‍යයකට සම්බන්ධ විෂය කරුණු ද වන බැවින්, අදාළ නීති කෘත්‍යය අවසන් වන තුරු එම විමර්ශනය සිදු කිරීම අත්හිටුවා ඇත.<br>■ ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොල චෝදනා සහගත විෂමාචාර සම්බන්ධයෙන් අප වෙත ලැබෙන පැමිණිලි තක්සේරු කිරීමකට ලක් කරනු ලබයි. අප විසින් විමර්ශනයට බඳුන් කරන ලද පැමිණිලි 14ක් සම්බන්ධයෙන් කටයුතු කර විසඳුම් ලබා දී තිබේ. |

*පැමිණිලි*

අප විසින් විමර්ශනයට බඳුන් කරන ලද වසර තුල පැමිණිලි 14ක් සම්බන්ධයේන කටයුතු කරන ලද අතර විසඳුම් ලබා දී තිබේ.

---

*1. ලේඛනගත සමාගමක සුරැකුම්පත්වලට අදාළ වන්නා වූ ප්‍රසිද්ධියට පත් නොකරන ලද මිල සංවේදී තොරතුරු තමා සන්තකයේ තබා ගනිමින් එම සමාගමෙහි කොටස් ගණුදෙනු කිරීම.*

*2. කොටස් වෙළෙඳපොළක ලේඛනගත වී ඇති ඕනෑම සමාගමක සුරැකුම්පත් සම්බන්ධයෙන් එහි ගණුදෙනුවලට හෝ මිලට අදාළ ආකාරයේ ව්‍යාජ හෝ නොමග යවන සුළු වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීම.*

*3. යම් සමාගමක කොටස් සම්බන්ධයෙන් ඉදිරියේ සැලකිය යුතු මිල දී ගැනීමක් හෝ විකිණීමක් පවතින අවස්ථාවක දී ඒ සමාගමේ කොටස් ඊට පසු ගණුදෙනු කොට ලාභ ඉපයීමේ අරමුණින් සේවා දායකයකු සම්බන්ධයෙන් එම සමාගමෙහි කොටස් ගණුදෙනු කිරීම.*

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## නඩු කටයුතු:

### *ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව බී.ඒ. ජයසේකර සහ තවත් 08 දෙනෙක් (S/64721/2006)*

නවලෝක රෝහල් සමාගමේ කොටස් සඳහා ව්‍යාජ වෙළෙඳපොළ තත්වයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් චූදිතයන් නව දෙනෙකුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි මෙම නඩුව පවරා ඇත.

කොමිෂන් සභාව විසින් මෙයට පෙර අවස්ථාවල දී නීතිපතිවරයාගේ උපදෙස් මත සහ අධිකරණයේ අවසරය මත මෙම නඩුවේ 01, 02, 04, 05, 06, 07 සහ 08 වන චූදිතයන්ට එරෙහිව ගොනු කර තිබූ චෝදනා ඔවුන් විසින් කොමිෂන් සභාවේ වන්දි අරමුදලට වන්දි ගෙවීමෙන් අනතුරුව, ඔවුන්ට එරෙහිව පැවති නඩු කටයුතු සමථයකට පත් කරන ලදී. 03 වන චූදිතට එරෙහිව ගොනු කර තිබූ චෝදනා නීතිපතිතුමාගේ උපදෙස් මත දැඩි අවවාදයකට යටත්ව කොමිෂන් සභාව විසින් ඉවත් කර ගන්නා ලදී.

මෙම නඩුවේ 09 වන චූදිත සම්බන්ධයෙන් වන නඩු කටයුතු තව දුරටත් අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### *මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (H.C.M.C.A. 217/2007 and S.C. (Special Leave to Appeal) 194/2011)*

මැග්පෙක් එක්ස්පෝර්ට්ස් සමාගමේ යම් යම් වැදගත් ව්‍යාපාරික තීරණයන් වෙළෙඳපොළ වෙත වහා හෙළිදරව් නොකිරීම මගින් කොමිෂන් සභාව විසින් පනවා ඇති රීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීමේ වරද මත කොමිෂන් සභාව විසින් උක්ත කී සමාගමට සහ එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පවරන ලදී.

චූදිතයන් තිදෙනෙකුට එරෙහිව පැවති චෝදනා 2001 වසරෙහි දී කොමිෂන් සභාව මගින් වරද සමථයට පත් කරන ලදී. ලඝු නඩු විභාග යක් පැවැත්වීමෙන් අනතුරුව මහේස්ත්‍රාත්වරයා විසින් 03 වන, 05 වන, 06 වන සහ 08 වන චූදිතයන් සඳහා එක් එක් වරද සඳහා එක් අයෙකුට රුපියල් මිලියන 2.5 බැගින් දඩ නියම කරන ලද අතර, වසර දෙකක සිරගත කිරීමේ දණ්ඩනයක් ද නියම කරන ලදී.

මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දුන් විනිශ්චයට සහ සිරදඬුවමට එරෙහිව චූදිතයන් සිව් දෙනෙකු විසින් මහා අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර, 03 වන, 05 වන සහ 08 වන චූදිතයන් වරදකරුවන් බවට මහේස්ත්‍රාත් අධිකරණය මගින් ලබා දුන් තීරණය මහාධිකරණය විසින් අනුමත කරන ලදී. මහාධිකරණය විසින් ඔවුන්ට එරෙහිව ගොනු කළ චෝදනා වෙනුවෙන් රුපියල් මිලියන 3 බැගින් වන පරිදි දඩ නියම කරන ලදී. කෙසේ වෙතත් ඔවුන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දුන් සිරගත කිරීමේ දණ්ඩනය පසෙක තබන ලදී.

06 වන චූදිත මගින් මහා අධිකරණය ඉදිරියේ ගොනු කළ අභියාචනය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් මූලික විරෝධතා ගොනු කළ අතර, එකී කරුණු සැලකිල්ලට ගනිමින් මහාධිකරණය විසින් 06 වන චූදිත සඳහා නියම කළ දඩ මුදල සම්බන්ධයෙන් වූ අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වුව ද සිර දඬුවම සම්බන්ධයෙන් 06 වන චූදිත විසින් යොමු කළ අභියාචනය මහාධිකරණය මගින් පිළිගන්නා ලද අතර, එය තව දුරටත් විභාග වෙමින් පවතී.

06 වන චූදිත විසින් කොමිෂන් සභාවේ විරෝධතා සැලකිල්ලට ගෙන දඩ මුදල සම්බන්ධයෙන් මහාධිකරණය විසින් ලබා දුන් තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ඒ සඳහා අවසර ලබා දෙන ලදී.

නඩු කටයුතු අතරතුර දී, ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන තවත් නඩුවක දී මෙම නඩුවට සමාන වූ නීතිමය තත්ත්වයක් සලකා බලමින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 06 වන චූදිතට එරෙහිව මහාධිකරණය විසින් ලබා දුන් නියෝගය පසකින් තබන ලද අතර, 06 වන චූදිත විසින් සිය වරදකාරීත්වය සහ මහේස්ත්‍රාත්වරයා විසින් ලබා දුන් දණ්ඩනය යන කරුණු දෙකම සම්බන්ධයෙන් ගොනු කරන ලද ඇපෑල විභාග කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මහාධිකරණයට නියෝග කරන ලදී.

ඒ අනුව 06 වන චූදිත විසින් ගොනු කළ ඇපෑල කොළඹ මහාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### *ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව මිරමර් බීච් හෝටෙල්ස් පී. එල්. සී. සහ තවත් අය (S/72082/2010, S/72083/2010)*

2008 මාර්තු මස 31 සහ 2009 මාර්තු මස 31 වන දිනයන්ගෙන් අවසන් වන මුදල් වර්ෂ සඳහා අදාළ වන සමාගම් වාර්ෂික වාර්තා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය සභා රීතින්ගේ 3(1) සහ 17 වන රීතිය උල්ලංඝනය කරමින් කටයුතු කිරීම මත මිරමර් බීච් හෝටෙල්ස් පී. එල්. සී. සමාගමට සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු කටයුතු තව දුරටත් විභාග වෙමින් පවතී.

### *මෙල්ස්ටකොප් ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් 10 දෙනෙක් (CA රිට් 107/2012)*

මෙල්ස්ටකොප් ලිමිටඩ් විසින් 2011 සැප්තැම්බර් මස 13 වන දින ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් 2% කට වඩා වැඩි ප්‍රමාණයක් මිල දී ගැනීම මගින්, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීම තමන් වෙත උද්ගත වී ඇති බව 2012 පෙබරවාරි මස එම සමාගම විසින් කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී.

මෙල්ස්ටකොප් සමාගම විසින් 2012 පෙබරවාරි මස කොටස් වෙළෙඳපොළට නිවේදනයක් නිකුත් කරමින් තම සමාගම විසින් ඉහත කී අනිවාර්ය අර්පනය නියමිත කාල සීමාවේ දී සිදු කිරීම අපොහොසත් වී ඇති බව (සද්භාවයෙන් යුතුව) පවසමින්, එකී අර්පනය සිදු කිරීම සඳහා සහ අර්පනය කළ යුතු මිල තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අයදුම්පතක් යොමු කරන ලදී.

2012 පෙබරවාරි මස 15 වන දිනදී ද මෙල්ස්ටකොප් ලිමිටඩ් විසින් ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් 2% කට වඩා වැඩි ප්‍රමාණයක් නැවත මිල දී ගන්නා ලදී.

ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් මෙල්ස්ටකොප් සමාගම තමන් මිල්ෆර්ඩ් එක්ස්පෝට් (සිලෝන්) ලිමිටඩ් සහ ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී. එල්. සී. යන සමාගම් දෙක සමග එක්ව කටයුතු කරන බවට දක්වන ලද අතර, 2011 සැප්තැම්බර් මස 12 වන දින වන විට ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් 36.271% ද, 2011 සැප්තැම්බර් මස 13 වන දින වන 41.27% ක් ද දරන බව දක්වන ලදී. මෙයට අමතරව 2012 පෙබරවාරි මස 15 වන දින ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් තවත් 8.856% ක ප්‍රමාණයක් මෙල්ස්ටකොප් සමාගම විසින් මිල දී ගත් බව තව දුරටත් කොමිෂන් සභාවට දන්වන ලදී.

සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ යම් සමාගමක් / පුද්ගලයෙක් තමා සමග එක්ව කටයුතු කරන පුද්ගලයන් / සමාගම් සමග කිසියම් ලැයිස්තුගත පොදු සමාගමක ඡන්ද හිමි කොටස් ප්‍රමාණයෙන් 30% ත් 50% ත් අතර ප්‍රමාණයක් දරයි ද, එවන් පුද්ගලයෙකු / සමාගමක් විසින් එළඹෙන මාස 12 ක කාල සීමාව තුළ නැවත වතාවක් එකී ලැයිස්තුගත පොදු සමාගමේ ඡන්ද හිමි කොටස් ප්‍රමාණයෙන් 2% කට වඩා වැඩිපුර මිල දී ගනී නම් එවන් අවස්ථාවක දී 31 (1) (බී) වගන්තිය යටතේ අනිවාර්ය අර්පනය කළ යුතුය.

සමාගම විසින් ම ලබා දුන් ස්වකීය ප්‍රකාශනයට අනුව, මෙල්ස්ටකොප් ලිමිටඩ් විසින් (එක්ව කටයුතු කරන පාර්ශවයන් හැර) 2011 සැප්තැම්බර් මස 13 වන දින වන විට සිටින ලද ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ) පී. එල්. සී. සමාගමේ සියලුම කොටස්කරුවන් සඳහා සහ වර්තමානය වන විට සිටින ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ කොටස්කරුවන් සඳහා අනිවාර්ය අර්පනයක් සිදු කළ යුතු බවට කොමිෂන් සභාව විසින් 2012 මාර්තු මස 05 වන දින තීරණය කරන ලදී.

2011 සැප්තැම්බර් මස 13 වන දින සහ 2012 පෙබරවාරි මස 15 වන දින අතරතුර කාල සීමාවේ දී කොටසක මිල රු. 105/= ට වඩා අඩු මිලකට කොටස් විකුණා ඇති කොටස්කරුවන් වෙත එසේ විකිණූ මිලත් අර්පනයේ මිලත් අතර වෙනස වන්දියක් ලෙස ගෙවිය යුතු බවට ද කොමිෂන් සභාව තීරණය කරන ලදී.

කෙසේ වෙතත් 2012 මාර්තු මස 05 වන දින මේ සම්බන්ධව කොමිෂන් සභාව විසින් ලබා දුන් නියෝගයක් ක්‍රියාත්මක කිරීමට මෙල්ස්ටකොප් සමාගම අපොහොසත් වූ අතර, මෙල්ස්ටකොප් සමාගම විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ එහි සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස නම් කරමින්, 2011 සැප්තැම්බර් මස 13 වන දින සහ 2012 පෙබරවාරි මස 15 වන දින අතරතුර කාල සීමාවේ දී කොටසක මිල රු. 105/= ට වඩා අඩු මිලකට විකුණා ඇති කොටස්කරුවන් වෙත එසේ විකිණූ මිලත් අර්පනයේ මිලත් අතර වෙනස වන්දියක් වශයෙන් ගෙවන ලෙස කොමිෂන් සභාව විසින් 2012 මාර්තු මස 05 වන දින ලබා දුන් නියෝගය අවලංගු කරන ලෙස ඉල්ලා සිටිමින් (අනෙකුත් දේ අතර) ෂර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණය ඉදිරියේ අයදුම්පතක් ගොනු කරන ලදී.

මෙම නඩු කටයුත්ත විසඳීමට තිබෙන අතරතුර කොමිෂන් සභාව විසින් සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය උල්ලංඝනය කිරීම මත මෙල්ස්ටකොප් සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරන ලද අතර, එම නඩුව තවමත් විභාග වෙමින් පවතී.

### *ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව මෙල්ස්ටකොප් ලිමිටඩ් සහ තවත් 09 දෙනෙක් (S/74140/2012)*

මෙල්ස්ටකොප් ලිමිටඩ් විසින් ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ ඡන්ද හිමි කොටස්වලින් 2% කට වඩා වැඩි ප්‍රමාණයක් මිල දී ගෙන අනිවාර්ය අර්පනයක් නොකිරීම හේතුවෙන් සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය උල්ලංඝනය කිරීම මත 2012 ජුනි මස 13 වන දින කොමිෂන් සභාව විසින් මෙල්ස්ටකොප් සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරන ලදී.

එම නඩුව තවමත් අධිකරණය ඉදිරියේ විභාගවෙමින් පවතී.

නඩුව අතරවාරයේදී මෙල්ස්ටකොප් සමාගම විසින් කොමිෂන් සභාවට ඉල්ලීමකට අනුව 2012 මාර්තු මස 05 වන දින කොමිෂන් සභාව විසින් ලබා දුන් නියෝගය ක්‍රියාත්මක කරන්නේ නම් මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවරා ඇති නඩුව සමථ කළ හැකි බවට කොමිෂන් සභාව එකඟ වන ලදී.

ඒ අනුව මෙල්ස්ටකොප් සමාගම විසින් අභියාචනාධිකරණයේ ගොනු කොට තිබූ CA රිට් 127/2012 දරන රිට් අයදුම් පත්‍රය ඔවුන් විසින් ම ඉල්ලා අස් කර ගන්නා ලද අතර, කොමිෂන් සභාවේ නියෝගය ක්‍රියාත්මක කරන බවට ලිඛිත පොරොන්දුවක් ලබා දුන්න ද නැවත වතාවක් කොමිෂන් සභාවේ නියෝගය අභියෝග කරමින් ෂර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණය ඉදිරියේ CA රිට් 204/2012 නමින් නැවත අයදුම් පතක් මෙල්ස්ටකොප් සමාගම විසින් ගොනු කරන ලදී.

### *මෙල්ස්ටකොප් ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් 03 දෙනෙක් (CA රිට් 204/2012)*

මෙල්ස්ටකොප් සමාගම විසින් ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. සමාගමේ කළමනාකාරීත්වය මෙල්ස්ටකොප් සමාගම සතුව ඒ වන විටත් පැවති බැවින්, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ 31 (1) (බී) වගන්තිය යටතේ අනිවාර්ය අර්පනයක් කිරීමේ වගකීම මෙල්ස්ටකොප් සමාගම වෙත උද්ගත නොවන බව පවසමින් කොමිෂන් සභාව විසින් ලබා දුන් නියෝගය අවලංගු කරන ලෙස ඉල්ලමින් ෂර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණය ඉදිරියේ අයදුම් පතක් මෙල්ස්ටකොප් සමාගම විසින් ගොනු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ලංකා මිල්ක් ෆුඩ්ස් (සී. ඩබ්. ඊ.) පී. එල්. සී. , ඩිස්ටිලරීස් (සිලෝන්) ශ්‍රී ලංකා පී. එල්. සී. සහ මිල්ෆර්ඩ් එක්ස්පෝර්ට් (සිලෝන්) ලිමිටඩ් මෙම නඩුවේ 01 වන, 02 වන, 03 වන සහ 04 වන වග උත්තරකරුවන් ලෙස නම් කොට ඇත.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### *ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් (C.A. (රිට්)323/2007 සහ S.C. App. 100/2011)*

2005 මාර්තු මස 31 වන දිනෙන් සහ 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂ සඳහා අදාළ මූල්‍ය වාර්තා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති අංක 41 ට අනුකූලව පිළියෙල කරන ලෙස 2007 මාර්තු මස 09 වන දින කොමිෂන් සභාව විසින් ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගමට කළ නියෝගය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් තීරණයට එරෙහිව ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම විසින් කොමිෂන් සභාවට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයට එරෙහිව අභියාචනාධිකරණයේ අයදුම් පතක් ගොනු කරන ලදී.

සමාගම විසින් එසේ අභියාචනාධිකරණයේ ගොනු කළ අයදුම්පත් සලකා බලමින් අභියාචනාධිකරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයට ෂර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලදී.

කෙසේ වුවද අභියාචනාධිකරණය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය වෙත නිකුත් කළ ෂර්ෂියෝරාරි රිට් ආඥාව අවලංගු කරන මෙන් ඉල්ලා එකී ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ගොනු කර ඇති අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ එය තවමත් විභාග වෙමින් පවතී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබා දීමට නියමිත විනිශ්චය මත කොමිෂන් සභාව වෙත අභියාචනාධිකරණය මගින් ලබා දුන් රිට් ආඥාවේ බලාත්මක භාවය තීරණය වන බැවින් කොමිෂන් සභාව සම්බන්ධයෙන් වන නඩු කටයුත්ත පසුව විභාගයට ගැනීමට නියමිත ය.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

### *නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් (එන්. ඩී. බී.) එදිරිව සිංගප්පූරුවේ ෆාස්ට් ගේන් ඉන්ටනැෂනල් ලිමිටඩ් (13/2009/CO)*

### *නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් (එන්. ඩී. බී.) එදිරිව බහමාස් හි කටනා ලිමිටඩ් (14/2009/CO)*

### *නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් (එන්. ඩී. බී.) එදිරිව මැලේසියාවේ ආනන්ද ප්‍රකාශ් ජගයියා (15/2009/CO)*

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් (එන්. ඩී. බී.) මගින්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කරන ලද මහා බැංකුවේ ලියාපදිංචි වූ වාණිජ බැංකුවක කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් බැංකු පනත යටතේ දක්වා ඇති සීමාවෙන් ඔබ්බට කොටස් මිල දී ගැනීම මත නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් හි කොටස්කරුවන්ගේ ලේඛනයේ නම ඇතුළත් නොකරන ලද කොටස්කරුවන් තිදෙනෙකුට ලැබිය යුතු අර්ථදායී ප්‍රතිලාභ සම්බන්ධයෙන් අධිකරණයේ මතය විමසා බැලීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයෙහි මෙම නඩුව පවරන ලදී.

එකී සමාගම මගින් කොළඹ කොටස් හුවමාරුවෙහි උප ආයතනයක් වන සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ නීතිපති දෙපාර්තමේන්තුව පිළිවෙලින් පළවන, දෙවන සහ තුන්වන වග උත්තරකරුවන් ලෙස නම් කරමින් මෙම නඩුවට එක් කර ගන්නා ලදී.

අධිකරණයෙන් පිටත දී ඇති කර ගන්නා ලද සමථයකට අනුව අධිකරණයේ පවරා තිබූ නඩු කටයුතු සමථයකට පත් කරන ලදී.

### *නිදහස් වෙළෙඳ කලාපීය සහ සාමාන්‍ය සේවා සේවක සංගමය සහ තවත් අය එදිරිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය අරමුදල සහ තවත් අය S.C.F.R 587/2012*

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය අරමුදලට ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති මෙම මූලික අයිතිවාසිකම් අයදුම් පත්‍රයේ 08 වන වග උත්තරකරු ලෙස නම් කොට ඇත්තේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවයි.

සේවක අර්ථසාධක අරමුදලේ මුදල් යොදා ගනිමින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්වල සුරැකුම්පත්වල සිදු කළ යම් යම් ආයෝජනයන් සුරැකුම්පත් නීතිවලට පටහැනි ආකාරයෙන් සිදු කර ඇති බවට පෙත්සම්කරුවන් චෝදනා කරයි.

මෙම අයදුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ තවමත් විභාග වෙයි.

### බලාත්මක කිරීමේ කටයුතු :

#### *තැරැව්කාර සමාගමක ප්‍රධාන විධායක නිලධාරී / කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සේවා කටයුතු අත්හිටුවීම.*

2012 අප්‍රේල් මස 27 වන දින ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදු කළ ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී. සමාගමේ කොටස් මිල දී ගැනීමේ කටයුත්තට අදාළව එකී කොටස් මිල දී ගැනීම වෙනුවෙන් මුදල් පියවීමේ බැංකුව ලෙස කටයුතු කළ සම්පත් බැංකුවට ගෙවිය යුතු මුදල ගෙවීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව අසමත් වීම සම්බන්ධයෙන් විමර්ශන අංශය විසින් විමර්ශනයන් ආරම්භ ලදී.

විමර්ශන කටයුතු අවසන් වන තුරු මෙම කොටස් මිල දී ගැනීම සිදු කළ තැරැව්කාර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී / කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සේවා කටයුතු කොමිෂන් සභාව විසින් අත් හිටුවන ලදී.

මේ අතරවාරයේ දී සම්පත් බැංකුවට අදාළ ගෙවීම් සිදු කිරීමේ හැකියාව ලබා දීම සඳහා ද ෆිනෑන්ස් කම්පැනි පී. එල්. සී. සමාගමේ එකී කොටස්, කොටස් තැරැව්කාර සමාගම විසින් හඳුනා ගත් පුද්ගලයන් වෙත කොමිෂන් සභා පනතේ 28 (1) වගන්තියට අනුකූලව නැවත විකිණීම සඳහා කොමිෂන් සභාව අවශ්‍ය කටයුතු සලසා දෙන ලදී.

පසුව, උක්ත කී තැරැව්කාර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී / කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවට කළ ඉල්ලීමක් අනුව, තැරැව්කාර සමාගම සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු අවසන් කර තිබීම යන කරුණ ද සැලකිල්ලට ගනිමින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී / කළමනාකාර අධ්‍යක්ෂවරයාට පනවා තිබූ සේවා අත්හිටුවීම කොමිෂන් සභාව විසින් ඉවත් කරන ලදී.

මේ පිළිබඳ විමර්ශන අංශයෙන් සපයන ලද වාර්තාව ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇති අතර, කොමිෂන් සභාවේ අවසන් නිගමනය ගරු නීතිපතිවරයාගේ මතය අනුව තීරණය වනු ඇත.

### අවවාද කිරීම් :

- කොටස් ගණුදෙනුවලට මුදල් පියවීමට අපොහොසත්වීම වැළැක්වීම සඳහා වෙළෙඳපොළ ව්‍යාජ තත්ත්වයන් නිර්මාණය කරමින් ගණුදෙනුවල නිරත වූ ආයෝජකයන් තුන් දෙනෙකු වෙත අවවාද කිරීමේ ලිපි යවන ලදී. මෙවන් කටයුතු නැවත නොකරන ලෙස ඔවුනට තරයේ අවවාද කළ අතර, අනාගතයේ එවන් ක්‍රියාවක් නැවත සිදු කළහොත් ඔවුනට විරුද්ධව නඩු පවරන බවට අනතුරු අඟවන ලදී.

  ඉහත කී ආයෝජකයන් තිදෙනාට ගණුදෙනු කිරීම සඳහා පහසුකම් සලසා දුන් ආයෝජන උපදේශකවරු දෙදෙනෙකුට ද කොමිෂන් සභාව විසින් අනතුරු අඟවන ලදී.

  මෙම ගණුදෙනු සඳහා තැරැව්කරු ලෙස කටයුතු කළ සමාග මට අවවාද කිරීමක් කළ අතර, ආයෝජකයන් හට කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීම සම්බන්ධව උපදෙස් ලබාදීමේ දී ව්‍යාපාර කටයුතු ආචාර ධර්මවලට අනුකූලව කටයුතු කරන බවට සහතික වන ලෙස ද දන්වා යවන ලදී.

- එක් එක් අයගේ සේවාදායකයන් යොදා ගනිමින්, ලැයිස්තුගත සුරැකුම්පත් පෙර විකිණීම යන තත්වය යටතේ සැක සහිත ආකාරයෙන් කටයුතු කළ එකම තැරැව්කාර සමාගමේ ආයෝජන උපදේශකවරුන් දෙදෙනෙකුට දැඩි ලෙස අවවාද කරන ලදී.

### අයුතු ක්‍රියාවන් පිළිබඳව දැන්වීම් :

- කොමිෂන් සභා පනතේ 29 (A) වගන්තියේ දක්වන පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එක්තරා ලැයිස්තුගත සමාග මක් විසින් ලැයිස්තුගත නොකළ ණයකර නිකුත් කිරීම මත අයුතු ක්‍රියාවන් පිළිබඳව දැන්වීමක් පළ කරන ලෙස, කොමිෂන් සභා පනතේ 13 (j) වගන්තිය යටතේ එම සමාගමට දන්වන ලදී.
- කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීම සඳහා යොමු කළ අයදුම් පතට අමුණා තිබූ සිය හඳුන්වාදීමේ ලියවිල්ලේ, සමාගමේ වත්කම් සහ සමාගම් ගිවිසුම් සම්බන්ධයෙන් සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම සහ සම්බන්ධතාවය පිළිබඳව නොමග යවන සුළු ප්‍රකාශයක් ඇතුළත් කිරීම මත තවත් ලැයිස්තුගත පොදු සමාගමක් සඳහා අයුතු ක්‍රියාවන් පිළිබඳව දැන්වීමක් පළ කරන ලෙස දන්වා යවන ලදී.

### *කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනනුකූල ලෙස කටයුතු කිරීම :*

සමාගමේ වත්කම්, සම්බන්ධිත පාර්ශවයක් වෙත විකිණීම සම්බන්ධව වෙළෙඳපොළ වෙත නිකුත් කළ සාංගමික හෙළිදරව් කිරීම්, එකී විකිණීම හා සම්බන්ධ ඉතාමත් වැදගත් තොරතුරු කිහිපයක් මග හරිමින්

පළ කිරීම මත ලැයිස්තුගත පොදු සමාගමක සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිරවද්‍යතාවය පිළිබඳව වන සම්මතයන්වලට අනුකූලව කටයුතු කරන ලෙස අවවාද කරන ලදී.

වර්තමානයේ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත තොරතුරු ලබාදීමේ දී මෙවැනි මඟහැරීම් නොකිරීමටත් ප්‍රමාණවත් තොරතුරු වෙළෙඳපොළ වෙත ලබා දීමටත් වග බලා ගන්නා ලෙස එම සමාගමට තව දුරටත් අවවාද කරන ලදී.

එකී ලැයිස්තුගත සමාගමට, දක්වන ලද කාල සීමාවක් තුළ දී විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් අවම වශයෙන් දෙදෙනෙකු සිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලෙස ද, එම පත් කිරීම් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීතින්වල දක්වා ඇති සාංගමික යහ පාලන රීතිවල "ස්වාධීනත්වය" යන්න තීරණය කිරීමට සපයා ඇති නිර්ණායකවලට අනුකූලව සිදු කරන ලෙස ද නියෝග කරන ලදී.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

### අයවැය 2013 සඳහා යෝජනා කළ ප්‍රතිපත්ති සලකා බලා ප්‍රාග්ධන වෙළෙඳපොළට ලබා දුන් බදු සහන

- නව ලැයිස්තුගත කිරීම් : කොළඹ කොටස් වෙළෙඳපොළෙහි 2013 අප්‍රේල් සිට 2014 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදයේ ලැයිස්තුගත වන සමාගම් අවුරුදු 3 ට වැඩියෙන් 20% ක අවම මහජන තැන්පතුවක් පවත්වාගෙන යන්නේ නම් ඔවුන් සඳහා නියමිත ආදායම් බදු 50% න් අඩු කෙරේ.
- නව සමාගම් ණයකර නිකුතු : 2013 ජනවාරි 01 වන දින සිට සාංගමික ණයකරවලට අදාළ රඳවා ගැනීමේ බදු සහ පොළී මත වන ආදායම් බදු නිදහස් කරන ලදී
- ආයෝජකයන් : 2013 අප්‍රේල් 01 දා සිට ආන්තික ගණුදෙනුවල නියැලීම සඳහා කොටස් කළඹවල් හුවමාරුවට අදාළ මුද්දර ගාස්තුව නිදහස් කිරීම.
- කොටස් තැරැව්කාර ආයතනය : 2013 අප්‍රේල් 01 දා සිට ප්‍රාග්ධන අයිතම සඳහා අදාළ ක්ෂය 100% ක් අනුමත කිරීම.
- ඒකක භාර කළමනාකරණ සමාගම්
  * 2013 අප්‍රේල් 01 දා සිට ලාභ සහ ආදායම්වලට ආදායම් බදු 10% න් අඩු කිරීම.
  * 2013 ජනවාරි 01 දා සිට ඒකක භාර කළමනාකරණ ආයතන ඒකක භාරවලට සපයන සේවා සඳහා අදාළ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම.
  * වටිනාකම

    විදේශීය මුදල්වලින් යුත් ඒකක භාර සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
- ඒකක භාර ආයෝජකයන්
  * විදේශීය ආයෝජකයන්, විදේශවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විදේශීය මුදල් ගිණුම්වලට සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් තොරව ඒකක භාර වල විදේශීය මුදල් තැන්පත් කළ හැක.
  * පුද්ගලික විශ්‍රාමික අරමුදල් සහ පෞද්ගලික අර්ථසාධක අරමුදල්වලට ලැයිස්තුගත සමාගම්වල කොටස් සහ සාංගමික ණයකර ආයෝජනය කරන ඒකක භාරවල ප්‍රාග්ධනයෙන් 20% දක්වා ආයෝජනය කළ හැක.

### ශ්‍රී ලංකාවේ කොටස් ආයෝජනය සඳහා නිදහස් පර්යේෂණ ආවරණයක් සහ මුල් නිකුතු ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.

මේ සඳහා වෙළෙඳපොළ සාමාජිකයන් සහ ආයෝජන කරන මහජනතාවගෙන් අදහස් ලබා ගැනීම සඳහා උපදේශන පත්‍රිකාවක් නිකුත් කරන ලදී. එම උපදේශන පත්‍රිකාව තුළ මැලේසියාව, ඉන්දියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය සහ යුරෝපය යන රටවල පැවතෙන නිදහස් පර්යේෂණ ආවරණ පිළිබඳව තොරතුරු ඇතුළත් විය. උපදේශන පත්‍රිකාවට ලද පිළිතුරු මගින් දැනටත් ලැයිස්තුගත වීමට බලාපොරොත්තු වන සමාගම්වලට නිදහස් පර්යේෂණ ආවරණයක අවශ්‍යතාවය දැඩිව අවධාරණය කෙරිණි.

### ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම.

ශ්‍රී ලංකා මිල දර්ශකය MSCI (Morgan Stanley Capital International) වර්ගීකරණයෙන් "නැගී එන වෙළෙඳපොළ" තත්ත්වයට ඉහළ දැමීම මේ යටතේ ප්‍රධාන ව්‍යාපෘතියකි. මේ සම්බන්ධයෙන් ආයතනය, MSCI සමඟ කටයුතු කර MSCI වෙළෙඳපොළ වර්ගීකරණයන්, MSCI දර්ශක ගණනය කරන ආකාරයන්, වෙළෙඳපොළ ද්‍රවශීලතා සඳහා රටවල් වර්ගීකරණයන් ශ්‍රී ලංකාවට අදාළ MSCI වෙළෙඳපොළ ප්‍රවේශයන් ඇගයීමේ ශ්‍රේණිය සහ දැනට MSCI සීමාස්ථ වෙළෙඳපොළ වර්ගීකරණය යටතේ ලියාපදිංචි ශ්‍රී ලාංකික ලැයිස්තුගත සමාගම්වලට අදාළ තොරතුරු ලබා ගන්නා ලදී. ඉන්පසුව ශ්‍රී ලංකා මිල දර්ශක ඉහළ දැමීම පිණිස ගත යුතු ක්‍රියා මාර්ග තීරණය කරන ලදී.

### සමාගම් ලැයිස්තුගත කිරීමේ කාල පරාසය අවම කිරීමේ අරමුණින් ලංකා ක්ලියර්, කොළඹ කොටස් වෙළෙඳපොළ සහ මධ්‍යම තැන්පතු ක්‍රමය සමගින් මුල් නිකුතුවලට ආදේශක ගෙවීම් ආකාරයක් සකස් කිරීම.

මේ සඳහා ලංකා ක්ලියර්, කොළඹ කොටස් වෙළෙඳපොළ, මධ්‍යම තැන්පතු ක්‍රමය සහ මුල් නිකුතු ලියාපදිංචිකරුවන් සමගින් සාකච්ඡා කළ අතර, එහිදී මුල් නිකුතු ලැයිස්තුගත කිරීමේ ක්‍රියා පටිපාටිය, විකල්ප ගෙවීම් මාධ්‍යයන් ද සාකච්ඡා කරන ලදී. එසේම යෝජිත මුල් නිකුතු ආදේශක ගෙවීම් පටිපාටිය වාර්ෂික හමුවේ දී බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් හට ද ඉදිරිපත් කරන ලදී.

### ඒකකභාර සමඟ උපදේශන සාකච්ඡා පැවැත්වීම.

ඒකකභාර කර්මාන්තය දියුණු කිරීමට අදාළ අදහස් ඒකක භාර සංගමයෙන් ලබා ගැනීම පිණිස උපදේශන සාකච්ඡා ඒකක භාර සංගමය සමග පවත්වන ලදී. එහිදී රජය සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියා මාර්ග ද සාකච්ඡා කරන ලදී.

### මහ බැංකුවට කරන ලද ඉදිරිපත් කිරීම්

බැංකු සහ මූල්‍ය සමාගම්වල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් ගණනය කිරීමේ දී රාජ්‍ය සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කරන ඒකක භාර ද එහි අර්ථකතනයට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම් කරන ලදි. එසේම විශ්‍රාම අරමුදල් සහ අර්ථසාධක අරමුදල් විසින් රාජ්‍ය සුරැකුම්පත්වල කරන අනිවාර්ය ආයෝජන යටතට ඇතුළත් කිරීමත් මේ යටතේ අදාළ වේ.

### සකලවිධ යෝග්‍යතා ඇති විවිධාංගීකරණ වත්කම් පන්ති සහිත භාණ්ඩ සහ ව්‍යුත්පන්න වෙළෙඳපොළක් ස්ථාපනයට පහසුකම් සැලසීම.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශය ආරම්භයේ සිට මේ දක්වා ව්‍යාපෘතියට පහසුකම් සලසන්නා ලෙස කටයුතු කර ඇති අතර, එහි ප්‍රධාන අංගයන් දෙකක් වන්නේ ජාතික ප්‍රතිසම්පාදන නියෝජ්‍යායතනයේ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

රෙගුලාසිවලට අනුව ගැලපෙන වෙළෙඳපොළ ක්‍රියා කිරීමට සුදුසු ආයතනය සහ තාක්ෂණික දැනුම ලබා දීම සඳහා උපදේශන සේවා ආයතනය තෝරා ගැනීමයි. තවද මෙම අංශය කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රතිසම්පාදන කාරක සභාව සහ මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සහ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන සේවා ප්‍රතිසම්පාදන කමිටුවලට අදාළ සාකච්ඡාවලට පහසුකම් සලසන ලදී. මෙම කමිටුවල විවිධ රාජ්‍ය ආයතන නියෝජනය කරන නියෝජිතයන් ඇතුළත් විය. එසේම මෙම ආයතනය විසින් එම කමිටුවලට අදාළ ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමට අවශ්‍ය වාර්තා / තොරතුරු ලබාදීමත් සිදු කරන ලදී.

### හඬ පටිගත කිරීමේ උපක්‍රමයක් හඳුන්වාදීම

කොටස් තැරැව්කරුවන්ට ලැබෙන ආයෝජකයන්ගේ උපදෙස් වාර්තාගත කිරීම සඳහා හඬ පටිගත කිරීමක් හෝ ලිඛිත මාධ්‍යයක් භාවිත කිරීමට අදාළ උපදෙස් කොළඹ කොටස් වෙළෙඳපොළේ කොටස් තැරැව්කාර නීතිවල කාණ්ඩ අංක 3.2 යටතේ ඇතුළත් කිරීම.

### අවදානම් කළමනාකරණය කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ගෙවීමට එරෙහි පැවරීම් පදනම ක්‍රියාත්මක කිරීම (Delivery Vs Payment) යාන්ත්‍රණය, අවදානම් කළමනාකරණය කිරීමේ පද්ධතිය සහ නිෂ්කාශන ආයතනය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම.

2011 පෙබරවාරි 8 වන දින පැවති කොමිෂන් සභා රැස්වීමේ දී ගත් තීරණයකට අනුව මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම වේගවත් කිරීම ප්‍රමුඛතාවයන් ලෙස හඳුනා ගන්නා ලදී. කොමිෂන් සභාව විසින් මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් සහ අවදානම් කළමනාකරණ කාරක සභාවක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ඇතුළත් කර පිහිටුවන ලදී. එහි මූලික අරමුණ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමයි. මෙම කමිටුව එම කාර්ය භාරය ඉටු කරන ලදී. ගෙවීමට එරෙහි නිදහස් කිරීමේ පද්ධතියක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් ඉන්දියාවේ ජාතික කොටස් වෙළෙඳපොළ තෝරා ගන්නා ලදී.

### අවම තැරැව්කාර ගාස්තු, මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තු සහ භාරකාර බැංකුවලට අදාළ ගාස්තු වෙනස් කිරීම.

මේ අනුව පුවරුවේ දැමිය හැකි කොටස් ප්‍රමාණය එක කොටසකට ද, අවම තැරැව්කාර ගාස්තුව රුපියල් 10 සහ අවම මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව වන රුපියල් 5 ද ඉවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් මිලියන 50 ට වැඩි ගණුදෙනු සඳහා අදාළ වූ 0.64% තැරැව්කාර ගාස්තුවක් සහ 0.024% මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව 2012 අප්‍රේල් 10 වන දින සිට ඉවත් කරන ලදී. තවද භාරකාර බැංකුවලින් භාරකාර ගණුදෙනු සඳහා අය කරන රුපියල් 25 ක ගාස්තුවත් 2012 මාර්තු මස 19 වන දින සිට ඉවත් කරන ලදී.

### ආයෝජන බැංකු සමග උපදේශන සාකච්ඡා පැවැත්වීම.

මුල් නිකුතු කළමනාකරුවන් / ආයෝජන බැංකුවලින් නව ලැයිස්තුගත කිරීම් ප්‍රවර්ධනය කිරීම, කොළඹ කොටස් වෙළෙඳපොළේ ද්‍රවශීලතාවය ඉහළ දැමීම සහ සාංගමික ණයකර වෙළෙඳපොළ දියුණු කිරීමට අදාළ අදහස් සහ යෝජනා ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්විණි. එහිදී රජය සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියා මාර්ග ද සාකච්ඡා කරන ලදී.

### රජයට කරන ලද ඉදිරිපත් කිරීම්

පෞද්ගලික අර්ථසාධක අරමුදල්, ඉතුරුම් අරමුදල්, විශ්‍රාම අරමුදල්, භාරකාර අරමුදල්, පාරිතෝෂික අරමුදල්වලට ලැයිස්තුගත සුරැකුම්පත්වල උපරිම 20% දක්වා ආයෝජනය කිරීමට අවශ්‍ය නීතිමය තත්ත්වය අංක 1704/18 දරන ගැසට් පත්‍රය මගින් ලබාදීමට අවශ්‍ය නියෝජනයන් රජයට ලබා දීම. මෙයට ද අදාළව ආයෝජකයන්ගේ දැනුම පුළුල් කිරීම උදෙසා මාධ්‍ය නිවේදනයක් සහ පුවත්පත් වාර්තාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

### අනෙකුත් ක්‍රියාකාරකම්

- බිලූම් බර්ග් තොරතුරු ජාලයේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා වෙනම පිටුවක් සකස් කරන ලදී.
- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි නව වෙළෙඳ සාමාජිකයන් සඳහා, ක්‍රියාත්මක වන දෙවන වසර තුළ දී කොළඹින් පිටත තැරැව්කාර ආයතන ශාඛා දෙකක් විවෘත කිරීමේ අවශ්‍යතාවය වසරකින් දීර්ඝ කිරීම සඳහා පහසුකම් සැලසීම.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු කටයුතු

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය විසින් බලපත්‍ර ලබාදීමේ විභාග පරීක්ෂණයන්, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් තව දුරටත් දියත් කළ අතර, සුරැකුම්පත් ක්ෂේත්‍රයේ නියැලි වෘත්තිකයන් සඳහා අඛණ්ඩ අධ්‍යාපනික අවස්ථාවන් ලබාදීමට කටයුතු කරන ලදී.

### සුදුසුකම් ආකෘතිය

සුදුසුකම් ආකෘතිය තුළ "ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව", "ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය" හා "ප්‍රාග 'ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව" යනුවෙන් ප්‍රධාන සුදුසුකම් තුනක් පවතී. සලකා බලන වසර තුළ අප විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා වෘත්තිකයන් උසස් තත්වයකට වර්ධනය කිරීමට සහාය වන අතරතුර තැරැව්කාර ආයතනයන්හි පුහුණු ආයෝජන උපදේශකවරුන් සඳහා අවම සුදුසුකමක් පවත්වාගෙන යාමේ අරමුණින් සුදුසුකම් ආකෘතිය ක්‍රියාවට නැංවීම තව දුරටත් සිදු කරන ලදී.

2011 වසරේ දී හඳුන්වා දුන් තාවකාලික බලපත්‍ර ක්‍රමවේදය 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් විය. "තාවකාලික සුදුසුකම" නමින් හැඳින් වූ මෙම තාවකාලික බලපත්‍රය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා සංශෝධිත පනතේ 13 (C) වගන්තිය යටතේ වූ විධානයක් මගින් ක්‍රියාත්මක විය. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ පළමු වන අදියර වන "හිමිකම් සුරැකුම්පත්" අදියර සම්පූර්ණ කර ඇති හා "මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම" නැමැති අනිවාර්ය දේශන වැඩමුළුවට සහභාගී වූ ලැයිස්තුගත තැරැව්කාර ආයතනයක සේවයේ නියුතු සිසුන් මෙම තාවකාලික බලපත්‍රය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීය. එකී වලංගුතාවය පවතින කාල පරිච්ඡේදය තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය විසින් අනිවාර්ය දේශන වැඩමුළු 6 ක් පවත්වන ලද අතර, පුහුණු ආයෝජන උපදේශකවරුන් සඳහා තාවකාලික බලපත්‍ර 238 ක් ප්‍රදානය කරන ලදී. (සංඛ්‍යා සටහන් 11, 12)

*සංඛ්‍යා සටහන 11:* ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර (CCM) විභාගයේ සංඛ්‍යානමය සාරාංශය- 2012

| | CCM සඳහා ලියාපදිංචි සමස්ත සිසුන් | හිමිකම් සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද | ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද | මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම අදියර සම්පූර්ණ කරන ලද | CCM සම්පූර්ණ කරන ලද | ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය සම්පූර්ණ කරන ලද |
|---|---|---|---|---|---|---|
| **සිංහල මාධ්‍ය** | | | | | | |
| අනු එකතුව | 108 | 98 | 136 | 151 | 132 | 60 |
| **ඉංග්‍රීසි මාධ්‍ය** | | | | | | |
| අනු එකතුව | 222 | 85 | 106 | 94 | 118 | 45 |
| | | | | | | |
| එකතුව | 330 | 183 | 242 | 245 | 250 | 105 |

*සංඛ්‍යා සටහන 12:* ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර හා ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය සඳහා පවත්වන ලද වැඩ සටහන් සාරාංශය (2012)

| වැඩසටහන | අදියර | වසර තුළ පවත්වන ලද විභාගයන් ගණන | සමත් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 6 | 66% |
| | ණය සුරැකුම්පත් | 4 | 75% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම | 3 | 73% |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 2 | 74% |
| | ණය සුරැකුම්පත් | 2 | 71% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම | 2 | 79% |
| ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය | | | |
| (ඉංග්‍රීසි මාධ්‍ය) | අදාළ නැත | 14 | 70% |
| (සිංහල මාධ්‍ය) | අදාළ නැත | 19 | 75% |

### *ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DCM)*

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයන හා පුහුණු අංශය විසින් සලකා බලන කාලය තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ කටයුතු සිදු කළ අතර පළමු කණ්ඩායමේ දේශන සම්පූර්ණ කරන ලදී. දී ඇති කාලය තුළ විභාග පරීක්ෂණයන් නිම කරන ලෙස සිසුන්ව දැනුවත් කරන ලදී.

### *ආයෝජක වැඩසටහන හා උසස් ආයෝජක වැඩසටහන*

ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය විසින් වර්තමාන හා අනාගත ආයෝජකයන් උදෙසා සුරැකුම්පත් ගණුදෙනු සම්බන්ධ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අවබෝධයක් ලබාදීමේ අරමුණින් වැඩසටහන් දෙකක් පවත්වන ලදී. මෙම වැඩසටහන් දෙක සඳහා සහභාගීකරුවන් 56 දෙනෙකු සහභාගී විය.

### *මූල්‍ය ජනමාධ්‍ය සහතිකපත්‍ර පාඨමාලාව*

2012 වසර තුළ බැංකු අධ්‍යයන කේන්ද්‍රය සමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයන හා පුහුණු අංශය "ජනමාධ්‍යකරුවන් සඳහා ආර්ථික විද්‍යාව, බැංකුකරණය හා මූල්‍ය ඩිප්ලෝමාව" සිංහල මාධ්‍යයෙන් පවත්වන ලදී. සලකා බලන කාලය තුළ එක් වැඩසටහනක් සම්පූර්ණ කළ අතර, දෙවැනි වැඩසටහන ද ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ නියුතු මාධ්‍යවේදීන්ට මූලික අධ්‍යාපනය හා පුහුණුව ලබා දීමට මෙන්ම කර්මාන්තය තුළට තරුණ මාධ්‍යවේදීන් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම වැඩසටහන සකස් කරන ලදී.

### *සහතික හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය*

ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය විසින් සිය දෙවැනි සහතික හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2012 දෙසැම්බරයේ දී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී අන්තර්ජාතික මූල්‍ය සහයෝගීතා අමාත්‍ය හා නියෝජ්‍ය මුදල් අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා හා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධානී අජිත් නිවාඩ් කබ්රාල් මහතා යන විශේෂිත ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. එදින 700 කට අධික සිසුන් පිරිසක් සිය සහතිකපත් ලබා ගන්නා ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

### *අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් (CPD)*

දේශීය හා අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ මෑත කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව ආයෝජන උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා සලකා බලන කාලය තුළ අවශ්‍යතාවයන්ට අනුව සැකසූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 11 ක් පවත්වන ලදී. තැරැව්කාර ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකවරුන්, විශ්ලේෂකවරුන් හා ක්ෂේත්‍රයේ වෘත්තිකයන් ඇතුළත්ව 1130 කට අධික පිරිසක් මෙම වැඩ සටහන් සඳහා සහභාගී විය. කොළඹ කොටස් වෙළෙඳපොළේ ගණුදෙනු බලපත්‍රය අලුත් කිරීම වෙනුවෙන් ක්ෂේත්‍රයේ වෘත්තිකයන් විසින් අවම වශයෙන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් දෙකකට සහභාගීවීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනිවාර්ය කර ඇත.

### *ලැයිස්තුගත සමාගම්හි අධ්‍යක්ෂවරුන් සඳහා වැඩසටහන*

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයන හා පුහුණු අංශය විසින් ලැයිස්තුගත සමාගම්හි අධ්‍යක්ෂවරුන් සඳහා වැඩසටහනක් "අන්තර් පාර්ශව ගණුදෙනු" යන නමින් 2012 නොවැම්බර් මස කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලදී. BDO උපදේශන සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ නිශාන් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. සාකච්ඡා මණ්ඩලයෙහි සාමාජිකයන් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය නාලක ගොඩහේවා මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සභාපති සුජීව රාජපක්ෂ මහතා, අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සභාපති රොනී පීරිස් මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර මහතා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ- සුපරීක්ෂක, සුරනා ප්‍රනාන්දු මෙනෙවිය ඇරයුම් ලබා තිබුණි. සමාගම් 102 ක් නියෝජනය කරමින් ලැයිස්තුගත සමාගම්හි අධ්‍යක්ෂවරුන් හා වෙළෙඳපොළ වෘත්තිකයන් ඇතුළත්ව නිලධාරීන් 256 ක් මෙම වැඩසටහනට සහභාගී විය.

### *පරිගණක ආශ්‍රිත ඇගයීමේ පද්ධතිය*

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයන හා පුහුණු අංශයෙහි පරිගණක ආශ්‍රිත ඇගයීමේ පද්ධතිය 2012 අගෝස්තු මස දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු සභාපති තිලක් කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේදී විවෘත කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් හා සේවක මණ්ඩලය ද මෙම අවස්ථාවට සම්බන්ධ විය.

### *ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය*

ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය සලකා බලන කාලය තුළ ද ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාලයන්හි ප්‍රාග්ධන වෙළෙඳපොළ අංශයෙහි ඉහළ දක්ෂතා නිරූපනය කරන්නා වූ උපාධි අපේක්ෂකයන්ට ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනමයි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික විශ්ව විද්‍යාල 11 ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත. සලකා බලන වසර තුළ විශ්ව විද්‍යාල 11 අතුරින් කැලණිය විශ්ව විද්‍යාලය, වයඹ විශ්ව විද්‍යාලය, අග්නිදිග විශ්ව විද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, රජරට විශ්ව විද්‍යාලය, රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා සබරගමු විශ්ව විද්‍යාලය සඳහා ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනමන ලදී.

### *පර්යේෂණ සඳහා ප්‍රදාන ලබා දීමේ ව්‍යාපෘතිය*

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයන හා පුහුණු අංශය විසින් පර්යේෂණ සඳහා ප්‍රදාන ලබා දීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කළ අතර, සලකා බලන කාලය තුළ තෝරා ගත් පර්යේෂකයන් සඳහා මුදල් ත්‍යාග ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ විවිධ පර්යේෂණ කටයුතු භාර ගැනීම සඳහා අධ්‍යාපනඥයින් හා වෘත්තිකයන්ට ආරාධනා කිරීමට හා උපාධි අපේක්ෂකයින්, අධ්‍යාපනඥයින් හා වෘත්තිකයන් අතර ඉහළ ගුණත්වයේ පර්යේෂණ සඳහා පෙළඹවීමක් ඇති කිරීමට මෙම වැඩ සටහන ආරම්භ කරන ලදී.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් කිරීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජයේ වෙසෙන විවිධ තරාතිරමේ පාර්ශවයන් අතර ඇති මූල්‍ය සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීමට මහත් පරිශ්‍රමයක් දරමින් සිටින අතර, එහි අපේක්ෂාව වනුයේ ආයෝජක ප්‍රජාවට වඩාත් නිවැරදි වූ ආයෝජන තීරණ ගැනීමට වැඩිපුර අවස්ථාව උදා කර දීමයි.

### ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදු කළ දැනුවත් කිරීම්

විවිධ ඉලක්කගත ශ්‍රාවක පිරිස් වෙත ළඟාවෙමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම පුළුල් කිරීමට ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍ය මගින් ඉටු කළ සේවය අති විශාලය.

### *ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම මිනුම තරඟය 2012.*

වෙනත් වසරවල මෙන් මෙම වසරේදී ද ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අන්තර් පාඨශාලීය දැනුම මිනුම තරඟය අති සාර්ථකව පැවැත්වීය. සිංහල මාධ්‍ය වාණිජ විෂය ධාරාව ඉගැන්වෙන සියලුම රජයේ පාසල් ආවරණය වන පරිදි එය සෑම වසරකම පවත්වනු ලබයි. අදියර 3 ක් යටතේ එය මෙහෙයවන ලද අතර, මූලික වටයේ තෝරා ගැනීමේ තරඟ විභාගය, අවසන් පූර්ව තරඟය හා අවසාන මහා තරඟය ඊට අයත් විය. එක් එක් පළාතකින් ඉහළම ලකුණු ලබා ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6 දෙනෙකු අවසන් පූර්ව තරඟය සඳහා තෝරා ගැණුනු අතර, ඒ අනුව උතුරු පළාත හැර සෙසු පළාත් 8 න් ඉහළම ලකුණු ලබා ගත් 8 දෙනා අවසන් පූර්ව තරඟය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. ඒ අනුව 2012 අන්තර් පාඨශාලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම මිනුම අවසන් මහා තරඟයේ ජයග්‍රහණය හිමිවූයේ මධ්‍යම පළාත නියෝජනය කළ නුවර එළිය ගුඩ් ෂෙපර්ඩ් බාලිකා මහා විද්‍යාලය නියෝජනය කළ ශිෂ්‍යාවයි. සියලුම ජයග්‍රාහකයින්ට වටිනා මුදල් ත්‍යාග හා සහතිකපත් පිරිනමන ලදී. මෙම තරගය ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශනය විය.

### *පුවත්පත් ලිපි මාලාව*

දෙනික ලංකාදීප හා ඩේලි මිරර් පුවත්පත් තුළින් 2011 වසරේ සිට පළ වූ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව සැකසුණු ලිපි මාලාව තව දුරටත් අඛණ්ඩව 2012 වසර පුරා ද පළ කරන ලදී. එමෙන්ම තවත් ලිපි මාලාවක් අද පුවත්පත හා වීරකේසරී පුවත්පත කේන්ද්‍ර කර ගනිමින් පළ කිරීමට ද හැකි විය. මෙම ලිපි මගින් දැනට ආයෝජනය කරමින් සිටින සහ ඉදිරියේ දී ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින විශාල ආයෝජක පිරිසකට අවම පිරිවැයක් යටතේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ නිවැරදි ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා ගැනීමටත් අවස්ථාව උදා වූ අතර, එය ලිපි මාලාව පරිශීලනය කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත එවා තිබූ අපමණ ප්‍රතිචාර මගින් මනාව පැහැදිලි වෙයි.

### සම්මන්ත්‍රණ, වැඩමුළු හා ප්‍රදර්ශන මගින් ලබා දුන් අධ්‍යාපන හා දැනුවත් කිරීම්

ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ආයෝජකයන්ට අවස්ථාව උදා කර දෙමින් විවිධ මට්ටමේ ඉලක්කගත කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ පැවැත් වූ අතර ප්‍රදර්ශන, වැඩමුළු හා අනෙකුත් වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ද ක්‍රියාකාරී ලෙස සහභාගී විය.

### සම්මන්ත්‍රණ හා වැඩමුළු

පාසල් සිසුන්, ගුරු භවතුන්, වෘත්තිකයන් හා ආයෝජකයන් ඇතුළු විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අවබෝධය හා දැනුම ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් සියලුම පළාත් ආවරණය වන පරිදි සම්මන්ත්‍රණ හා වැඩමුළු රාශියක් පවත්වන ලද අතර, හොඳින් දැනුවත් වූ ආයෝජක ප්‍රජාවක් බිහි කිරීමේ අභිප්‍රාය මේ සියල්ලේ අවසාන අරමුණ විය. (රූප සටහන 06)

රූප සටහන 06: දැනුවත් කිරීමේ වැඩසටහන්




### ආයෝජක දින වැඩසටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2012 වසරේ දී දිස්ත්‍රික් මට්ටමේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල කාර්යාල හා සම්බන්ධ වෙමින් මඩකලපුව, මාතලේ හා ත්‍රිකුණාමලය යන නගරවල දී ආයෝජක දින වැඩසටහන් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ, කොටස් තැරැව්කාර සමාගම් හා ඒකක භාර කළමනාකරණ සමාගම් යනාදී ආයතන නියෝජිතයන් එකම ස්ථානයක දී හමුවීමට ආයෝජකයන්ට අවස්ථාව සැලසුණු අතර, වඩාත් ඵලදායි ලෙසත් ජනතාවට හිතැති අයුරින් මෙම වැඩමුළු සංවිධානය කිරීමත් කැපී පෙනෙන ලක්ෂණයක් විය. ග්‍රාමීය ජනතාව තුළ ඇති මූල්‍ය සාක්ෂරතාවය පහළ මට්ටමක පවතින අතර, ඔවුන් ඉලක්ක කර ගනිමින් මෙම සියලුම ආයෝජක දින වැඩසටහන් සංවිධානය කරන ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ මනා පළපුරුද්දක් ඇති වෘත්තිකයන් විසින් දේශන පැවැත් වූ අතර, අවසානයේ දී වැඩමුළුවට සහභාගීවූවන්ට ප්‍රශ්න ඇසීමටත්, ඒ සඳහා පිළිතුරු ලබාදීමටත් අවස්ථාවක් සලසා දෙන ලදී. මෙවැනි වැඩසටහන් මගින් සාම්ප්‍රදායික බැංකු ආයෝජනවලම රැඳී නොසිට ඉන් එහා ගිය කොටස් ණයකර ආදී සුරැකුම්පත්වල ආයෝජනය හා එහි ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්වීමේ අවස්ථාවන් පුළුල් කිරීමක් ද අපේක්ෂා කරන ලදී.

### ප්‍රදර්ශන හා වෙළෙඳ ප්‍රදර්ශන

54 වන ජාතික නිදහස් දිනයට සමගාමීව 6 වන දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය අනුරාධපුර ඔයාමඩුවේ දී උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණු අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ද ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් එයට සම්බන්ධ විය. මෙම වාර්ෂික ජාතික ප්‍රදර්ශනයට විශාල ජන සහභාගීත්වයක් දැක ගත හැකි වූ අතර, ග්‍රාමීය ජනතාවට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ තම දැනුම අවබෝධය පුළුල් කර ගැනීමට ද අවස්ථාව උදා වී තිබුණි.

තවද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ ආනන්ද විද්‍යාලය එහි 125 වැනි සංවත්සරය අළලා මාර්තු මස දී සංවිධානය කළ අධ්‍යාපනික හා වෙළෙඳ ප්‍රදර්ශනයට ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් සහභාගී විය. එමගින් පාසල් සිසුන් ඇතුළු තරුණ ප්‍රජාව තුළ ඉතුරුම් ආයෝජනය ඇතුළු ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඇති උනන්දුව වර්ධනය කිරීමත් සහ පුළුල් දැනුමක් ලබාදීමත් බලාපොරොත්තු විය.

### අනෙකුත් ක්‍රියාකාරකම්

### ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳපොළ අධීක්ෂණය හා නියාමනය පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණය - 2012 (APEC FRTI Regional Seminar)

ආසියානු සංවර්ධන බැංකුවේ ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා මූල්‍ය නියාමකයන් පුහුණු අංශය (Asia Pacific Economic Cooperation Financial Regulators Training Initiative) විසින් කොළඹ දී සංවිධානය කළ ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳපොළ අධීක්ෂණය හා නියාමනය පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සත්කාරකත්වය දක්වන ලදී. මෙම වැඩසටහන මෙහෙයවන ලද්දේ ඕස්ට්‍රේලියානු සුරැකුම්පත් හා ආයෝජන කොමිසමේ (ASIC), ඉන්දීය සුරැකුම්පත් සහ විනිමය මණ්ඩලය (SEBI) හා කොරියානු කොටස් හුවමාරුව යන ආයතනවල නිලධාරීන් තිදෙනෙකු විසිනි. ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳපොළක ගණුදෙනු, නියාමන රාමුවේ ආරම්භය, ව්‍යුත්පන්න සුරැකුම්පත් උපකරණ හා එහි ලක්ෂණ, ගණුදෙනු යාන්ත්‍රණය, අධීක්ෂණය හා අවදානම් කළමනාකරණය, ආවේක්ෂණය හා ගණුදෙනු සමථ කිරීම යනාදී අංශයන් පිළිබඳව නියාමන හා අධීක්ෂණ කරුණු සමස්ත වැඩසටහන තුළින් සාකච්ඡාවට බඳුන් විය. මේ සඳහා විදේශීය රටවල් 13 නියෝජිතයන් 24 ක් හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දේශීය නියෝජිතයන් 21 දෙනෙකු ද සහභාගී විය.

## මානව සම්පත

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මානව ප්‍රාග්ධනය සලකනු ලබන්නේ ඉතාමත්ම උපායශීලී සම්පත වශයෙන් වන බැවින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මානව සම්පත ඔවුන්ගේ කැපවීම සහ වෘත්තීමය නිපුණත්වය වෙනුවෙන් ප්‍රශංසා කිරීම, ගෞරව කිරීම, රැකබලා ගැනීම සහ අගය කිරීම කරනු ලබයි. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආයතනික අරමුණු ඉෂ්ට කර ගැනීමෙහිලා විශේෂිත වූ විෂය පථ හා බැඳී පවතින මානව සම්පත් ශක්තීන් මහත් පිටුවහලක් ලබා දේ.

### කාර්ය මණ්ඩල සංයුතිය

අප නිරන්තරයෙන් උත්සාහ කරනු ලබන්නේ ඉතා හොඳින් ගැළපෙන (ඉතාමත්ම සුදුසු) බඳවා ගැනීම් සිදු කිරීමට වන අතර, නිවැරදි නිපුණතාවයෙන් හෙබි පුද්ගලයන් රඳවා තබා ගැනීමට මූලික අවධානය යොමු කරන්නෙමු. අදාළ වර්ෂය තුළ විධායක නිලධාරීන් පස් දෙනෙකු සහ එක් කාර්යාල සහායක තනතුරක් ඇතුළුව නවක බඳවා ගැනීම් 6 ක් වාර්තා වන අතර, එක විධායක නිලධාරියකු සේවයෙන් ඉවත් වී ඇත. එක් විධායක නිලධාරිනියක ඇයගේ පෙර කාර්යක්ෂමතාවය සහ යහපත් හැසිරීම අගය කරමින් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරිනියක ලෙස උසස් කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

බඳවා ගැනීම් පටිපාටියට ගැලපෙන අයුරින් අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා ඉහළ තනතුරුවලට ඉල්ලුම් කිරීමේ හැකියාව නිතරම ලබා දී ඇත. ඒ අනුව තරඟකාරී තෝරා ගැනීම් පටිපාටියකින් පසුව අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ නීති හා රෙගුලාසි, සහ රහස්‍ය ලේකම් යන තනතුරු අභ්‍යන්තරව බඳවා ගන්නා ලදී. පසුගිය වසර 18 ක කාලය තුළ සුරැකුම්පත් හා විනිමය කොමිසම වෙත ලබා දුන් සේවය අගය කරමින් විමර්ශන කටයුතු පිළිබඳ හිටපු අධ්‍යක්ෂවරයා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට උසස් කිරීමට ද කොමිසම පියවර ගන්නා ලදී.

ශ්‍රී ලාංකීය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි නව සංවර්ධන ක්‍රියා මාර්ග සහ අභියෝගවලට සාර්ථකව මුහුණ දීමේ අරමුණින් වර්ෂාවසානයට පවත්වන ලද විධිමත් අධීක්ෂණයකට අනුව නව කාර්ය මණ්ඩල තනතුරු දොළහක් සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අනුමැතිය ලැබිණි. (සංඛ්‍යා සටහන 13)

*සංඛ්‍යා සටහන 13:* කාර්ය මණ්ඩල සංයුතිය 2012 දෙසැම්බර් 31 වන දිනට

| තනතුර | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වර්තමානයේ සේවයේ නියුක්ත සංඛ්‍යාව | | පුරප්පාඩු | |
|---|---|---|---|---|---|
| | | ස්ථිර තනතුරු | කොන්ත්‍රාත්තු පදනමට | යටපත් කරන ලද | පිරවීමට නියමිත |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | - | 1 | | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | | | - |
| අධ්‍යක්ෂ | 11 | 6 | | 1 | 4 |
| සහකාර අධ්‍යක්ෂ | 5 | 2 | | | 3 |
| කළමනාකරු | 8 | 5 | | | 3 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 43 | 9 | | | - |
| විධායක නිලධාරීන් | | 27 | | | 7 |
| විධායක නොවන නිලධාරීන් | 17 | 17 | | | - |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | 10 | 6 | | | |
| කාර්යාල සහකාර | | 1 | | | |
| කාර්යාල සහායක | | 1 | | | 2 |
| එකතුව | 96 | 75 | 1 | 1 | 19 |

2012 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලය 76 ක් වන අතර, එහි සංයුතිය පුරුෂ 26 ක් සහ ස්ත්‍රී 56 කින් සමන්විත වේ. කාර්ය මණ්ඩල සංයුතිය, සේවා කාල විමර්ශනය, ස්ත්‍රී පුරුෂ විමර්ශනය සහ වයස් විමර්ශනය පහත සඳහන් රූප සටහන් මගින් පෙන්වා ඇත. (රූප සටහන් 07, 08, 09, 10)

*රූප සටහන 07:* කාර්ය මණ්ඩල සංයුතිය




*රූප සටහන 08:* ස්ත්‍රී පුරුෂ විග්‍රහය



*රූප සටහන 09:* කාර්ය මණ්ඩල වයස් සංයුතිය




*රූප සටහන 10:* සේවා කාලය පිළිබඳ තොරතුරු ප්‍රතිශතයක් වශයෙන්




## පුහුණුව හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ හැකියාවන් හැකි උපරිම අයුරින් සංවර්ධනය කිරීම ආයතනයේ වර්ධනය වේගයෙන් ඉදිරියට තල්ලු කිරීමට උපකාරී වන බව අපගේ විශ්වාසයයි. එම නිසා සුරැකුම්පත් හා විනිමය කොමිසම එහි සේවක මණ්ඩලය සඳහා විවිධ අංශයන් යටතේ විදේශයන්හි ද විශාල සංවර්ධන අවස්ථා සලසා දී ඇත. මෙම පාඨමාලා මගින් වෙනත් නියාමන ආයතන මුහුණ දෙන නියාමන ගැටලු සහ ඒවාට මුහුණ දෙන ආකාරය සහ විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළෙඳපොළවල් පිළිබඳව නව දැක්මක් ලබා ගැනීමට අවස්ථාව ලැබී ඇත. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOSCO) සහ අනෙකුත් ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතන, ආසියා ශාන්තිකර කලාපීය ආර්ථික සංවිධානය වැනි ආයතන මගින් කාර්ය මණ්ඩලය වෙත අති විශාල වශයෙන් ප්‍රයෝජනවත් හා ඉතා යෝග්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කරමින් ලබා දුන් සහයෝගය වෙනුවෙන් අපගේ අවංක ස්තූතිය පිරිනැමිය යුතුය. (රූප සටහන 11)

*රූප සටහන 11:* පුහුණුව




කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ඔවුන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසමෙහි පුහුණු අංශය වන ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන හා පුහුණු අංශය මගින් මෙහෙයවනු ලබන අධ්‍යාපන පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත. එයට අමතරව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කාර්යාල සාමාජිකයන් සඳහා සාර්ථකව හිම කිරීමෙන් අනතුරුව වසර දෙකක් සේවය කිරීමේ බැඳීමට යටත්ව පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළත්ව උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රාහක දීමනා ලබා දීමට කටයුතු කර ඇත. වසර තුළ කරන ලද සමාලෝචනයන්ට අනුව උරෙන් උර ගැටී පෙරට ගමන් කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ දෙමළ භාෂාව ඉගැන්වීම වැනි පුහුණු වැඩසටහන් ආයතනය තුළ සංවිධානය කරනු ලැබිය.

එයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකු පුහුණු කේන්ද්‍රය මගින් සංවිධානය කරන ලද මූල්‍ය ආයතනවල වංචා විමර්ශනය (Fraud Detection in Financial Institutions), අවදානම් මූල්‍ය විගණනය (Risk based Auditing), ප්‍රසම්පාදන කළමනාකරණය හා ටෙන්ඩර් ක්‍රියාවලිය (Procurement Management and Tender Procedures) වැනි අදාළ දේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය සහභාගී විය.

එයට අමතරව වාර්ෂික නේවාසික පුහුණු කිරීමේ වැඩසටහන පුද්ගල චරිතය (Personal Caracter) සහ පුහුණු අවශ්‍යතා විග්‍රහ කිරීම "Training Needs Analysis" යන තේමාවන් මූලික කර ගෙන මානව සම්පත් විද්‍යාර්ථියකුගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම 2011 වර්ෂය සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වැය කළ රුපියල් 12,362,617/= හා සංසන්දනය කර බලන කල 2012 වර්ෂය සඳහා එය රුපියල් 18,916,953/= වී ඇත.

### කාර්ය මණ්ඩල සහභාගීත්වයන්

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යක්ෂමව නියාමනය කිරීම සඳහා මූලිකත්වය දිය යුතු අංශ 10 ක් හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම 2012 වසර තුළ සිදු කරන ලදී. විවිධ කාර්යයන්ගේ නියුතු කණ්ඩායම්වල සේවය කිරීමට සහ ඔවුන්ගේ නිර්මාණශීලී අදහස් ලබා දීම තුළින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසමේ සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීමට කාර්ය මණ්ඩලයට අවස්ථාව සලසා දෙනු ලැබීය.

### කාර්ය මණ්ඩල ඇගයීම

පාරිතෝෂය කළමනාකරණය වෙත ක්‍රමානුකූලව ලඟාවීමේ අරමුණින් සභාපතිතුමා සහ කොමිෂන් සභා සාමාජිකයන් දෙදෙනෙකුගේ අධීක්ෂණයෙන් සමන්විත පාරිතෝෂිත කමිටුවක් වර්ෂය මුල ස්ථාපිත

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

කරන ලදී. මෙම කමිටුව සැලකිල්ලෙන් අධ්‍යයනයක් කර විධිමත් ප්‍රතිලාභ කළමනාකරණ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා කාර්ය මණ්ඩලය වෙත සකස් කරන තුරු කාර්ය මණ්ඩලයේ ජීවන බර ලිහිල් කිරීම සඳහා තාවකාලික වැටුප් වැඩිකිරීමක් කොමිෂන් සභා සාමාජික මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

### සේවක සුභසාධනය

ආයතනයේ සේවක මණ්ඩලය වෙත විවිධාකාර වූ සුභසාධන පහසුකම් සලසා දෙන අතරතුර බාහිර වෛද්‍ය යෝජනා ක්‍රමය, සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, ණය පහසුකම් ලබාදීම, පොලී සහනාධාරය ලබාදීම වැනි කටයුතු දිගටම සිදු කර ඇත. සේවක ප්‍රතිලාභ පිළිබඳව අදහස් ලබා ගැනීම සඳහා "කාර්යාලයේ තෘප්තිය" යන මැයෙන් සමීක්ෂණයක් ද පවත්වන ලදී.

කොමිෂන් සභා සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කිරීමටත්, සේවක මණ්ඩලයේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීමටත්, ඔවුනගේ සැඟවුන දක්ෂතා හඳුනා ගැනීමටත්, එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පවුල තුළ බැඳීම වර්ධනය කිරීමේත් අරමුණින් ක්‍රීඩා දිනය සහ නත්තල් ප්‍රියසම්භාෂණය වැනි වාර්ෂික කාල සටහනට අයත් වැඩ සටහන් පවත්වන ලදී.

### ආධුනිකත්ව වැඩසටහන

විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයන් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසමෙහි ආධුනිකත්ව පුහුණුව තුළින් අවශ්‍ය කරන පුහුණුව ලබා ගැනීම සඳහා තව දුරටත් සහයෝගය ලබා දෙන ලදී.

### 25 වන සංවත්සරය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම එහි 25 වන සංවත්සරය වෙත පියවර තැබීම නිමිති කර ගෙන එහි වර්තමානයේ සේවය කරන සහ හිටපු සභාපතිතුමන්ලා, කොමිෂන් සභා සාමාජික මහත්ම මහත්මීන් ඇතුලු කාර්ය මණ්ඩලය විසින් විවිධ ආගමික ආශිර්වාදයන් ලබා ගන්නා ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දීර්ඝ කාලයක් සේවය කරන ලද කාර්ය මණ්ඩලය අගය කිරීම සඳහා අවශ්‍ය මූලික අනුමැතීන් ලැබී ඇත. අදාළ අගය කිරීම ත්‍යාග ප්‍රදානෝත්සවය ඊ ළඟ වර්ෂය සඳහා කල් තැබීය.

### තොරතුරු තාක්ෂණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, 2012 වසර තුළදී එහි පරිගණක පද්ධතිය වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත තත්වයට උසස් කරන ලදී. එහිදී පරිගණක පද්ධති තාත්වීකරණය (Server Virualization) යන ක්‍රමවේදය අනුගමනය කරන ලදී. එමගින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා කාර්යභාරයන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමටත් සම්පත් කළමනාකරණය තුලින් ඵලදායීතාව සහ පැවැත්ම රඳා ගැනීමටත් හැකියාව ලැබේ.

පරිගණක පද්ධති තාත්වීකරණය මගින් පරිගනක පත්ධති බිඳ වැටීම් සහ දත්ත ලබා ගැනීමේ අපහසුතා අවම කර ගැනීමට හැකියාව ලැබේ. එසේම අනපේක්ෂිත පරිගණක පද්ධති බිඳවැටීමකදී හානිය අවම කර කාර්යභාරයන් අවම කාල සීමාවකින් ස්ථාපනය කිරීමට හැකිවේ.

සලකා බලන ලද වසර තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන සහ පුහුණු අංශය සඳහා නව අන්තර්ජාල වෙබ් අඩවිය ස්ථාපනය කරන ලදී. මෙය භාෂා ත්‍රිත්වයෙන්ම එල කරන ලදී. ඵලදායී සහ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණය සඳහා අවශ්‍ය පැමිණීමේ ලේඛන සහ අදාළ තොරතුරු පරිගණක ගත කරන ලදී. (Attendence Management System).

### ජාත්‍යන්තර සම්බන්ධතා

අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා පිළිබඳ සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා පිළිබඳ සංවිධානයේ සංවර්ධනය වන වෙළෙඳපොළ කමිටුව සමඟ සමීප සම්බන්ධතාවය තව දුරටත් පවත්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභාව විසින් 2008 අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා පිළිබඳ සංවිධානය සමඟ ඇති කර ගත් ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පරිගණක දත්ත ගබඩාවට (IFRS) ප්‍රවේශවීම සඳහා අපට හැකියාව ලැබී ඇත.

අනෙකුත් රටවල් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් වන සමීක්ෂණ සඳහා කොමිෂන් සභාව සහය දක්වන ලදී.

සේවාදායකයන් විසින් ගණුදෙනු සඳහා ලබා දෙන උපදෙස් පටිගත කිරීම සම්බන්ධව අනෙකුත් රටවල තැරැව්කරුවන් සඳහා වන රීති සහ රෙගුලාසි පිළිබඳව අදහස් අප විසින් විමසා බලන ලදී. තැරැව්කරුවන් විසින් ස්වකීය ගිණුමෙහි ගණුදෙනු කිරීමේ දී සහ ඒ හා බැඳුනු අවදානම අධීක්ෂණය කිරීම සම්බන්ධව අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා පිළිබඳ සංවිධානය විසින් කළ සමීක්ෂණයක් සඳහා අවශ්‍ය තොරතුරු අප විසින් සපයන ලදී.

## ව්‍යවස්ථාපික අරමුදල් පිළිබඳ ක්‍රියාකාරකම්

### සෙස් අරමුදල්

2009 අංක 47, 2003 අංක 18 සහ 1991 අංක 26 දරන පනත් මඟින් සංශෝධිත 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 14 අ හා 14 ආ කොටස් වල මෙසේ සඳහන් වේ.

### 14 (අ)

(1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියාමයන් මඟින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ඇති අනු ප්‍රමාණයකට අනුව වූ සෙස් බද්දක්, බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයක වාර්තාගත හෝ එහි රීති යටතේ එවැනි ගැනුම්කරුවෙකු සහ විකුණුම්කරුවෙකු යන දෙදෙනාම විසින් ඊට දක්වන ලද හෝ සෑම සුරැකුම්පත් මිල දී ගැනීමත් හෝ විකිණීමත් සම්බන්ධයෙන් නියම කිරීම, අය කිරීම හා ගෙවීම කරනු ලැබිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

14 (ආ)

(1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 14 අ වගන්තිය යටතේ අය කරන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කළ යුතුය.

(2) කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාණයෙන් පහත දැක්වෙන කාර්යය සඳහා අරමුදලෙන් ගෙවීම් කළ හැක.

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම.

(ආ) 38 වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදල් බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සහ

(ඇ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා එහි බලතල කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට.

(3) සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට ආයෝජනය කළ හැකිය.

2010 අගෝස්තු මස 01 වන දින සිට දෙවන වතාවටත් කොමිෂන් සභාව මඟින් එක් ගණුදෙනුවක් සඳහා වන සෙස් බදු අනුපාතය 0.09% සිට 0.072% දක්වා පහත හෙලන ලදී. මීට කලින් එය වෙනස් කරන ලද්දේ 2003 දෙසැම්බර් 01 දින සිට බල පැවැත්වෙන පරිදි 0.1% සිට 0.09% දක්වා අඩු කිරීමෙනි.

2006 පෙබරවාරි සිට එක් දින ගණුදෙනුවක දී ගණුදෙනුවේ එක් පාර්ශ්වයක් සඳහා සෙස් බදු ගාස්තුව අය කරනු නොලැබේ. එය පහත පරිදි විස්තර කළ හැක.

අ. මිල දී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය හා සමාන නොවන අවස්ථාවක දී මිල දී ගත් හෝ විකුණනු ලැබූ දෙකින් කවර හෝ එකක අඩු ප්‍රමාණය සඳහා සෙස් බද්ද අය නොකෙරේ.

ආ. මිල දී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය සහ සමාන වන අවස්ථාවක දී මිල දී ගත් හෝ විකුණනු ලැබූ දෙකෙන් කවර හෝ ගණුදෙනුවක දෙවන ගණුදෙනුව සඳහා සෙස් බද්දක් අය නොකෙරේ.

එක් දින ගණුදෙනුව වශයෙන් අර්ථ නිරූපණය කෙරෙන්නේ යම් සේවාදායකයෙකු විසින් එක් දිනක් තුළ දී එකම සමාගමක කොටස් මිල දී ගැනීම හෝ විකිණීම හෝ නැතිනම් විකිණීම හා මිල දී ගැනීම එකම තැරැව්කාර ආයතනයක් හරහා සිදු කිරීමයි.

2009 වසර තුළ දී වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් රුපියල් මිලියන 50 සෙස් අරමුදලට මීට මාරු කර බැර කරන ලදී. එසේම 2009 සිට 2010 වසර තුළ සෙස් අරමුදලින් රුපියල් මිලියන 100 ක් පියවීම් සහතික කිරීමේ අරමුදලට මාරු කර බැර කරන ලදී.

තවද මෙම අරමුදලින් 30.09.2010 සහ 24.09.2012 දිනයන්හි පිළිවෙලින් රුපියල් මිලියන 276 සහ රුපියල් මිලියන 380 බැගින් ඒකාබද්ධ අරමුදලට මාරු කර බැර කරන ලදී.

2012 දෙසැම්බර් 31 වන දිනට සෙස් අරමුදලෙහි පවතින බැර (වාසිදායක) ශේෂය රුපියල් 2,097,094,924/= වේ. (රූප සටහන 12)

2002 සිට 2012 වසර දක්වා සෙස් අරමුදලේ වර්ධනය පහත ප්‍රස්තාර සටහන ඇසුරින් පෙන්නුම් කරයි.

*රූප සටහන 12:* **සෙස් අරමුදලේ වර්ධනය**



# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම අරමුදල 1998 මැයි මස 22 වන දින ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළ හි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගිකරුවන් අතර වෙළෙඳ ගණුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණු ඇතිවය. මෙම අරමුදලේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිද්දෙන් ඉදිරිපත් කළ හැක.

- කොටස් ගණුදෙනුවක් වූ සැනින්, ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොල විසින් බේරුම් කිරීමේ කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී. එනම් T + 3 දක්වා රැගෙන එන ලදී. ගැනුම්කරු විසින් T + 3 පදනම මත, එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුලුව එළඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් සිදුකළ යුතු වන අතර විකුණුම්කරුට T + 3 පදනම මතම, එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් හිමිකම් පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන්, සුරක්ෂිත නොවන පියවීමේ අවදානමක් ඇතිවන නිසා, මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති විය.
- මෙම අරමුදලේ භාරකරුවන් නිල බලයෙන් ඊට පත්වනු ලබන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, සුරැකුම්පත් සහ වි. කො. සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරවෙහි අධ්‍යක්ෂ ජනරාල් සහ නිළධාරීන් ඊට අයත් වේ.
- ශ්‍රී ලංකා රජය මෙම අරමුදලට රුපියල් මිලියන 50 ක මුදලක් ප්‍රදානය කොට තිබේ. මෙම මුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූර්ණක වශයෙන් පරිත්‍යාග තෑගි සහ ප්‍රධානයන් ලබා ගැනීමට පිළිවන් වේ. තරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායක විය යුතු යැයි නියමයක් දැනට නොමැත.

2009 සිට 2010 වර්ෂය තුළ දී මෙම අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් රුපියල් මිලියන 100 ක මුදලක් සෙස් අරමුදලෙන් මීට මාරු කර බැර කරන ලදී.

පියවීම් සහතික කිරීමේ අරමුදලට වෙනත් මාර්ගවලින් ලැබෙන ලැබීම් පිළිගන්නා අයුරින් භාර ඔප්පුවට කරන ලද වෙනස්කම්වලට පසුව කොළඹ කොටස් වෙළෙඳපොළ ද 2012 ජනවාරි මාසයේ දී රුපියල් මිලියන 100 ක් මාරු කරන ලදී.

කෙසේ වෙතත් පියවීම සහතික කිරීමේ අරමුදල පියවීමේ අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස නිශ්කාෂක ආයතනයක් ස්ථාපනය කිරීමේ හැකියාව පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශක්‍යතා අධ්‍යයනයක නියැලී සිටී.

එසේ වුවද මේ තාක් පියවීම් සහතික කිරීමේ අරමුදලින් හිමිකම් ඉල්ලීමක් ඉදිරිපත් වී නොමැත.

2012 දෙසැම්බර් 31 දින වන විට මෙම අරමුදලේ රුපියල් 499,903,661/= ක බැර ශේෂයක් විය. 2002 සිට 2012 දක්වා අරමුදලේ වර්ධනය පහත රූප සටහන මගින් පිළිබිඹු වේ. (රූප සටහන 13)

*රූප සටහන 13:* **පියවීම් සහතික කිරීමේ අරමුදලේ වර්ධනය**



## වන්දි අරමුදල

වර්ෂ 1987 දී සුරැකුම්පත් සහ වි. කො. සභාව පිහිටුවීමක් සමගම වන්දි අරමුදල ද ආරම්භ කෙරිණ. 1987 අංක 36 දරන සංශෝධිත සුරැකුම්පත් සහ වි. කො. සභා පනතේ 38 වගන්තිය මෙසේ සඳහන් වේ.

බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දකු සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතු කොට ගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදලක් පිහිටුවනු ලැබේ.

වන්දි අරමුදලේ සමන්විතය පහත පරිදිය.

- වන්දි අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්
- පනතේ 51 අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබූ මුදල් (51 අ වගන්තිය යටතේ වරද සමතයකට පත් කිරීම පිළිබඳව සඳහන් වේ.)
- සෙස් අරමුදල මගින් පනතේ 14 ආ වගන්තිය යටතේ බැර කරනු ලබන මුදල්
- වන්දි අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයට ආයෝජනය කළ හැකිය.

අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව 49 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතුය. තවද එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුව ගන්නා තීරණය අවසානාත්මක තීරණාත්මක වන්නේය.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සළසා ඇත. පහත අනුව ඉල්ලුම්කරුගේ හිමිකම් සනාථ කිරීම පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ යම් විභාගයක් පැවැත්වූ විටෙක එකී විභාගය අවසාන වූ විට කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසර දීම හෝ නොදීම කළ හැක. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා වාර්තා වී නොමැත.

2012 දෙසැම්බර් 31 වන විට මෙම අරමුදලේ ශේෂය රුපියල් 237,461,686/= ක් විය. 2001 සිට 2012 වසර දක්වා මෙම අරමුදලේ වර්ධනය පහත ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 14)

*රූප සටහන 14:* **වන්දි අරමුදලේ වර්ධනය**



# අතිරේක තොරතුරු

**ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්**

2012 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වී සිටි වෙළෙඳපොළ අතරමැදියන්

| සමාගම් | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන් | ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| ඇක්විටි පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | x |
| ඒ ඕ එල් කැපිටල් ලිමිටඩ් | | x | |
| ඒ ඕ එල් ඉක්විටීස් ලිමිටඩ් | x | | |
| අමානා කැපිටල් ලිමිටඩ් | | x | |
| ආර්පිකෝ ඇටරාසියා ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| ආශා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | x | | |
| ඒෂියා වෙල්ත් මැනේජ්මන්ට් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| ඒෂියන් ෆයිනෑන්ස් ලිමිටඩ් | x | | |
| ඇස්ට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | ` |
| ඇසට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| බෑන්ක් ඔෆ් සිලෝන් | | x | x |
| බාර්ට්ලීට් ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| බාර්ට්ලීට් ෆයිනෑන්ස් ලිමිටඩ් | x | | |
| බාර්ට්ලීට් ට්‍රාන්ස්කැපිටල් ලිමිටඩ් | | x | x |
| කැපිටල් එලයන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් | x | | |
| කැපිටල් එලයන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් | | | x |
| කැපිටල් එලයන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| සීබෑන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | x | |
| සිලෝන් ගාඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පීඑල්සී | | | x |
| සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී | | | x |
| කොහොර්ට් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | x | | x |
| කොම්ට්‍රස්ට් ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| ඩී එෆ් සී සී වර්ධන බෑන්ක් ලිමිටඩ් | x | | |
| ෆස්ට් කැපිටල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | x | |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | x | | |
| ජෝජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් ලිමිටඩ් | x | | |
| ඇක්විටි ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | x | |
| ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | | x | |
| හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී | x | | x |
| හෙරමිලා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| හෙරමිලා ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| හොරිසෝන් ඇසට් ලිමිටඩ් | | x | |
| අයි අයි එෆ් එල් කැපිටල් සිලෝන් ලිමිටඩ් | | x | |
| ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |

| සමාගම් | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන් | ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| ජේ බී ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ජේ බී ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| කෙනන්ගා ඉන්වෙස්ට්මන්ට් කෝපරේෂන් | | x | |
| එල් බී ෆයිනෑන්ස් පීඑල්සී | x | | |
| එල් ආර් ග්ලෝබල් ලංකා ඇසට් මැනේජ්මන්ට් | | x | |
| කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ලංකා ඔරික්ස් ෆයිනෑන්ස් කම්පනි ලිමිටඩ් | x | | |
| ලෙක්සින්ටන් ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| ලීජ් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | x |
| මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී | x | | |
| නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ් | | x | |
| නේෂන් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් | x | | |
| නැෂනල් ඩෙවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී | | x | |
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් | | x | |
| එන්.ඩී.බී. අවීවා වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | | | x |
| එන්.ඩී.බී. කැපිටල් හෝල්ඩින්ග්ස් පීඑල්සී | x | | |
| එන් ඩබ්ලිව් එස් ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | x | |
| ඔරිඔන් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී | x | | |
| පීපල්ස් ලීසිං කම්පනි ලිමිටඩ් | x | | |
| පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් කම්පනි | x | | |
| රිචඩ් පීරිස් ෆයිනෑන්ෂල් සර්විසස් | x | | x |
| සම්පත් බෑන්ක් පීඑල්සී | | x | |
| සණස ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| සෙලාන් බෑන්ක් පීඑල්සී | x | | |
| සින්ගර් ෆයිනෑන්ස් ලිමිටඩ් | | x | |
| එස් කේ එම් ලංකා හෝල්ඩිංග්ස් ප්‍රයිවට් ලිමිටඩ් | x | | |
| සොෆ්ට්ලොජික් කැපිටල් ලිමිටඩ් | x | x | |
| සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් ලිමිටඩ් | x | | |
| ටී.කේ.එස්. ෆයිනෑන්ස් ලිමිටඩ් | x | x | |
| ටී කේ එස් සෙකියුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ් | | | |
| යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් | | | |
| වොල්ඩොක් මැකන්සි ලිමිටඩ් | | | |

නිශ්කාෂණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වූ වෙළෙඳපොළ අතරමැදි ආයතන පිළිබඳ තොරතුරු

සෙන්ට්‍රල් ඩිපොසිටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ණය ප්‍රමාණීකරන ආයතනයන් වර්ගීකරණය යටතේ ලියාපදිංචි වූ වෙළෙඳපොළ අතරමැදි ආයතන පිළිබඳ තොරතුරු

ෆිට් රේටින්ස් ලංකා ලිමිටඩ්
රැම් රේටින්ස් ලංකා ලිමිටඩ්
ඉක්‍රා ලංකා ලිමිටඩ්

# අතිරේක තොරතුරු

## කොටස් තැරැව්කාර සමාගම් සහ කොටස් වෙළෙඳුන්

දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම් සහ කොටස් වෙළෙඳුන්

| සමාගම් | කොටස් තැරැව්කාර සමාගම් | කොටස් වෙළෙඳුන් | |
|---|---|---|---|
| | | සුරැකුම්පත් සඳහා වන කොටස් වෙළෙඳුන් | ණය ගණුදෙනු සඳහා වන කොටස් වෙළෙඳුන් |
| ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ඇරන්ගා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ආශා ෆිලිප් සෙකියුරිටීස් ලිමිටඩ් | x | | |
| ඒෂියා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ඇසට්ලයින් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| බාර්ට්ලීට් රෙලිගෙයා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| කැපිටල් එලයන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | x | | |
| නේෂන් ලංකා ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ක්ලැරිඩ්ජ් ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| සී ටී ස්මිත් ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ඩී එන් එච් ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ෆස්ට් ගාර්ඩියන් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| හෙරෙම්ලා සෙකියුරිටීස් ලිමිටඩ් | x | | |
| අයි අයි එෆ් එල් සෙකියුරිටීස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ජේ බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| ජෝන් කීල්ස් ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ලංකා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් | x | | |
| නිව් වර්ල්ඩ් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| එන් ඩී බී ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| රිචඩ් පීරිස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| එස් සී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| එස් කේ එම් ලංකා හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | x | |
| සමර්විල් ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| තැප්රොබේන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ටී කේ එස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | x | | |
| ෆස්ට් කැපිටල් මාර්කට් ලිමිටඩ් | x | x | x |

## ඒකකභාර කළමනාකරණ සමාගම්

පහත සඳහන් ආයතන ඒකකභාර කළමනාකරණ සමාගම් වශයෙන් කටයුතු කිරීමට බලපත්‍ර ලබා ගන්නා ලදී.

- **සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්**
  - සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
  - සිලෝන් ඉන්කම් ෆන්ඩ්
  - සිලෝන් ටුවරිසම් ෆන්ඩ්
  - සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
  - සිලෝන් අයි පී ඕ ෆන්ඩ්
  - සිලෝන් එම් ටී අයි ෂරියා ෆන්ඩ්
  - සිලෝන් ග්ලෝබල් කම්පැක්ට් සස්ටේනබිලිටි ෆන්ඩ්
  - සිලෝන් ගිල්ට් එජ්ඩ් ෆන්ඩ්

- **කොම්ට්‍රස්ට් ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
  - කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
  - ක්‍රෙසන්ට් අයි ෆන්ඩ්
  - කොම්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ්
  - කොම්ට්‍රස්ට් ඒඩීඑල් මුදාරබා ෆන්ඩ්

- **එන් ඩි බී අවිවා වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්**
  - ඊගල් ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
  - ඊගල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
  - ඊගල් ෆික්ස්ඩ් ඉන්කම් ෆන්ඩ්
  - ඊගල් ඉන්කම් ෆන්ඩ්
  - ඊගල් ග්‍රෝත් ෆන්ඩ්
  - ඊගල් මනි ෆන්ඩ්
  - ඊගල් මනි ප්ලස් ෆන්ඩ්

- **සීබෑන්ක් ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
  - සීබෑන්ක් යුනිට් ට්‍රස්ට්
  - සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ්
  - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ආවෘත අරමුදල)
  - සීබෑන්ක් සේවිංග්ස් ප්ලස් මනි මාර්කට් ෆන්ඩ්
  - සීබෑන්ක් සුරැකුම්

- **නැෂනල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
  - නාමල් ඉන්කම් ෆන්ඩ්
  - නාමල් මනි මාර්කට් ෆන්ඩ්
  - නැෂනල් ඉක්විටි ෆන්ඩ්
  - නාමල් ග්‍රෝත් ෆන්ඩ්
  - නාමල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් 1 (ආවෘත අරමුදල)
  - නාමල් ඇක්විටි වැලියු ෆන්ඩ් (ආවෘත අරමුදල)
  - නාමල් අයි පී ඕ ෆන්ඩ්
  - නාමල් හයි යීල්ඩ් ෆන්ඩ්
  - නාමල් ෂරියා ෆන්ඩ්

- **ෆස්ට් කැපිටල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
  - ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්

- **ජේ බී ෆයිනෑන්ෂල්**
  - ජේ බී වෙන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
  - ජේ බී වෙන්ටේජ් වැලියු ඉක්විටි ෆන්ඩ්

- **ගාඩියන් ඇක්විටි ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
  - ගාඩියන් ඇක්විටි ෆික්ස්ඩ් ඉන්කම් ෆන්ඩ්
  - ගාඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්

- **හෙරෙමිලා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්**
  - ශ්‍රී ලංකා හෙරෙමිලා කැපිටල් ග්‍රෝත් ෆන්ඩ්
  - අමානා හෙරෙමිලා ෂරියා ෆන්ඩ්

- **ඇසට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
  - ඇස්ටෲ ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්

- **කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්**
  - කැපිටල් එලයන්ස් හයි යීල්ඩ් ෆන්ඩ්
  - කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
  - කොන්ට්‍රේටිව් ඉක්විටි ෆන්ඩ්

- **ආර්පිකෝ ඇටරාසියා ඇසට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
  - කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ්
  - ඇබ්සොලියුට් වැලයු ෆන්ඩ්

- **ඔරියන්ට් වෙල්ත් ලිමිටඩ්**
  - ඔරියන්ට් කෝපරේට් ඩෙට් ෆන්ඩ්
  - ඔරියන්ට් ඉක්විටි ෆන්ඩ්
  - ඔරියන්ට් ගිල්ට් එජ්ඩ් ෆන්ඩ්

# දත්ත ගොනුව

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| කොටස් වෙළඳපොළ මුළු පිරිවැටුම (රු. මිලි.) | 110,453.90 | 142,462.65 | 570,326.82 | 546,255.80 | **213,827.2** |
| දේශීය පිරිවැටුම (රු. මිලි.) | 50,796.90 | 99,010.83 | 464,733.62 | 486,959.40 | **160,543.3** |
| විදේශීය පිරිවැටුම (රු. මිලි.) | 59,656.90 | 43,451.82 | 105,593.20 | 59,296.40 | **53,283.9** |
| වෙළඳපොළ දින | 238 | 240 | 238 | 239 | **242** |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම (රු. මිලි) | 464.1 | 593.6 | 2,396.33 | 2,285.60 | **883.6** |
| ගණුදෙනු වූ කොටස් ප්‍රමාණය (කොටස් මිලි.) | 3,154.90 | 4,762.70 | 18,489.19 | 24,543.70 | **9,691.2** |
| දේශීය (මිලි.) | 1,934.90 | 3,784.20 | 16,684.45 | 23,151.60 | **8,289.6** |
| විදේශීය (මිලි.) | 1,220.00 | 978.42 | 1,804.74 | 1,392.10 | **1,401.7** |
| ගණු දෙනු සංඛ්‍යාව | 776,244 | 1,266,299 | 3,355,126 | 4,579,352 | **1,857,384** |
| දේශීය | 730,415 | 1,190,822 | 3,225,041 | 4,463,404 | **1,796,868** |
| විදේශීය | 45,829 | 75477 | 130,085 | 115,948 | **60,516** |
| නව ලේඛණගතවීම් සංඛ්‍යාව | 3 | 3 | 10 | 32 | **17** |
| ලේඛනයෙන් බැහැරවීම් සංඛ්‍යාව | 2 | 6 | 1 | 0 | **2** |
| ලේඛණගත සමාගම් සංඛ්‍යාව | 235 | 231 | 241 | 272 | **287** |
| ගණුදෙනු සිදුවූ සමාගම් සංඛ්‍යාව | 232 | 231 | 238 | 265 | **280** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධණීකරනය (රු. බිලි.) | 488.8 | 1,092.10 | 2,210.45 | 2,213.90 | **2,167.6** |
| වර්ෂය අවසන් වන විට මිළ ඉපැයුම් අනුපාතය (වාර ගණන) | 5.4 | 16.6 | 25.16 | 15.8 | **15.9** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම | 16.9 | 18 | 34.5 | 24.7 | **9.8** |
| වර්ෂය අවසන් වන විට ලාභාංශ ඵලදායිතාවය (%) | 5.6 | 3 | 1.16 | 1.8 | **2.4** |
| වර්ෂය අවසන් වන විට පොත් අගය අනුව මිළ (වාර ගණන) | 0.8 | 1.7 | 2.98 | 2 | **2.1** |
| දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධණීකරණය | 11.1 | 22.6 | 39.4 | 33.8 | **29.0** |
| **වෙළෙඳපොළ මිල දර්ශක** | | | | | |
| සමස්ථ මිල දර්ශකය | 1,503.00 | 3,385.55 | 6,635.87 | 6,074.40 | **5,643.0** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (40.9) | 125.25 | 96.01 | (8.5) | **(7.1)** |
| මිලංක මිල දර්ශකය | 1,631.30 | 3,849.38 | 7,061.46 | 5,229.20 | **5,119.1** |
| වාර්ෂික වෙනස්වීමේ ප්‍රතිශතය (%) | (50.4) | 135.97 | 83.44 | (25.9) | **(2.1)** |
| S&P ශ්‍රී ලංකා 20 දර්ශකය | | | | | **3085.3** |
| වාර්ෂික වෙනස්වීමේ ප්‍රතිශතය (%) | | | | | **-** |
| **මුළු ප්‍රතිලාභ මිල දර්ශකය** | | | | | |
| සමස්ථ මුළු ප්‍රතිලාභ මිල දර්ශකය | 1,783.60 | 3,944.90 | 7,899.11 | 7,362.83 | **7037.3** |
| වාර්ෂික වෙනස්වීමේ ප්‍රතිශතය | (38.1) | 121.18 | 100.24 | (6.79) | **(4.4)** |
| මිලංක මුළු ප්‍රතිලාභ මිල දර්ශකය | 1,962.50 | 4,506.24 | 8,481.73 | 6,393.00 | **6399.4** |
| වාර්ෂික වෙනස්වීමේ ප්‍රතිශතය | (47.3) | 129.6 | 88.22 | (24.63) | **0.1** |
| **විදේශීය ක්‍රියාකාරකම්** | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රු. මිලි.) | 59,656.90 | 43,451.82 | 105,593.20 | 59,296.40 | **53,283.9** |
| මිලදී ගැනීම් (රු. මිලි.) | 66,632.20 | 43,057.32 | 92,425.53 | 49,776.80 | **72,614.2** |
| විකිණීම් (රු. මිලි.) | 52,681.70 | 43,846.32 | 118,760.87 | 68,816.00 | **33,953.6** |
| **ශුද්ධ විදේශීය ගලාඒම** | **13,950.50** | **(789)** | **(26,335.34)** | **(19,039.20)** | **38,660.7** |
| ගණුදෙනු වූ කොටස් ප්‍රමාණය (කොටස් මිලි.) | 1,220.00 | 978.41 | 1,804.74 | 1,392.11 | **1,401.7** |
| මිලදී ගැනීම් (කොටස් මිලි.) | 1,286.20 | 908.97 | 1,541.49 | 1,186.80 | **1,520.6** |
| විකිණීමේ (කොටස් මිල.) | 1,153.90 | 1,047.87 | 2,067.99 | 1,597.42 | **1,282.7** |
| ගණුදෙනු සංඛ්‍යාව | 45,829 | 75,477 | 130,085 | 115,948 | **60,516** |
| මිලදී ගැනීම් සංඛ්‍යාව (මිලි.) | 50,052 | 69,431 | 115,071 | 112,246 | **71,944** |
| විකිණීම් සංඛ්‍යාව (මිලි.) | 41,606 | 81,523 | 145,100 | 119,651 | **49,088** |

| **වර්ෂය** | **2008** | **2009** | **2010** | **2011** | **2012** |
|---|---|---|---|---|---|
| **ණයකර වෙළෙඳපොළ** | | | | | |
| *සාංගමික ණයකර* | | | | | |
| මුළු පිරිවැටුම (රු. '000) | 102,639.30 | 136,765 | 72,288 | 2,690,664.40 | **75,717.1** |
| ගණුදෙනු සංඛ්‍යාව | 27 | 42 | 92 | 62 | **39** |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය ('000) | 953.5 | 1,020 | 693 | 25,861 | **740.4** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධණීකරනය | N/A | N/A | N/A | | **46,311.0** |
| *රාජ්‍ය ණයකර* | | | | | |
| මුළු පිරිවැටුම (රු. '000) | 195,157.40 | 98,977 | 45,673 | 28,356.80 | **6,128.0** |
| ගණුදෙනු සංඛ්‍යාව | 69 | 42 | 18 | 7 | **2** |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය ('000) | 208,182.60 | 102,778 | 46,794 | 28,912 | **6,743.6** |
| **ඒකක භාර** | | | | | |
| ශුද්ධ වත්කම් වටිනාකම (රු. මිලි.) | 6,780 | 9,952 | 22,228 | 24,059 | **31,062** |
| ඒකකභාර හිමියන් සංඛ්‍යාව | 22,685 | 23,117 | 24,649 | 26,636 | **27,952** |
| නිකුත් කරන ලද ඒකක ප්‍රමාණය (ඒකක '000) | 638,112 | 564,500 | 1,159 | 1,506 | **2,251** |
| සමාගම් කොටස් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රු. මිලි) | 2,589 | 6,036 | 11,349 | 9,555 | **8,944** |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රු. මිලි.) | 2,903 | 3,363 | 9,289 | 10,326 | **5,449** |
| අනෙකුත් උපකරණ වල ආයෝජනය කර ඇති ප්‍රමාණය ★★ (රු. මිලි.) | 1,293 | 1,106 | 1,223 | 4,186 | **16,596** |

*මූලාශ්‍රය : කොළඹ කොටස් වෙළඳපල, ඒකක භාර කළමණාකරණ අධීක්ෂණ ආයතනය*

★★ වාණිජ පත්‍ර, පොරොන්දු නෝට්ටු, ණයකර සහ බැංකු තැන්පතු

## මූල්‍ය ප්‍රකාශන
(ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව)


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 54 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 56 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 57 |
| සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 58 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 59 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය (සෙස් අරමුදල) | 60 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වන්දි අරමුදල) | 61 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 62 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 64 |


## මූල්‍ය ප්‍රකාශන
(පියවීම් සහතික කිරීමේ අරමුදල)


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 73 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 76 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 77 |
| ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 78 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 79 |
| ගිණුම්කරන ප්‍රතිපත්ති | 80 |

# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No } එෆ්බී /කේ/එස්ඊසී/ එෆ්ඒ/ 2012

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 මැයි 30 දින

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 36 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස  කොමිෂන් සභාවේ  මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මූල්‍ය ප්‍රකාශන**

**මතය**

මූල්‍ය  ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන්  වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා  මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව  මා දරන්නා වූ මතය වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කරනු  ඇත.

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනට*

| | සටහන | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 1 | **56,412,469** | 61,322,318 |
| | | | |
| සෙස් අරමුදල | 2 | **37,905,567** | 34,083,560 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | **628,884** | 530,456 |
| ලැබිය යුතු මුදල් | 5 | **1,784,380** | 855,030 |
| සෙස් අරමුදල | 2 | **2,059,189,357** | 2,205,795,838 |
| වන්දි අරමුදල | 3 | **237,461,686** | 216,312,628 |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 6 | **4,915,002** | 2,512,899 |
| මුදල් සහ මුදල් සමාන දේ | 7 | **28,105,784** | 27,691,271 |
| | | | |
| **මුළු වත්කම්** | | **2,426,403,129** | **2,549,104,000** |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යෙදවූ අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 8 | **9,508,525** | 12,556,660 |
| සෙස් අරමුදල | 9 | **2,097,094,924** | 2,239,879,398 |
| වන්දි අරමුදල | 10 | **237,461,686** | 216,312,627 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල්බදු ණය හිමියෝ | 11 | **619,317** | 2,367,534 |
| ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් ලැබීම් | 12 | **50,050,720** | 52,925,802 |
| විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වන බැඳීම | 13 | **20,012,197** | 14,427,557 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 14 | **6,458,770** | 5,907,450 |
| පූර්ව ලැබීම් | | **4,238,142** | 3,138,389 |
| කල්බදු ණය හිමියෝ | 11 | **958,848** | 1,588,583 |
| | | | |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **2,426,403,129** | **2,549,104,000** |

62 සිට 72 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතුවේ.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්**

**ධම්මික පෙරේරා**
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / වැඩ බලන නිලධාරී*
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ආචාර්ය නාලක ගොඩහේවා**
*සභාපති*
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

කොළඹ
2013 මැයි 17

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | සටහන | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු | | **4,999,634** | 3,605,563 |
| පරිපාලන අයබදු | | **1,487,168** | 3,204,082 |
| CMET අධ්‍යාපන වැඩසටහන් | | **14,312,304** | 22,236,085 |
| SEC සම්මන්ත්‍රණ | | - | 77,657 |
| ප්‍රකාශන විකුණුම් | | **18,750** | 19,500 |
| විවිධ ආදායම් | | **1,894,972** | 96,751 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | | **321,865** | 1,748,847 |
| ප්‍රදාන පිළිගැනීම් | 12 | **13,981,944** | 11,944,380 |
| | | **37,016,637** | **42,932,865** |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(140,311,036)** | (114,022,626) |
| පරිපාලන සහ ආයතනික වියදම් | 16 | **(78,622,641)** | (72,645,015) |
| ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධන වියදම් | 17 | **(24,478,437)** | (41,098,269) |
| මූල්‍ය ගාස්තු | 18 | **(102,328)** | (160,908) |
| | | **(243,514,442)** | **(227,926,818)** |
| ආදායමට වැඩි අතිරික්ත වියදම් | | **(206,497,805)** | (184,993,953) |
| මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | **218,522,637** | 192,395,343 |
| **වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)** | | **12,024,832** | **7,401,390** |

62 සිට 72 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | සටහන | සමුච්චිත රුපියල් | අරමුදල රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | | - | 15,433,620 | 15,433,620 |
| පෙර වර්ෂයේ ගැළපුම | | - | (278,350) | (278,350) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරුකල අරමුදල් | | - | (10,000,000) | (10,000,000) |
| | | - | 5,155,270 | 5,155,270 |
| වසර තුල ආදායමට වැඩි අතිරික්ත වියදම් | | - | (184,993,953) | (184,993,953) |
| සෙස් අරමුදලින් මාරුකිරීම් | | - | 192,395,343 | 192,395,343 |
| වසර අවසානයේ අතිරික්තය/(හිඟය) | | - | 7,401,390 | 7,401,390 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | - | **12,556,660** | **12,556,660** |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | | - | 12,556,660 | 12,556,660 |
| පෙර වර්ෂයේ ගැළපුම | 23 | - | (5,072,967) | (5,072,967) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරුකල අරමුදල් | | - | (10,000,000) | (10,000,000) |
| | | - | (2,516,307) | (2,516,307) |
| වසර තුල ආදායමට වැඩි අතිරික්ත වියදම් | | - | (206,497,805) | (206,497,805) |
| සෙස් අරමුදලින් මාරුකිරීම් | | - | 218,522,637 | 218,522,637 |
| වසර අවසානයේ අතිරික්තය/(හිඟය) | | - | 12,024,832 | 12,024,832 |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | - | **9,508,525** | **9,508,525** |

62 සිට 72 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | සටහන | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| සෙස් අරමුදලෙන් මාරු කිරීමෙන් පසු ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | | **12,024,832** | 7,401,390 |
| | | | |
| **ගැලපීම්** | | | |
| ක්ෂය වීම් | 1 | **15,333,194** | 15,081,465 |
| දේපල පිරියත සහ උපකරණ අපහරණයෙන් ලැබූ (ලාභ)/පාඩු | | **(321,865)** | (1,748,847) |
| ප්‍රදානයන් පිළිගැනීම | 12 | **(13,981,944)** | (11,944,380) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 13 | **5,584,640** | 2,294,733 |
| පෙර වර්ෂය සඳහා ගැළපීම් | | **(5,072,967)** | (278,350) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම් වලට පෙර ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | | **13,565,890** | 10,806,011 |
| | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම** | | | |
| තොග (වැඩි වීම)/අඩු වීම | | **(98,428)** | 120,002 |
| ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම | | **(929,350)** | 358,270 |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් (වැඩි වීම)/අඩු වීම | | **(2,402,103)** | 5,044,650 |
| කලින් ලැබූ මුදල් වැඩි වීම/(අඩු වීම) | | **1,099,753** | 854,437 |
| ණය හිමියන් සහ උපචිත වියදම් වැඩි වීම/(අඩු වීම) | | **551,320** | (11,908) |
| | | **(1,778,808)** | 6,365,451 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල් | | **11,787,082** | 17,171,462 |
| වර්ෂය තුල ගෙවූ පාරිතෝෂික | | - | (1,579,200) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | | **11,787,082** | **15,592,262** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | 1 | **(11,106,862)** | (23,419,657) |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මුදල් මාරු කිරීම | | **(10,000,000)** | (10,000,000) |
| දේපල පිරියත සහ උපකරණ අලෙවි කිරීමෙන් ලැබූ මුදල | | **1,005,384** | 4,688,853 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | | **(20,101,478)** | **(28,730,804)** |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | 12 | **11,106,862** | 23,419,657 |
| මූල්‍ය කල්බදු වැඩි වීම/(අඩු වීම) | | **(2,377,952)** | (6,368,350) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | | **8,728,910** | **17,051,307** |
| | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | | **414,513** | 3,912,765 |
| | | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන අ) | | **27,691,271** | 23,778,506 |
| | | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ආ)** | | **28,105,784** | **27,691,271** |
| | | | |
| **සටහන (අ)** | | | |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ** | | | |
| බැංකුවේ ඇති මුදල් | | **27,651,271** | 23,738,506 |
| අතැති මුදල් | | **40,000** | 40,000 |
| | | **27,691,271** | **23,778,506** |
| | | | |
| **සටහන (ආ)** | | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ** | | | |
| බැංකුවේ ඇති මුදල් | 7 | **28,065,784** | 27,651,271 |
| අතැති මුදල් | 7 | **40,000** | 40,000 |
| | | **28,105,784** | **27,691,271** |

62 සිට 72 දක්වා දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

## සෙස් අරමුදල

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | 2012<br>රුපියල් | 2011<br>රුපියල් |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| සෙස් අරමුදලේ ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | **(142,784,474)** | 632,945,123 |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් වලට පෙර ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | **(142,784,474)** | 632,945,123 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම** | | |
| කාර්ය මණ්ඩල ණය (වැඩි වීම)/අඩු වීම | **(2,957,373)** | (4,573,091) |
| ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම | **807,815** | 4,391,217 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩු වීම | **(6,817,772)** | 33,336,003 |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ලාභ (වැඩි වීම)/අඩු වීම | **2,803,527** | 21,382,804 |
| කුලී තැන්පතු (වැඩි වීම)/අඩු වීම | **(1,614,420)** | (538,140) |
| | **(7,778,223)** | 53,998,793 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | **(150,562,697)** | 686,943,916 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජනය | **295,229,862** | (116,465,766) |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | **(140,967,272)** | (566,025,248) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | **154,262,590** | (682,491,014) |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | **3,699,893** | 4,452,902 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඇ) | **5,003,346** | 550,444 |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඈ)** | **8,703,239** | **5,003,346** |
| **සටහන (ඇ)** | | |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ** | | |
| බැංකුවේ ඇති මුදල් | **5,003,346** | (1,559,556) |
| දෛනික ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය | - | 2,110,000 |
| | **5,003,346** | 550,444 |
| **සටහන (ඈ)** | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ** | | |
| බැංකුවේ ඇති මුදල් | **2,193,239** | 5,003,346 |
| දෛනික ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය | **6,510,000** | - |
| | **8,703,239** | **5,003,346** |

62 සිට 72 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

## වන්දි අරමුදල

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | **2012**<br>**රුපියල්** | **2011**<br>**රුපියල්** |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වන්දි අරමුදලේ ශුද්ධ වැඩිවීම/(අඩු වීම) | **21,149,059** | 28,547,974 |
| | | |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර ශුද්ධ වැඩි වීම/(අඩු වීම) | **21,149,059** | 28,547,974 |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම** | | |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (වැඩි වීම)/අඩුවීම | **72,445** | - |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩි වීම)/අඩුවීම | **(6,311,998)** | 1,203,771 |
| | **(6,239,553)** | 1,203,771 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | **14,909,506** | 29,751,745 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | **(14,910,633)** | (29,748,342) |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම) | **(14,910,633)** | (29,748,342) |
| | | |
| මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩි වීම/ (අඩු වීම) | **(1,127)** | 3,403 |
| | | |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඉ) | **88,715** | 85,312 |
| | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දේ (සටහන ඊ)** | **87,587** | 88,715 |
| | | |
| **සටහන (ඉ)** | | |
| **කාලපරිච්ඡේදය අරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දේ** | | |
| බැංකුවේ ඇති මුදල් | **63,346** | 59,943 |
| ඒක්ෂණ තැන්පතු | **25,369** | 25,369 |
| | **88,715** | 85,312 |
| | | |
| **සටහන (ඊ)** | | |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ (සටහන ආ)** | | |
| බැංකුවේ ඇති මුදල් | **62,218** | 63,346 |
| ඒක්ෂණ තැන්පතු | **25,369** | 25,369 |
| | **87,587** | 88,715 |

62 සිට 72 දක්වා පිටුවල අඩංගුවන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනු ලාභ උපයනු නොලබන ආයතනයක් වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකසා තිබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වූ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතු වේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්මක් ඇති ආයතනයක් ලෙස පැවතීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඇති හැකියාව කොමිසමේ සාමාජිකයින් විසින් තක්සේරුකර තිබේ. අවිනිශ්චිත අනාගතයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩවම සිදුකිරීම පිණිස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇතිබවට කොමිසමේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියළුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් ඇවරකිරීමේ හෝ අවසන්කිරීමේ අවශ්‍යතාවයක් ඇතිබව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම අඛණ්ඩවම යොදාගැනීම සිදු කරයි.

### 1.4 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මතය. යෝග්‍ය අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල දක්වා ඇත

### 1.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ හුවමාරු ගණුදෙනු වලදී ගණුදෙනුව සිදුවන අවස්ථාවේ දී පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

### 1.6 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

යෝග්‍ය පරිදි ශේෂ පත්‍ර දිනට පසු ප්‍රමාණාත්මක සිදුවීම්වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් සහ හෙළිදරව් කිරීම් අවශ්‍ය තන්හිදී සිදු කරනු ඇත.

### 1.7 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ සංගත වේ.

### 1.8 සංසන්දනාත්මක අගයන්

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත්වන ආකාරයෙන් වෙනස්කම්වලට යෝග්‍ය පරිදි ගැළපීම් සිදුකර තිබේ.

## 2 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 2.1 දේපළ පිරියත සහ උපකරණ

#### *2.1.1 හිමිකම් සහිත දේපළ, පිරියත සහ උපකරණ*

දේපළ, පිරියත සහ උපකරණ ඒවායෙහි අනෙකුත් ආනුශංගික වියදම් ද සමඟ පිරිවැයට සටහන් කර ඇති අතර, ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය සලකා බලා ක්ෂය කිරීම සිදුකරයි. ප්‍රදානයන් වශයෙන් ලද ස්ථාවර වත්කම් පිරිවැයට ගිණුම්ගත කර අදාළ ක්ෂය කිරීම් සංචිත ගිණුම්වලට අයකර ඇත. සෘජුරේඛීය පදනම මත ක්ෂය කිරීම් සිදුකර ඇත වත්කම් වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අනුපාතයන් අදාල කරගනිමින් මෝටර් රථ, (කල් බදු වාහන හැර) කාර්යාලීය උපකරණ, විද්‍යුත් දත්ත උපකරණ සහ පුහුණු උපකරණ ක්ෂය කරන ලදී.

| | |
|---|---|
| මෝටර් රථ | 10.00% |
| කල් බදු සඳහා ලබාදී ඇති මෝටර් රථ | 25.00% |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ අනුසීහුම් | 12.50% |
| කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත උපකරණ | 20.00% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% |

සියළුම මිලට ගත් වත්කම් භාවිතයට යොදාගන්නා දිනයේ සිට ක්ෂය කිරීම සිදුකෙරේ. අපහරණ වර්ෂයේදී අදාල වත්කම පොත්වලින් ඉවත්කරන දිනය දක්වා ක්ෂය කිරීම සිදුකෙරේ.

#### *2.1.2 මෝටර් වාහන කල්බදු*

සියළුම අවදානම් සහ ප්‍රතිලාභයන් හිමිකාරිත්වය සමග ආනුෂංගික වූ මූල්‍ය කල්බදු පදනම මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පවරන ලද වත්කම් ඒවායේ මුදල් පිරිවැයට ප්‍රාග්ධනගත කරනු ලැබේ. එසේ කල්බදු අයිතිය යටතේ වන වත්කම් තුළින් උද්ගතවන ක්ෂය සහ මූල්‍ය ගාස්තු ආදායම් වියදම් ප්‍රකාශයට හර වන අතර, කල්බදු කුළී ගෙවීම්, කල්බදු වගකීම් අඩුකිරීම සඳහා හඳුනාගෙන ඇත.

සභාය අධ්‍යක්ෂක මණ්ඩලය සහ ඊට ඉහළ කාර්ය මණ්ඩලය තම පාරිශ්‍රමිකයෙහි කොටසක් ලෙස කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය යටතේ වාහනයක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි. එහිදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කල්බදු වාරිකය ගෙවන අතර, අදාළ කාර්යමණ්ඩලය කල්බදු වාරිකයට දායකත්වය සැපයිය යුතුය. මෙයට අමතරව බලපත්‍ර ගාස්තු සහ වාහන නඩත්තුවට අදාලව සියළුම වියදම් කාර්යමණ්ඩලය විසින් දැරිය යුතුවේ. කල්බදු හිමිකමෙහි ප්‍රමාණයට වූ රක්ෂන පිරිවැය ද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෙවනු ඇත. වාහනයේ අයිතිය පැවරීම කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය සඳහා දායක වූ කාර්යමණ්ඩල සාමාජිකයා වෙත කල්බදු වාරික සියල්ල අවසන් වන මාස 48 ක කාලය අවසානයේදි හෝ සාමාජිකයා විසින් කල්බදු වගකීම් සම්පූර්ණ වශයෙන් ගෙවා නිම කිරීමෙන් පසු පමණක් සිදුකෙරේ. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ගනු ලැබූ තීරණයකට පසුව 2012 වසර තුලදී මෙම යෝජනා ක්‍රමය නව බැඳවා ගැනිම් වලට අදාල නොවේ.

### 2.2 ආයෝජන

ආයෝජන රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් වල සිදුකරන අතර පිරිවැය යටතේ දක්වනු ලැබේ

### 2.4 තොග

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකින් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම පෙර පිවිසුම් පෙර නිකුත් කිරීම් (FIFO) පදනම යටතේ සිදුකෙරේ.

